*2016 පෙබරවාරි මස 09 අඟහරුවාදා දින 2016*

*பெப்ரவரி மாதம் 09 ஆம் திகதி வியாழக்கிழமை Thursday 09 th February 2016*

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අමාත්‍යතුමන්ලා, නියෝජ්‍ය සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, සහ මන්ත්‍රීතුමියගෙන් අවසරයි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා න්‍යාය පත්‍රානුකූලව පළමුවෙන්ම තියෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් : නැත.**

**ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත.**

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

පාර්ලිමේන්තුවේ අදහස් විමසීම සඳහා ඉදිරිපත් කර ඇති සබරගමුව පළාත් සංචාරක අධිකාරිය ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ ලබාදිය යුතු කාල සීමාව දීර්ඝ කරන ලෙස ගරු කථානායකතුමාගේ නියෝගය පරිදි පාර්ලිමේන්තු මහ ලේකම් විසින් ඉල්ලා තිබෙනවා. 2016 ජනවාරි මස 19 වෙනි දින ගරු කථානායකතුමාගේ සභාපතීත්වයෙන් පැවති පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළුම පක්ෂවල නායකයින් සහභාගී වන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී උක්ත කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදුව තීරණය කරනු ලැබුවේ අදාළ ප්‍රඥප්ති කෙටුම්පත යොමු කළයුතු සංශෝධිත ආංශික අධීක්ෂක කාරක සභා ස්ථාපිත කරන තෙක් එම ප්‍රඥප්ති කෙටුම්පත සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබාදිය යුතු කාල සීමාව දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටින ලෙසයි. ඒ අනුව ඉහත ප්‍රඥප්ති කෙටුම්පත සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබාදිය යුතු කාල සීමාව 2016 ජනවාරි මස 29 දින සිට ආංශික අධීක්ෂක කාරක සභාව ස්ථාපිත කරන තෙක් තවදුරටත් දීර්ඝ කරදෙන මෙන් ගරු කථානායකතුමාගේ උපදෙස් පරිදි ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ආංශික අධීක්ෂක කාරක සභාව පත් කරනතුරු තවදුරටත් කාල සීමාව දික් කරලා දෙන්න කියලා තමයි ගරු කථානායකතුමා ඉල්ලීම කරලා තියෙන්නේ.

***ගරු සභානායක අශෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

---

එම දීර්ඝ කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ඒ අනුව සභාවේ අනුමැතිය ලැබුණ බව ගරු කථානායකතුමාට දන්වා යැවීමට කටයුතු කරනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල මැතිතුමා, ගරු මන්ත්‍රී ලක්ෂ්මන් කොඩිකාර මැතිතුමා, ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර මැතිතුමා, ගරු මන්ත්‍රී නිලන්ත ජයකොඩි මැතිතුමා, ගරු මන්ත්‍රී ඉඳුනිල් ශාන්ත ගුණසේන මැතිතුමා යන මන්ත්‍රීතුමන්ලා නිවාඩු ඉල්ලලා තිබෙනවා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*

-----------------------------------------

නිවාඩු ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

නිවාඩු ඉදිරිපත් කර ඇති සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීමට කටයුතු කරනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම.**

ගරු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා, ඒ වගේම ගරු මන්ත්‍රී ආරියවංශ බාලසූරිය මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපි සම්බන්ධයෙන් පිළිතුරු ලැබී තිබෙනවා. අපි ඒවා තමුන්නාන්සේලාට ලබාදීමට කටයුතු යොදනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම** : නැත

**පෙත්සම් ඉදිරිපත් කිරීම** :

*ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල*
*கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல*
*Hon.Member Ranjith Pollgampola*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, දැරණියගල, මාලිබඩ පදිංචි රුවන් ගුණසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-------------------------------------------

ගරු සභාපතිතුමනි, ඉඳුරාන, වහරක පදිංචි අසෝක විජේසුන්දර මහතා විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම සභාවට ඉදිරිපත් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

එම පෙත්සම්, මහජන පෙත්සම් කාරක සභාවට යොමු කරනවා. මින් ඉදිරියේ දී සභාවට ඉදිරිපත් කරන පෙත්සම් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා කලින් අප වෙත ඉදිරිපත් කරන මෙන් දැනුම් දෙනවා.

**ප්‍රශ්න :**

ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දේගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/15 දරණ ප්‍රශ්නය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් පිළිතුරු ඉල්ලා සිටිනවා. ගරු කෘෂිකර්ම ඇමතිතුමා විසින් පිළිතුරු ලබාදීමට කල් ඉල්ලලා තියනවා.

මීළඟට ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දේගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/20 දරණ ප්‍රශ්නයට ලිඛිත පිළිතුරු ලැබී තියනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පිළිතුරු එවලා තියනවා.

මීළඟට ගරු අජිත් කුමාර මැද්දේගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/22 දරණ ප්‍රශ්නය සඳහා ගරු පළාත් මාර්ග අමාත්‍යතුමාගෙන් ලිඛිත පිළිතුරු එවලා තියනවා.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :**

මේ යටතේ ගරු අතුල කුමාර රාහුබද්ධ අමාත්‍යතුමා.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම පළාත් සභාවේ පහුගිය දවසක අත්‍යාවශ්‍ය කාරණාවක් නිසා මම හිටියේ නෑ. එදින ප්‍රශ්නයක් යොමු කරලා තිබුණා, විශේෂයෙන් කුට්ටාපිටිය මාර්ගය සම්බන්ධව. ඒ විතරක් නෙමෙයි ඒක කරන්න බැරි නම් ඉල්ලා අස්වෙන්න කියලා වගේ චෝදනාවකුත් කරලා තිබුණා. මම ප්‍රථමයෙන්ම කියන්න ඕන මට මේක භාරදුන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, මේ අමාත්‍යාංශය, එවකට. ඉන් අනතුරුව තවමත් වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් ඒක අනුමත කරලා තියනවා. ඒ නිසා එහෙම ඉල්ලා අස්වෙන්න පුළුවන් කමක් නෑ, අයින් කලොත් ඇරෙන්න.

මොකද ඒ මන්ත්‍රීතුමා හරි එතුමාගේ පියා හරි දුන්නා නම් මට ඒක එහෙම භාරදෙන්න තිබුණා. ඉතින් කොහොම වුනත් මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව දිගින් දිගටම මේ සභාවේ අඩුම තරමේ කථා කරපු වාරවලට අම්බරුවෝ හිටියත් අම්බරුවන්ටත් තේරෙනවා, ඒ භාෂාව. මොකද අපි දන්න විදිහට තමයි අම්බරුවොත් දෙතුන් වතාවක් කිව්වොත් තේරුම් ගන්නවා. නමුත් මේ පිළිබඳව අපි කොච්චර කථා කළාද කියන එක පිළිබඳව මම කණගාටු වෙන්නේ නෑ. මොකද ගරු සභාපතිතුමනි, මේ කර්මාන්තය මම තමයි පැල්මඩුල්ල, කුට්ටාපිටිය මාර්ගය. දුර ප්‍රමාණය කිලෝ මීටර් 5.17 යි. ඇස්තමේන්තු මුදල තමයි 110,418,898.77 යි. වැඩ වියදම 89,785,849.46 යි. කර්මාන්තය පවතින තත්ත්වය තමයි ගරු සභාපතිතුමනි, කිලෝ මීටර් 2.2 ක් කාපට් කරලා තියනවා. ඒ වගේම කිලෝ මීටර් 3.0 ක් කාපට් කිරීමට තියනවා. ඒ වගේම කොන්ත්‍රාත් ආයතනය තමයි SEC රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව. ඒ වගේම අධීක්ෂණ කටයුතු තමයි මාර්ග සංවර්ධන අධිකාරිය. ප්‍රගතිය තමයි දැනට වැඩ නතර කරලා තියනවා. ඒ වගේම දැනට අපි අරගෙන තියන ක්‍රියා මාර්ගය තමයි MPR3/1/2013/09 අංක හා 2016.01.24 දින ලිපිය මඟින් සියළුම වැඩ අවසන් හා අවසන් නොවූ පළාත් මාර්ග ඉතිරි ප්‍රතිපාදන සමඟ කඩිනමින් ලබාදෙන ලෙස දිස්ත්‍රික් ලේකම් වෙත අපි ඉල්ලීමක් කරලා තියනවා. ගරු සභාපතිතුමනි, මේක තමයි ඇත්ත තත්ත්වය. මේක වසර 4 කට වැඩි කාලයක්. මේක මේ කාල සීමාව තුළ මම හිතන්නේ අපෙන් මේ ප්‍රශ්නය විමසනවාට වඩා එදා ඒ පැවතුන ආයතනයෙන් විමසුවා නම්, ඒ වගේම මේ කර්මාන්තය භාරව හිටපු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ බැසිල් රාජපක්ෂ මැතිතුමාගෙන් මේක විමසීමක් කළා නම් මීට වඩා කලින් මේ මාර්ග ඉවර කරගන්න තිබුණා. ඉතින් ඒ නිසා දැන් මේක කොහොම වුනත් අපි එදත් කිව්වා මේක අපට භාරගන්න විදිහක් නෑ. මොකද අපෙන් අරගෙන තියෙන්නේ මේක විධිමත්ව කාපට් කරලා, සුදු ඉරි ගහලා, උරහිස් දෙක හදලා, කාණු පද්ධතිය කොන්ක්‍රීට් නොකළත් කාණු පද්ධතියක් එක්ක තමයි අපට ලබාදෙන්න මේ වැඩ විෂයයේ තියෙන්නේ. ඒ නිසා මේ අතර මග දමා ගිය පාරක් අපෙන් පවරාගෙන ඒ වගේම වැඩ භාගෙට හදලා දාපු පාරක අපට පුළුවන් කමක් නෑ භාරගන්න ඇමතිවරයා විදිහට. මේ එල්ල කරන සියළු දේවල් අපි පළාත් සභාවක් විදිහට, පෞද්ගලිකව අතුල කුමාර රාහුබද්ධට ගැටළුවක් නෑ. හැබැයි සමස්ත පළාත් සභාවක් විදිහට සබරගමුව පළාත් සභාව විදිහට මේක අපි හැමෝටම ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා තමයි අපි අනන්ත වාර ගණනාවක් තිස්සේ මම හිතන්නේ ගරු ප්‍රධාන ඇමතිතුමාගේ ඉඳලා අපි එවකට හිටපු කණ්ඩායම මතක ඇති දිස්ත්‍රික් ලේකම්තුමා අවසාන 2014 අවුරුද්දේ මේ පිළිබඳව සාකච්ඡාවකට ආවාට බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට කිව්වා මම. කිව්වාම එතුමා කිව්වේ තමුන්නාන්සේලා කාණු දාගන්නවාද කියලා. මම කිව්වා පළාත් සභාව තියෙන්නේ කාණු දාන්න නෙමෙයි කියලා එදත් එතුමාට කිව්වා. අපෙන් ගත්තා නම් අපි කාණු දාන්න ඕන නෑ, අපට හදලා දෙන්න ඕන. ඉතින් ඒ නිසා අපි මේක තේරෙන භාෂාවෙන් කිව්වා. මේක මේ මටත් පෞද්ගලිකව මේ කාරණාවේ දී අපේ අජිත් මන්ත්‍රීතුමා, එතුමා පළාත් සභාවේ හිටියේ නෑ. එතුමා බොහොම සාධාරණව ප්‍රශ්නයක් මගෙන් ඇහුවා. මම ඒකට උත්තරය දුන්නා. එතුමා අකරැල්ල, උඩරංවල මාර්ගය පිළිබඳව එතුමා ඒ කරුණු සොයලා බලලා, මම හිතනවා තවත් අපැහැදිලි තැන් තියනවා නම් අපෙන් විමසුවා නම් අපට පුළුවන් ඒ කරුණු හොයලා බලලා තොරතුරු දෙන්න.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***

*Hon.Member Ajith Kumara*

----------------------------------------------------------

මම ඇහුවේ, අපට ඕනකම තිබ්බේ ඒ ආයතනය ගැන යම්කිසි දෙයක් පටන් ගන්න යොමු කරන්න.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***

***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***

*Hon. Minister Athula Kumara Rahubadda*

----------------------------------------------------------

මේ පාරත් එවැනිම පාරක්. නමුත් පටන් අරගෙන නෑ ගරු සභාපතිතුමනි. ඒ නිසා අපට පුළුවන්කම තියනවා. එතකොට අහලා තිබුණා අකරැල්ල පාර කරන්න පුළුවන් නම් ඇයි කුට්ටාපිටිය කරන්න බැරි කියලා. ඒක හදන්න බෑ, එහෙම පාරවල්. හදන්න පුළුවන් අපට අඩු තරමේ එකඟතාවයක් මත අපේ පළාත් සභාවට භාර දීලා තියනවා පාරවල් තුනක්. මම හිතන්නේ සම්බන්ධීකරණයේ දී පාරවල් 11 ක් භාරදුන්නා කියලා අපේ නිළධාරීන්ට. අපි භාර අරගෙන නෑ පාරවල් 11 ක්. පැහැදිලිව අපි කිව්වා, අපි 11 ක් භාරගත්තේ නෑ. අපේ ඇඟේමයි මේක ගහන්න හදන්නේ. ඒ නිසා මේක පෞද්ගලිකව චෝදනාවක් මට එල්ල කළාට ගැටළුවක් නෑ. අපි හදන්න පුළුවන් පාරවල් ටික හැදුවා. බැරි දේවල් අපි පැත්තක තියලා තියමු. ඔබතුමාගේ එක හදන්න පුළුවන්. ඒ පාරේ වැඩ කරලා නෑ. ඒ පාර පටන් අරගෙන නෑ. ඒ නිසා අපට පුළුවන්කමක් තියනවා මොනවා හරි විගණනයකට ගියොත් උත්තරයක් දෙන්න. එහෙම නැතුව අපේ නිළධාරීන් මේක භාගයක් කරලා භාර අරගෙන නැති පාරක අපට ප්‍රශ්නයක් තියනවා. ඉතින් කොහොම වුනත් අපි මේ ලිපිය අනුව ඉදිරි කටයුතුවල ඒ ප්‍රදේශයේ ජනතාවගේ මම හිතන්නේ මෙතන ඉන්න වැඩි හරියක් කුට්ටාපිටිය කිව්වාම දන්නවා ඒකේ තියන අමාරුව. ඒක අපි කවුරුවත් ඉල්ලලා දීපු දෙයක් නෙමෙයි. මම සංවිධායකවරයා කාලේ මේ පාරවල් ටික දැම්මේ. ඉතින් ඊට වැඩිය ප්‍රශ්න තියනවා මට. මට මළගෙදරක යන්න බෑ. මම යනකොට බෝඩ් ගහනවා, තිබ්ච්ච පාර දෙන්න කියලා. මම කරපු දෙයක් නෙමෙයි. මළගෙදර ගිහිල්ලා එන්න පුළුවන් කමක් නෑ. ලොරි 20 ක් ආපහු ඇරියා ගරු ඇමතිතුමනි. ඒ ගමේ පුංචි දරුවෙක් නැති වුනා ගරු ප්‍රධාන ඇමතිතුමනි, කාපට් කරන දවසේ. ඒ ප්‍රදේශයේම ජනතාවගේ ඉල්ලීම වුනේ මේ දරුවාගේ අවසන් කටයුතු කරන දවසේ හාමුදුරුවෝ ටික වඩිනවා. පාංශකූලය තියන නිසා මේක කරන්න එපා අද කියලා. ඒ නිසා ඒ වැඩේ සද්භාවයෙන් කළා. ඒ ගෙදර මිනිස්සුත් මට විරුද්ධව එල්ලනවා බෝඩ් එක දාලා. ඉතින් ඒ නිසා මේක තමයි ඇත්ත තත්ත්වය. මම ඒකයි කිව්වේ මේක මෙච්චර පැහැදිලි කරන්න ඕන නෑ, අම්බරුවන්ට වුනත් තේරෙනවා මේ කියලා දෙන භාෂාව. ඉතින් ඒ නිසා මේ පිළිබඳව මම සභාගත කරනවා මේකේ තොරතුරු ටික, අපි නැති වෙලාවක වුනත් අහපු ප්‍රශ්නයට උත්තරයක් විදිහට ගරු සභාපතිතුමනි. බොහොම ස්තූතියි !

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***

***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***

*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

සමාවෙන්න, අතුල කුමාර රාහුබද්ධ මැතිතුමාගේ කථාවේ දී මේ පාරවල් ගැන කියනකොට මම කියන්නේ. තමුන්නාන්සේට නඩත්තු ඒකකයක් තියනවාද කාපට් පාරවල් ? දැන් අපට මෙහෙමයි අර කෝටි ගාණක් වියදම් කරලා ගත්ත, පාර බදුවත්ත සිට හැරණියාවක දක්වා ගත්තාම. දැන් යන්නම බැරි තත්ත්වයට මිනිස්සු වැලි දාලා, ගල් දාලා, පස් දාලා, පෙළක් අය කොන්ක්‍රීට් දානවා. ඉතින් තමුන්නාන්සේ මේකෙත් ගිහිල්ලා බලන්න ඕන පොඩ්ඩක්.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

අපි පහුගිය දවස සම්බන්ධීකරණ රැස්වීමේ කිව්වා. ගරු ප්‍රධාන ඇමතිතුමාත් හිටියා සම සභාපතිවරයා හැටියට. අපි එදා ඉල්ලුවා අපේ රැඳවුම් ටික දෙන්න කියලා. මෙතුමා මේ ඉදිරිපත් කරන අඩු තරමේ මුළු පාර හදාගන්න බැරි වෙයි. හදපු ටික හරි නඩත්තුවක් කරන්න. රැඳවුම් මුදලත් ඒකේ තියාගෙන ඉන්නවා. එක පාරක් නෙමෙයි, ඒ පාරවල් සඳහා රැඳවුම් මුදලක් තියනවානේ. ඒ රැඳවුම් මුදල මිලියන 900 ක්. මේ මිලියන 900 අපට දෙන්න කිව්වා. එහෙම නැත්නම් අපි එදා අපේ නිළධාරීන් ගියා ඇස්තමේන්තු හදන්න. ගිහිල්ලා ඇස්තමේන්තු ටික හදලා දීලා දවස් දෙකයි, අපෙන් ආයි අයින් කළා.

මේක මේ දේශපාලනයේ තියන ගැටළුවක්.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

ගරු ඇමතිතුමා, දැන් ඔබතුමා පිළිතුරු දෙන්නේ සිරිපාල මන්ත්‍රීතුමා කියන්නේ බදුවත්ත, කුරුගම්මෝදර පාර. ඒක ඔය කියන ව්‍යාපෘතිය යටතේ කෙරිච්ච පාරක් නෙමෙයි. බොහොම කාලයකට ඉහතදී පළාත් සභාවෙන් කරපු පාරක්. පළාත් සභා පාරක්. ඒ පිළිබඳව තමයි මෙතුමා පැහැදිලි කරන්නේ.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

ඒ පාර සඳහා මේ වසර තුළදී අපි වෙන් කරලා අවශ්‍ය කටයුතු කරලා දෙන්නම්.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

තමුන්නාන්සේ මම කියනවාට ඒ පාරේ පොඩ්ඩක් ගිහිල්ලා බලන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

ස්තුතියි ! ගරු මන්ත්‍රීතුමනි.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මට මේ ලබාදීපු පිළිතුරු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහන්න තියනවා. අවස්ථාවක් දෙනවාද ඒ සම්බන්ධයෙන් ?

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ඔබතුමා න්‍යාය පත්‍රයේ ඒ අවස්ථාවේ දී ඕන අහන්න.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

මම දැන් දැක්කේ, ඒ ප්‍රශ්නවලට පිළිතුරු. කියවලා බලනකොට දැන් තමයි දැක්කේ. ගරු සභාපතිතුමනි, අපේ ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. දැන් අර පාර කැඩුන එකේ පාළම ගරු ඇමතිතුමනි, හදලා තියනවා. එතකොට වෛද්‍යවරයෙක් ටික කාලයකට යවන්න පුළුවන් වෙයි, බටදූරේ රෝහලට. ඊළඟට ඉල්ලීමක් කරන්න ඕන බටදූරේ රෝහලටත් කුඩා හෝ වාට්ටුවක් ලබාදෙන්න පුළුවන් නම් ඒක ලොකු පිනක් ඔබතුමාට. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*

-----------------------------------------------------------

අජිත් මන්ත්‍රීතුමනි, අපට ගැටළුව තියෙන්නේ වෛද්‍යවරුන්ගේ හිඟය. ඒක මේ සබරගමුව පළාතට පමණක් නෙමෙයි මුළු රටටම තියන ප්‍රශ්නයක්. ඒ නිසා නව වෛද්‍යවරු පත් කිරීමෙන් පස්සේ අපි බලාපොරොත්තු වෙනවා රෝහලක් බවට ඒක පත්කරලා කටයුතු කරන්න. සියල්ල සම්පූර්ණ වෙලා තියන නිසා. නමුත් වෛද්‍යවරු නැතිව රෝහලේ වැඩ ආරම්භ කරන්න අපට හැකියාවක් නෑ. දැනටත් අපට වෛද්‍යවරු 53 දෙනෙකුගේ විතර අඩුවකින් තමයි සබරගමුව පළාතේ රෝහල් දැනට කරගෙන යන්නේ. ඉතින් ඒක නිසා තවත් තැනකින් අපට ගෙනල්ලා දාන්නත් බෑ. ඒ තැන්වලත් ලොකු අඩුපාඩුවක් තියනවා. අපි මේක සෞඛ්‍ය අමාත්‍යතුමාට රේඛීය අමාත්‍යාංශයේ මේ පසුගිය සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ සමුළුවේ දී කරුණු ඉදිරිපත් කළා. එතුමා ඒක දැක්කා. එතුමා වැඩිපුර වෛද්‍යවරු පිරිසක් අපට ලබාදෙන්නට ගරු සභාපතිතුමනි, මෙවර පොරොන්දු වෙලා තියනවා. ඒ නිසා මේක විශේෂ කාරණාවක් හැටියට සළකලා අපි කටයුතු කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :** නැත.

**ශෝක ප්‍රකාශ යෝජනා :** නැත.

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා :** නැත.

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා :** නැත.

**පළාත් සභාවේ පොදු කටයුතු :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

සබරගමුව ප්‍රජා ගුවන් විදුලිය සහ රූපවාහිනි මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් ධවල පත්‍රිකාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ සහ අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි,

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
***Hon.Chief Minister Mahipala Herath***

---

ගරු සභාපතිතුමනි, මෙම අතුරු ව්‍යවස්ථා සියල්ලත්, ගුවන් විදුලි සහ රූපවාහිනී මධ්‍යස්ථානය, ඒ වගේම මෙම කොටසට ඇතුළත් වන පින්නවල ඉපැරණි තේමා ගම්මානය පිහිටුවීමේ ප්‍රඥප්තියත් සභාගත කරලා තියනවා. ඉදිරි කටයුතු සඳහා ඔබතුමන්ලා මේක අනුමත කරලා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. සබරගමුව ප්‍රජා ගුවන් විදුලිය සහ රූපවාහිනී මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් ධවල පත්‍රිකාව සම්බන්ධව එතුමා කලින් සභාගත කරලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා සභාවේ සාකච්ඡා කරනවානේ. ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

***ගරු මන්ත්‍රී සමිත ආටිගල***
***கௌரவ உறுப்பினர் சமித ஆடிகல***
*Hon.Member Samitha Atigala*

---

ගරු සභාපතිතුමනි, සබරගමුව පළාතේ ගුවන් විදුලි සහ රූපවාහිනී මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් ධවල පත්‍රිකාව ඉදිරිපත් කරලා තියනවා. මේක අපි විශ්වාස කරනවා සබරගමුව පළාතේ ක්‍රියාත්මක කරන සාමාන්‍ය ව්‍යාපෘතියක් හැටියට නෙමෙයි සුවිශේෂී ව්‍යාපෘතියක් හැටියට තමයි අපි මේක සළකන්නේ. මේ සඳහා

ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළත් අපි ඒ සම්බන්ධයෙන් යන ආදායම පිළිබඳව, වියදම පිළිබඳව අපට අවබෝධයක් නෑ. නමුත් අපි දන්නවා ගුවන් විදුලි නාලිකාවක්, ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකාවල් ආරම්භ කරනකොට මූලික ප්‍රාග්ධනයක් හැටියට විශාල මුදලක් වෙන් කරන්න සිද්ධ වෙනවා. ඒ වගේම විශාල මුදලක් මූලික ප්‍රාග්ධනයක් හැටියට වෙන් කරනවා වගේම ඒක පවත්වාගෙන යන්නත් විශාල මුදලක් මාස් පතා වෙන් කරන්න සිද්ධ වෙනවා. කැමරාවල් අපට මුලින්ම ගන්න පුළුවන්. විශාල මුදලක් ඒ සඳහා වියදම් වුනත් අපට ඒක හැමදාම ඒ විදිහටම පවතිනවා කියලා විශ්වාස කරන්න බෑ. නවීන තාක්ෂණික කැමරාවල්වල පුංචි හරි ප්‍රමාද දෝෂයක් සිද්ධ වුනොත් එහෙම ඒ කැමරාවල් නැවත වතාවක් පාවිච්චි කරන්න බැරි තත්ත්වයට පත් වෙනවා. ඒක සාමාන්‍ය දෙයක් මේ රූපවාහිනී නාලිකාවල් පවත්වාගෙන යනකොට. ඉතින් ඒ විදිහට ගත්තාම ඒ වගේ බාධාවල් පවා සිද්ධ වෙන්න පුළුවන්. ඒ විදිහට ගත්තාම මාස්පතා ඒ සම්බන්ධයෙන් පවා විශාල පිරිවැයක් දරන්න සිද්ධ වෙනවා. ඉතින් ඒ පිළිබඳව අපට හරි ඇස්තමේන්තුවක්, හරි අවබෝධයක් නෑ කියන එක සඳහන් කරන්න ඕන, ආදායම සහ වියදම පිළිබඳව. ඒ විදිහට ගත්තාම අපි සළකන්න ඕන සබරගමුව පළාත් සභාවේ කරන රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකාවක් සබරගමුවේ ජනතාව, සබරගමුවෙන් කරන නිසාම නරඹයි කියලා විශ්වාස කරන්න අපහසුයි. ඒ වැඩ සටහන්වල ගුණාත්මකභාවයක් තිබුනොත් තමයි නරඹන්නේ. එක නාලිකාවක්

විතරක් නෙමෙයි අද විශාල නාලිකාවන් ගණනාවක් තියනවා. ඉතින් ඒ විදිහට ගත්තාම අපේ වැඩ සටහන්වල ගුණාත්මකභාවයක් තිබුනොත් තමයි ජනතාව වුනත් මේ වැඩ සටහන් නරඹන්න පෙළඹෙන්නේ. එහෙම නොවුනොත් එහෙම අද කාලයේ තියන

නාලිකාවන් එක්ක ගත්තාම සබරගමුවේ වෙච්ච පළියටම මේ දේවල් සබරගමුවේ ජනතාව පාවිච්චි කරන්න පෙළඹෙයිද කියලා අපි කල්පනා කරලා බලන්න ඕන. ඒ විදිහට ගුණාත්මකභාවයෙන් යුක්ත වැඩ සටහන් නිෂ්පාදනය කරන්න ඒ සඳහා සුදුසුකම් තියන නිළධාරීන්ව සම්බන්ධ කරගන්න ඕන. ඒ විදිහට නිළධාරීන්ව, ඒ විදිහට සුදුසුකම් තියන ඉංජිනේරු මහත්වරු සහ නිෂ්පාදකවරු, කැමරා ශිල්පීන් වගේ උසස් හැකියාවන් තියන අය සම්බන්ධ කරගන්න කොටත් ඒ සඳහා කොපමණ පිරිවැයක් මාස් පතා දරන්න සිද්ධ වෙනවා ද කියන එක අපි කල්පනා කරලා බැලිය යුතුව තියනවා.

ඒ වගේම අපි සඳහන් කරන්න ඕන අපි මේ පළාත් සභාව ගත්තාම සම්පූර්ණයෙන්ම වගේ මධ්‍යම රජය මත යැපෙන පළාත් සභාවක් බවට පත්වෙලා තියනවා. ඉතින් එහෙම ගන්නකොට විශේෂයෙන්ම පිරිවැය පිළිබඳවත් අන්න එවන් වූ පළාත් සභාවක් හැටියට අපි කල්පනා කරලා බැලිය යුතුව තියනවා. ඒ වගේම අපි පිළිගත්ත කාරණාවක් තමයි රජයකට ව්‍යාපාර කරන්න බැහැ කියන එක. නමුත් රජය සම්බන්ධ වෙලා ව්‍යාපාර කරනවා. ඉතින් අපි දන්නවා ගමනා ගමනය ගත්තොත් එහෙම ජාතික අවශ්‍යතාවයක් ලෙස සළකලා රජය ප්‍රවාහන සේවාවන් කරනවා. නමුත් ඒ ප්‍රවාහන සේවාවන් වගේම විදුලිබලය ඒ වගේම මිහින් ලංකා වගේ සේවාවන් රජය කරගෙන යනවා, ජාතික අවශ්‍යතාවය සළකලා බලලා. නමුත් අපි දන්නවා

ප්‍රායෝගිකව, රජයට වාර්ෂිකව පාඩු ලබන ආයතන බවට ඒ ආයතන පත්වෙලා තියනවා. ඉතින් ඒ වගේම මේ ව්‍යාපෘතියෙත් සබරගමුව පළාත් සභාවක් හැටියට පාඩු ලබන ආයතන බවට මේවා පත්විය යුතු නෑ. කරගෙන යනවා නම් අඩුගානේ යැපෙන මට්ටමකටවත් තියෙන්න ඕන. ඉතින් ඒ සඳහා ආදායම්

උපදවන්න පුළුවන් හැකියාවක් තියෙන්න ඕන කියලා අපි විශ්වාස කරනවා. ඒ වගේම මේ පළාත් සභාවේ ගත්තත් මීට වඩා පල්ලෙහා මට්ටමේ ව්‍යාපෘති කරලා තියනවා. උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම ඇහැළියගොඩ මැතිවරණ කොට්ඨාශයේ බෝධිමළුවේ තියන ගිමන්හළ, අද ඒක ආරම්භ කරලා වහලා දාලා තියෙන්නේ. ඒ වගේම කොලොන්න මැතිවරණ කොට්ඨාශයේ දඩයම්කන්දේ හදපු කුරුඳුතෙල් නිස්සරණ මධ්‍යස්ථානය අද හදලා ඉවර වෙලා පුද්ගලික අංශයට බදු දෙන්න කටයුතු සොයා බලමින් පවතිනවා. ඉතින් අන්න ඒ විදිහට තමයි මේ සබරගමුව පළාත් සභාවේ කරලා තියන ව්‍යාපෘතිවලට අත්වෙලා තියන ඉරණම. ඉතින් අන්න ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කළයුතු බව සඳහන් කරමින්, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමනි. මීළඟට ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක් මැතිතුමා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*

---

ගරු සභාපතිතුමනි, සබරගමුව පළාත් ප්‍රජා ගුවන් විදුලි සහ රූපවාහිනී මධ්‍යස්ථානයක් පිහිටුවීම සම්බන්ධව ධවල පත්‍රිකාව සාකච්ඡාව සහ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් වන මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම අපේ සමිත ආටිගල මැතිතුමා ප්‍රකාශ කරපු විදිහටම අපි ඇත්තටම මෙවැනි ගුවන් විදුලියක් සහ රූපවාහිනී ආයතනයක් සබරගමුව පළාත තුළ පිහිටුවීම පිළිබඳව අපි සතුටු වෙනවා.

නමුත් ඒ පිහිටුවීම තුළින් අපට පළාත් සභාවට තවත් මේක බරක් වෙනවා නම් ඒ මම හිතන්නේ ආයතනය පිහටුවීමේ ප්‍රයෝජනයක් තියනවාද කියන එක පිළිබඳව නැවත වතාවක් සිතන්නට වෙනවා. ඒ වගේම මේ ආයතනය පිහිටුවනවා නම් ඇත්තටම වඩාත් ස්වාධීන ආයතනයක් හැටියට පවත්වාගෙන යාමත් ඉතාමත්ම වැදගත් කාරණාවක් වෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේක මම හිතන්නේ සිංහල මාධ්‍යයෙන් පමණක් නෙමෙයි දෙමළ මාධ්‍යයෙනුත් මේකේ වැඩ කටයුතු කිරීම වැදගත් වෙනවා. මොකද සබරගමුව පළාත ගත්තාම ද්‍රවිඩ, මුස්ලිම් ජනතාවත් විශාල වශයෙන් ජීවත් වෙන ප්‍රදේශයක් හැටියට ඒ ගැනත් අපගේ අවධානය විශේෂයෙන්ම මේ තුළින් අපි ලබාගත යුතු වෙනවා. ඒ වගේම මම හිතන්නේ අපි රටක් ගත්තාම අද ගුවන් විදුලි ආයතන, ඒ වගේම රූපවාහිනී ආයතන ගණනාවක්ම තිබෙනවා. ඉතින් මේකට අපි තරඟයක් දෙන්න පුළුවන් විදිහට අපට මේ ගුවන් විදුලි සහ රූපවාහිනී පවත්වාගෙන යන්න පුළුවන් වෙයිද කියන සැකය තමයි අපට තියෙන්නේ. නැත්නම් අපි විරුද්ධ වෙන්න කාරණාවක් නෙමෙයි. මේක කරනවා නම් හරියට, පිළිවෙලකට මේක ආයේ වහන්නේ නැති තත්ත්වයට පත් නොවී මේක පවත්වාගෙන යන විදිහට ක්‍රියාත්මක කලොත් තමයි මේකෙන් ජනතාවට ප්‍රයෝජනයක් වෙන්නේ. ඒ වගේම පළාත් සභාව හැටියටත් අපට මේකෙන් ලාභ ලබන

ආයතනයක් හැටියට පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා අපි දන්නවා දැන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ගත්තාමත් අද පාඩු ලබන ආයතනයක් හැටියට තමයි පවත්වාගෙන යන්නේ. ඉතින් ඒ වගේ මම හිතන්නේ ජාතික මට්ටමේ තියන ආයතනයක් මෙහෙම තත්ත්වය පත්වෙනවා නම් අපි පළාත් සභාවක් හැටියට මේ ගුවන් විදුලි සහ මේ රූපවාහිනී ආරම්භ කරලා අපට මධ්‍යම රජයෙන් ලැබෙන ඒ මුදල් ඒකෙන් පාඩුවක් ලැබෙන තත්ත්වයට පත් වෙනවා නම් මම හිතන්නේ මේකේ කිසිම ප්‍රයෝජනයක් වෙන්නේ නෑ. ඒ නිසා අපි මේ පිළිබඳව නැවතත් හිතලා බලලා තවත් මම හිතන්නේ ආදායමක් එන තත්ත්වයට මේකේ ප්‍රගතිය පිළිබඳව, මේ හැම දෙයක් පිළිබඳවම නැවත වතාවක් සාකච්ඡා කරලා ඉතාමත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ! ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමනි.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

------------------------------------------------------------

අපේ සමිත ගරු මන්ත්‍රීතුමාගේ ගිමන්හළ පිළිබඳව, ගරු සභාපතිතුමනි, මේ ගිමන්හළ කියන එක හදලා තියෙන්නේ දේශීය, විදේශීය සංචාරකයින්ගේ ගමන් පහසුව සඳහාත්, ඒ වගේම ඔවුන්ගේ විඩාව දුරුකර ගන්න, කෑම ගන්න පහසුව සඳහා. ඉතින් එක එක ව්‍යාපෘති මඟින් තමයි මේවා ඇවිල්ලා තියෙන්නේ. අපි හදපු ඒවත් නෙමෙයි. අපි හදපු ඒවා එකක් තියනවා බෙලිහුල්ඔය. තවම ඒක ටෙන්ඩර් එක දෙන්න විදිහක් නෑ. ගරු මන්ත්‍රීතුමනි, මේවා පළාත් සභාවට ආදායමක් බවට පරිවර්තනය කරගන්න බෑ. ඒ නිසා තමයි අපි භාරදුන්නේ ප්‍රාදේශීය සභාවට. ඒවායේ පොඩි පොඩි අඩුපාඩුකම් තියනවා. ඒ ඇරුනාම ඒක අසාර්ථක ව්‍යාපෘතියක් නෙමෙයි. පළාත් සභාවෙන් වෙච්ච නරකකුත් නෙමෙයි ඒක. ඉතින් එවැනි ව්‍යාපෘති තියනවා. එතන වෙලා තියන දේ තමයි පළාත් සභාවෙන් අපට මේක ආදායමක් කරගෙන, නඩත්තු කරගෙන යන්න බැරි ප්‍රශ්නයක් තියනවා. ඒ නිසා තමයි අපි ඔබතුමන්ලාට ඉදිරිපත් කරපු ප්‍රඥප්තිය දවසින් දවස පරක්කු වෙන එක අපිටත් ප්‍රශ්නයක්. ඉතින් කරන්න දෙයක් නෑ. එහෙන් දින ඉල්ලුවාම අපට දිනයට එකඟ වෙන්න වෙලා තියනවා. නැත්නම් මේ සම්බන්ධව සියළු කාරණාවලට මේවායේ අපට ඉඩකඩක් වෙන් කරගන්න තිබුණා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ! ගරු අමාත්‍යතුමනි.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

දිගින් දිගටම අදහස් දක්වපු නිසා මම මේ කථා කරන්නේ. සමාවෙන්න. ගිමන්හළ 39 ලක්ෂයක් වියදම් කරලා තමයි එදා හැදුවේ. එදා ඔබතුමාට මතක ඇති වොලිබෝල් ගහන ළමයි කණ්ඩායමකට සති දෙකෙන් ඒගොල්ලන්ට පිට්ටනියක් දෙන්නම් කියලා තමයි ඒක හැදුවේ. අද වෙනකලුත් ඒ පිට්ටනිය නෑ. ගරු සභාපතිතුමනි, මේක විශේෂයෙන්ම අපි කියන්නේ ගිමන්හළ අවන්හළක් කරලා ඒකෙන් ආදායමක් උපද්දවන ආකාරයට වැඩ කටයුතු රාශියක් කළා. ඒ කාලේ එක්කෙනෙක් මේක ගැන කථා කළා. අසූචි, මළ මූත්‍රා ගඳ එනවා කියලා කිව්වා. ඒ මනුස්සයත් මැරිලා ගියා. ඊට පස්සේ ගරු සභාපතිතුමනි, මේක ආදායම් මාර්ග ලබන තැනක් බවට තමයි පත් වුනේ. ඉතින් අපි ඒකට සම්පූර්ණයෙන් විරුද්ධයි. 39 ලක්ෂයක් වියදම් කලේ ගිමන්හළක්. දේශීය, විදේශීය සංචාරකයින්ට නවාතැන් පහසුකම් සළසන තැනක් විදිහට. ඉතින් අපි හැම වෙලාවේම යෝජනා කළානේ. ප්‍රාදේශීය සභාවට භාරදෙනවා නම් ප්‍රාදේශීය සභාවෙන් කම්කරුවෙක් දාලා මේක නඩත්තු කරන්න කෙනෙක් ඉන්න ඕන කියලා. දැන් අද ඒ ගොඩනැගිල්ල ඇත්තම කියනවා නම් ශත 5 කට වැඩක් නැති තත්ත්වයට පත්වෙලා තියනවා. කුලියට ගත්ත අය කඩලා බිදලා දාලා, විනාශ කරලා, එතන කෙනෙකුට නවතින්න බැරි තත්ත්වයක් කරලා. මම යෝජනාවක් ගේනවා ගරු සභාපතිතුමනි, ඒක ප්‍රතිසංස්කරණය කරලා නැවත අපි ඉල්ලීමක් කරනවා ගිමන්හළක් කරන්න කියලා.

*ගරු සභාපති කංචන ජයරත්න*
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ! ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි. මීළඟට යෙහියා එම් ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

----------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම සබරගමුව ප්‍රජා ගුවන් විදුලි හා රූපවාහිනී මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳව එක පැත්තකින් මෙම යෝජනාව ගෙන ඒම සහ සාකච්ඡා කිරීම වැදගත් අවස්ථාවක් කියලා අපි සළකනවා. මොකද අලුත් දෙයක්. ඒ වගේම මධ්‍යම ආණ්ඩුවට අයිති වුනත්, ඒ වගේම විෂයය පථයේ අපේ නැති වුනත් මෙවැනි දෙයක අදහසක් පහළවීම සහ ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කිරීමට පෙළඹවීම එක පැත්තකින් වැදගත් බව අපට වැටහෙනවා. නමුත් මේ මොනතරම් දේවල්, පෙළඹවීමක් සිදුකළත්, මොන තරම් දේවල් යහපත් විදිහට අපි කල්පනා කළත්, මොන තරම් දේවල් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී වැය බරක් වශයෙන් මෙය පළාත් සභාවට සිදුවේ නම් මේක කොච්චර හොඳ වුනත් අපට එක හෙළාම කියන්න වෙනවා මේක පළාත් සභාවට, අර කාලයක් මේ සබරගමුව පළාත් සභාව ආරම්භ කරනකොටත් පළාත් සභා ක්‍රමය ගේනකොට විරුද්ධ වුනා වගේ නෙමෙයි මේක. ඊට වඩා හාත්පසින්ම වෙනස්. මෙවැනි දෙයක් ක්‍රියාත්මක කරනකොට පාඩු ලබන ආයතනයක් බවට පරිවර්තනය

වුනොත්, එහෙමත් නැත්නම් පළාත් සභාවට වැය බරක් බවට පරිවර්තනය වුනොත් මේ තුළින් පළාත් සභාවේ අනාගතයට සහ යම් යම් කාර්යයන්වලට විශාල ලෙස බලපෑමක් ඇති කරන්න පුළුවන් කියලා අපි හිතනවා. අනෙක් පැත්තෙන් ගත්තාම මට ඉස්සෙල්ලා කථා කරපු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා කිව්ව විදිහටම සබරගමුව පළාත් සභාව ගත්තාම 25% කට ආසන්න ජනතාවක් ජීවත් වෙන්නේ සුළුතර ජනතාවක් සුළු ජාතීන්. සුළු ජාතීන් ජීවත් වෙන ප්‍රදේශය තුළ කොතනකවත් සඳහන් වෙන්නේ නෑ මොන මාධ්‍යයෙන්ද මේක යන්නේ කියන එක පිළිබඳව. අපි කල්පනා කරනවා ආයතනයක් ආරම්භ කරනකොට රටේ සමගිය පිළිබඳවත්, ජාතීන්ගේ එකමුතුකම පිළිබඳවත්, ඒ වගේම අන් ජාතීන්ට අවහිරයක් නොවෙන විදිහට කටයුතු කිරීමත් වැදගත් වෙනවා. අපි එහෙම කියන්න හේතුව තියෙන්නේ වෙන එකක් නෙමෙයි මේ මාධ්‍යය සමහරවිට සිංහල මාධ්‍යයෙන් විතරක් පටන් අරගෙන ගියොත් සමහර අවස්ථාවල අපි දන්නවා අධ්‍යාපනය සම්බන්ධයෙන් මේ මාධ්‍යය යනකොට ද්‍රවිඩ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන දරුවනුත් බලාගෙන ඉන්න පුළුවන් රූපවාහිනිය. නමුත් තේරෙන්නේ නෑ. අවංකවම ගත්තොත් මේ වැඩ සටහන් පටන් ගත්තාම රූපවාහිනී මාධ්‍යයෙන් මම දන්නවා අද ඉගැන්වීමේ කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් උදාවෙලා තියනවා අද, සමහර අයට උගන්වන්න බැරි දේවල් රූපවාහිනී මාධ්‍යය හරහා කරන්න පුළුවන්. එහෙම වුනොත් එතකොට සිංහල මාධ්‍යයෙන් ගියොත් අර අහිංසක දෙමළ මාධ්‍යයේ ඉන්න දරුවාට, ඒ පාසල් ගිය දරුවාට අසාධාරණයක් වෙන්න බෑ කියන එක තමයි මගේ හැඟීම. ඊළඟට අනෙක් පැත්තෙන් ගත්තාම අපි හුඟාක් දේවල් දකිනවා සබරගමුව පළාත් සභාවේ ගත්තාම මේක යනවා හුඟාක් අවස්ථාවල දී හොඳ විවාද. ඒ වගේම දෛනිකව වැඩ සටහන් අපට, අද රූපවාහිනිය සම්පූර්ණයෙන් අද පෙන්වනවා පාර්ලිමේන්තුව. අද පාර්ලිමේන්තුව බලන අය හුඟාක් අය ඉන්නවා. වෙනමම නාලිකාවක් යටතේ මේක කරගෙන යනවා. ඒක අපි අගය කරනවා බහුතරයක්, මොකද අපි යවපු මහජන නියෝජිතයෝ අපි වෙනුවෙන් පෙනී සිටිනවාද ? අපි වෙනුවෙන් කථා කරනවාද ? අපේ හඬක් ගෙනියනවාද කියන එක පිළිබඳව අද ජනතාව බුද්ධිමත් එදාට වඩා. අද ඒ බුද්ධිමත් කොටස අද මේ දිහා බලලා තමයි අනාගතය ගැන, වැඩ සටහන ගැන ක්‍රියාත්මක වීම ගැන කථා කරන්නේ. නමුත් අද මේක දිහා බැලුවාම මේක එක පැත්තකින් ස්වාධීනයි කියලා කිව්වාට ප්‍රායෝගිකව මේක ස්වාධීන වෙයිද ? මොකද අපි දැකපු හැම ආයතනයක්ම මේ වෙනකොට පාඩු ලබනවා. රූපවාහිනී සංස්ථාවල් ගත්තත් පාඩු ලබනවා.

පුළුවන්. සමහරවිට මේක අපේ ප්‍රධාන ඇමතිතුමා මේක කල්පනා කරලා පියෝ ටී.වී. වගේ තත්ත්වයකට ගෙනාවොත් ඒකේ නාලිකාවක් යටතේ රූපවාහිනී වැඩ සටහනක් ගෙනාවොත් දවස් දෙකකට ඉස්සෙල්ලා ඒවා බලාගන්න පුළුවන් තත්ත්වයක් තියනවා. දරුවෙකුට පාසල් අධ්‍යාපනයට ගිහිල්ලා ඇවිල්ලා ගෙදර ඉඳලා මේක බලාගෙන තමන්ට යම් වැඩ සටහනක් නරඹලා අධ්‍යාපනය ලබන්න ඒ එක්කම ගුවන් විදුලි සංස්ථාව ගත්තත් පාඩු ලබනවා. මේ වැය බර සබරගමුව පළාත් සභාව වැනි ආයතනයකට දරන්න පුළුවන්ද ? මෙන්න මේකයි අපි අහන්නේ. මොකද අපි මේක බැලුවාම අපට කොතනකවත් තවම අපට හමුවුනේ නෑ, ධවල පත්‍රිකාව ලැබුනාට, මේකට කොපමණ වියදමක් දරනවාද ? කොපමණ කාර්යය මණ්ඩලයක් ඉන්නවාද ? කොයි වගේ ආකාරයෙන් ද මේක ආරම්භ කරන්නේ ? මේක කොයි

විදිහට ද සාර්ථක කරන්නේ ? වැඩ සටහන් කොහොමද ? ආදායම් වියදම් සම්බන්ධයෙන්, ඒ වගේම මේ ආයතනය කොයි ආකාරයෙන් නිර්මාණය වෙනවාද ? වාර්ෂික ඇස්තමේන්තුවක් මේ තුළ අපට දකින්න නැති නිසා එක පාරට කියන්න බෑ. ඒකයි මම කියන්නේ ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමතිතුමා මේ සම්බන්ධයෙන් අපිව දැනුවත් කරනවා නම්, මෙවැනි ආයතන ආරම්භ කිරීම තුළ මේකේ ආදායම් මාර්ග අපි මෙච්චර හොයන්න, උපයන්න උත්සාහ කරනවා. මෙච්චර අපි මාසිකව වියදමක් දරන්න බලාපොරොත්තු වෙනවා. වාර්ෂික වියදම මෙතරම් ප්‍රමාණයක් වියදම් වෙනවා. එහෙම නැත්නම් ලාභය හෝ අලාභය, ඒ අලාභය කොයි තරම් ප්‍රමාණයක් සබරගමුව පළාත් සභාවට වැය බරක් වෙයිද ? මොකද මේකේ පැහැදිලිව ප්‍රධාන ඇමතිතුමා, ධවල පත්‍රිකාව ඉදිරිපත් කරන ගමන් කියනවා වාර්ෂිකව මුදල් ප්‍රකාශයෙන් වෙන් වෙලා මේකට මුදල් දෙන්න ඕන කියලා. ඇත්ත. නැත්නම් මේක නඩත්තු කරන්න බෑ. යම්කිසි මුදලක් තක්සේරුවක් හරි තියෙන්න ඕන, මේකට යන මුදල සම්බන්ධයෙන්. එහෙම නැති වුනොත් මෙවැනි ආයතන පටන් අරගෙන අවසානයේ කවදා හරි දවසක මේක වැසී යන තත්ත්වයට පත් වුනොත් මේකේ අගෞරවය එන්නේ සබරගමුව පළාත් සභාවේ අපට. මේකේ අගෞරවයක් නොවෙන විදිහට, ගෞරවාන්විත විදිහට මේ

කටයුත්ත සිදු කිරීම අපි සියළුදෙනාගේම යුතුකම, වගකීම වෙනවා. මම ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේක අපේ ප්‍රධාන ඇමතිතුමා මීට වඩා පොඩ්ඩක් කල්පනාවෙන් කල්පනා කරලා මෙවැනි හොඳ දේවල්, ප්‍රායෝගික දේවල්, අවශ්‍ය දේවල් ක්‍රියාත්මක කරන ගමන් මේක දීර්ඝ කාලයක් පවත්වාගෙන මේ සභාව අපිව දැනුවත් කලොත් මේ සම්බන්ධයෙන් අපේ තියන සහයෝගය අපට දෙන්න පුළුවන්. එහෙම නැති වුනොත් මේ සම්බන්ධයෙන් දැනට අපි දකින්නේ මාධ්‍යය තුළින් අපි දකින මේ වෙනකොට ක්‍රියාත්මක වෙන රජයේ මාධ්‍යය පිළිබඳව තිබෙන ගැටළුව නිසා අපි මේ ප්‍රකාශය කරන්නේ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා අපිව නිවැරදි මාර්ගයට යොමු කරන්න, නිවැරදි අවබෝධය ලබාගන්න, නිවැරදි දේ අපි මේ සභාව දැනුවත් කරන්න කියලා අපි කාරුණිකව ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. මීළඟට විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ගුවන් විදුලිය ගැන අපට ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා මතක් කරපු ආකාරය ගැන තමයි මටත් කියන්න තියෙන්නේ ගරු සභාපතිතුමනි.

මේ නඩත්තුවට යන මුදල, කොපමණ මුදලක් මේකෙන් ලාභ ලබනවාද ? එහෙමත් නැත්නම් මේකෙන් අපට වෙන සේවය, එහෙමත් නැත්නම් නැතිවුනොත් එහෙම අපට වෙන අපකීර්තිය සම්බන්ධයෙන්. ඉතින් මම වැඩිදුර කථා කරන්න අවශ්‍ය නෑ. එතුමාගේ කථාව මම අනුමත කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ! ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමනි. මීළඟට සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*

---------------------------------------------------

ගරු සභාපතිතුමනි, සබරගමුව ගුවන් විදුලි සහ රූපවාහිනී මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් ධවල පත්‍රිකාව මේ සභාවට ඉදිරිපත් කිරීම මම හිතන්නේ ඓතිහාසික කාරණාවක්. අපේ ගරු මිත්‍ර මන්ත්‍රීවරුන් පෙන්වා දුන්න පරිදි මේක බැලූ බැල්මට සල්ලි දිහා බැලුවොත් නම් මේක ලාභදායී ව්‍යාපෘතියක් වෙන එකක් නෑ. යම් මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරන්න සිද්ධ වෙයි. ඒ ආයෝජනය කරන ප්‍රමාණයට ලාභ නොලැබෙයි. හැබැයි අර රජරටින් ගුණදාස කපුගේ බිහිවුනා වගේ සබරගමුවෙන් මහා කලාකරුවෙක් බිහිවෙච්ච දවසට අපේ සබරගමුව අධ්‍යාපනය මේ නංවලා තියන පිම්ම දෙගුණ තෙගුණ වෙලා ඉස්සරහට ගිය දවසට ලෝකයේ සළකුණු තියන්න පුළුවන් මහා බුද්ධිමතුන්, ප්‍රාඥයින්, උගතුන්, කලාකරුවන් සබරගමුවෙන් බිහිවෙච්ච දවසට මම හිතන්නේ සබරගමුව ගුවන් විදුලිය සහ රූපවාහිනිය පිහිටුවීමේ ඓතිහාසික තීන්දුව අපි ගත්තාය කියන හැඟීම අපට ලැබේවි. නමුත් ගරු සභාපතිතුමනි, එහෙම කියලා ඉවර වෙලා මුදල් ගණුදෙණු සම්බන්ධයෙන් අපට මේ වචනවලින් හරි අනාගත බලාපොරොත්තුවලින් හරි ලඝු කරන්න බෑ. මේකට දළ වශයෙන් මිලියන 25 ක් විතර ආයෝජනය කරන්න සිද්ධ වෙයි, මුල් අදියරේ දී. මාසිකව ලක්ෂ 8 ක් විතර තමයි ගණන් බලලා තියෙන්නේ. හැබැයි මම මේ කියන්නේ අපේ ගරු මන්ත්‍රීවරුන් හොඳට දන්නවා රත්නපුරේ ඉන්න විදිහට එක රාත්‍රියකට සංගීත සංදර්ශණයකට ලක්ෂ 10, 15 වියදම් කරන රත්නපුරේ මාසයකට ලක්ෂ 8 ක් මේ ගුවන් විදුලියට, රූපවාහිනියට හොයා ගන්නවා කියන එක මහා කජු කන වැඩක් වගේ. ඒ තරමට සල්ලි මේ සමාජයේ සංසරණය වෙනවා ව්‍යාපාරික ප්‍රජාව තුළින්. ඊටත් වඩා ගරු සභාපතිතුමනි, අර ගරු මන්ත්‍රීවරුන් කිව්වා වගේ මේ එකින් එක ආදායම්, වියදම් සහ කරුණු කාරණා මේ ධවල පත්‍රිකාවේ නෑ. ධවල පත්‍රිකාව කියලා කියන්නේ සරල කෙටි සටහනක් විතරයි. හැබැයි ඊට අදාළ වෙන ලේඛණ සමූහයක් තියනවා. ඕන නම් ගරු සභාපතිතුමනි, මේ සමස්ත ලේඛණ ටික මේ ගරු සභාවේ සභාගත කරන්න අපි සූදානම් වෙනවා. ගරු සභාපතිතුමනි, මේ ධවල පත්‍රිකාව සම්මත කරලා අපි මේ වැඩේට කර ගැහුවොත්, මේකට අපට උපදෙස් සපයන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ ජන මාධ්‍ය මණ්ඩපයේ ආචාර්යය ප්‍රදීප් වීරසිංහ මැතිතුමා. එතුමා බොහොම පැහැදිලිව කියලා තියනවා පළාත් සභාවක් විදිහට මේ තීන්දුව ගන්නවා නම් අපට විදේශ ආධාර ලබාදෙන්න ලැස්තියි කියලා. ඒ

නිසා ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවේ තියෙන්නේ ගරු ප්‍රධාන ඇමතිතුමා, ප්‍රවෘත්ති ඇමතිවරයා විදිහට ඓතිහාසික සළකුණක් තියන්න සබරගමුව ගුවන් විදුලි සහ රූපවාහිනී සංස්ථාව පිහිටුවීමේ ධවල පත්‍රිකාව ඉදිරිපත් කරලා තියනවා. මේක සභා සම්මත කළොත් මේක ක්‍රියාවට නංවන්න අපට පුළුවන්. අර තමුන්නාන්සේලා කියනවා වගේ මේක පුද්ගලයෙකුගේ ප්‍රතිරූපය නංවන්න, දේශපාලනයට කඩේ යන්න නම් අපිත් මේවාට නෑ. හැබැයි දැඩි විශ්වාසයක් තියනවා මේකේ බොහොම පැහැදිලිව කියලා තියනවා කළමනාකරණ මණ්ඩලය ස්වාධීනව කටයුතු කරන විදිහට තමයි මේ ධවල පත්‍රිකාව තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලා සිටින්නේ සබරගමුවට ඓතිහාසික සළකුණක් තියන්න පුළුවන්, සබරගමුවේ අධ්‍යාපනය, සාමාජීය, සංස්කෘතික වශයෙන් මහා පිම්මකට, මහා නැම්මකට අත තියන්න පුළුවන් සිද්ධියක් තමයි මේ සබරගමුව ගුවන් විදුලි සහ රූපවාහිනිය. ඒ සඳහා පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව සබරගමුවේ මහජන නියෝජිතයෝ වෙච්ච අපේ වගකීමක් විදිහට මේ සඳහා අනුමැතිය දෙන්න කියන කාරණාව කියමින්, හැමදෙනාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු සලිත කරුණාරත්න මැතිතුමනි. මීළඟට ගරු විපක්ෂනායකතුමා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සබරගමුව ප්‍රජා ගුවන් විදුලිය සහ රූපවාහිනි මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ධවල පත්‍රිකාව ගැන සාකච්ඡා කිරීම සඳහා ඔබතුමා අවස්ථාවක් ලබාදීම ගැන මගේ සතුට ප්‍රකාශ කරනවා. ඒ එක්කම මේ සබරගමුව ප්‍රජා ගුවන් විදුලි සහ රූපවාහිනි මධ්‍යස්ථානය ආරම්භ කරනකොට මෙහි වැඩ කටයුතු ආරම්භ කරන ආකාරයට මුදල් ආයෝජනය කරන්නේ කොපමණ මුදලක් ද කියන එක අපට පැහැදිලි අවබෝධයක් නැති බව ඔබතුමාට සඳහන් කරන්න ඕන. ඒ එක්කම මේ ආයතනය නඩත්තු කරන්න, විශේෂයෙන්ම මෙම මධ්‍යස්ථානයේ පරිහරණය සඳහා සබරගමුව පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලැබූ සියළුම මුදල් කියන එක මේකේ සඳහන් කරලා තියනවා. මේ ගැන අපට බියක් ඇති වෙනවා. මේ ගුවන් විදුලිය, රූපවාහිනිය නඩත්තු කරගෙන යනකොට කොපමණ මුදලක් වැය වේවිද ? වර්ෂයෙන් වර්ෂයට මුදල් වෙන් කරනකොට විශේෂයෙන්ම සබරගමුව පළාත් සභාව ගත්තාම අපට පළාත තුළින් මෙය නඩත්තු කරන්න, ආදායම් ලබාගන්න පුළුවන්කමක් නෑ කියන විශ්වාසයයි අපට තිබෙන්නේ. ඒ නිසා අපට භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් පවා මේකට වෙන් වෙයි කියන සැකය අපට තියනවා. ඉතින් ඒ නිසා අපට මේකට එකඟ වීමට නොහැකි බව ප්‍රකාශ කරන්න ඕන.

ඒ වගේම මාධ්‍යය ගැන කථා කරනකොට සමහර අවස්ථාවන්වල දී මේක ස්වාධීන මාධ්‍යයක් වෙයිද කියන

සැකයත් අපට තියනවා. අද සබරගමුවේ මාධ්‍යය ගැන කථා කළත් අපට දකින්න නෑ ස්වාධීන තත්ත්වයක්. මේකේ විපක්ෂයට කොතනකවත් ඉඩක් නෑ. ඒ නිසා අද වර්තමානය ගැන කථා කරනකොට මේ වගේ ගුවන් විදුලියක්, රූපවාහිනී ආයතනයක් ගොඩනගලා ඒකෙදිත් ඒ වගේ ස්වාධීන නොවුනොත් විශාල අසාධාරණයක් ජනතාවට සිදුවෙනවා. ඒ එක්කම මේ යෝජනාව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට ඇත්ත වශයෙන්ම ගුවන් විදුලියකින්, රූපවාහිනියකින් අපේ පළාත තුළින් එතුමා කියපු ආකාරයට කලාකාරයෙක්, දරුවන්ගේ අධ්‍යාපනය මේ හැම දෙයක්ම දියුණු කරන එක ගැන අපේ බලාපොරොත්තුවක් තියනවා, වෙයි කියලා. නමුත් අපට පැහැදිලි අවබෝධයක් අවශ්‍යතාවය තියනවා මේක නඩත්තු කරගෙන යන්න පුළුවන් මුදලක් පාඩු නොලබා ආයතනයක් හැටියට ගෙනියන්න පුළුවන් කමක් අපට ලැබෙයිද කියලා. ඒක නිසා මේ අවස්ථාවේ අපි තීන්දු කරනවා අපි වැළකී සිටින්න, අපේ මතය.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු විපක්ෂනායකතුමනි. මීළඟට ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
***Hon.Chief Minister Mahipala Herath***

---

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ප්‍රජා ගුවන් විදුලි සහ රූපවාහිනි මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් අපේ ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කිහිපවිටක්ම කිව්වා සභාව මීට වඩා දැනුවත් කරන්න කියලා. ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමන්ලාගේ වැඩමුළුවේ දී පළමුවෙන්ම මේ සම්බන්ධයෙන් ප්‍රදීප් වීරසිංහ මැතිතුමා ඇවිල්ලා මේ කාරණාව දැනුවත් කළා. දෙවෙනි අවස්ථාව අපි පරකඩුවේ දි අපි කැඳවලා තිබුණා. ඒකට ආවෙත් මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනයි. ඊයේ පෙරෙයිදා ගිණුම් කාරක සභාවෙන් කරන ලද ඉල්ලීමක් අනුව සහකාර විගණකාධිපතිතුමාගේ ගරු සභාපතිතුමනි, දේශණ මාලාවක් තිබ්බා. ගිණුම් කාරක සභාවේ සාමාජික මහත්වරුවත් නැති එක ගැන එතුමා කණගාටුව ප්‍රකාශ කළා. මේ සම්බන්ධයෙන් අපි පැහැදිලි ආකාරයට මේ කරුණු මේක අපට වඩා මේ විෂයය සම්බන්ධ විශ්ව විද්‍යාලයක මහාචාර්යයවරයෙක් තමයි මේ කාරණාවට අපි යොදාගෙන තියෙන්නේ. ඒ වගේම ගුවන් විදුලි සංස්ථාවේ, රූපවාහිනී ආයතනවල ඉංජිනේරුවරු සහ තාක්ෂණ නිළධාරීන් පැමිණිලා මේවා විස්තර කරන්න අපි අවස්ථාව සළසලා දුන්නා. ගරු සභාපතිතුමනි, මේ කාරණාවේ දී අපි අර ඉපදුනේ නැති දරුවන්ට උප්පැන්න දෙනවා වගේ වැඩ අපට කරන්න බෑ. හැබැයි අපට

ප්‍රතිපත්තිමය වශයෙන් මේ යන ගමනේ පළාතට ඇති වටිනාකම පැහැදිලි කරන්න පුළුවන්. අපේ ඒ සඳහා විශේෂයෙන්ම මේ වගකීම තමන් ස්වෙච්ඡාවෙන් භාරගත්ත අපේ සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාත් මගේ අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් ලෙස එතුමා මේ කාරණාවට බොහොම අනුගත වෙලා ඉන්නවා. ඒ නිසායි මම එතුමාට අවස්ථාව දුන්නේ පැහැදිලි කරන්න වඩාත්. මේ කාරණාව ගරු සභාපතිතුමනි, අපි අද ඊයේ ආරම්භ කරපු වැඩ සටහනක් නෙමෙයි.

මේක මේ ගරු සභාවම බොහොම කැමැත්තෙන් අනුමත කරපු යෝජනාවක්. ඒක නිසා මේ කාරණාවේ දි අපි තමුන්නාන්සේලාගේ ගරු සභාව කරන ලද අනුමත කරන ලද යෝජනාව ක්‍රියාත්මක කරන්න කටයුතු නොකළා නම් තමයි අපේ වැරැද්ද තියෙන්නේ. අපි ඒ කාර්යය තමුන්නාන්සේලාට ඉදිරිපත් කරලා තියනවා. මේක අධ්‍යයනය කරන්න. මේක හරියට තමුන්නාන්සේලා මේ කරුණු පැහැදිලි කරන අවස්ථාවල මන්ත්‍රීතුමන්ලා ඉල්ලනවා අපෙන් අපට ඕනෑ සම්මන්ත්‍රණ සාකච්ඡාවක් කියලා. ගරු සභාපතිතුමනි, කියන්න කණගාටුයි තමුන්නාන්සේලාම දන්නවා කීයෙන් කීදෙනාද කොච්චර මුදල් ප්‍රමාණයක් අපි වියදම් කරනවාද ? අපි අතින් වෙන අතපසුතාවයන් තුළ මේ සභාවේ ක්‍රියාකාරීත්වය නවත්වන්න කටයුතු කරනවා නම් මම හිතන්නේ නෑ ඒක හොඳ වැදගත් කාර්යයක් කියලා. ඒ නිසා අපි බොහොම දුර දිග හිතලා මේ කටයුතු කරනකොට අපි මේ කාරණාවේ දී සුභවාදි පැත්ත අපි වඩාත් සොයා බැලිය යුතුයි. අසුභවාදී විදිහට අපට හිතන්න පුළුවන් ඕන දෙයක්, දේශපාලනික වශයෙන්. නමුත් සුභවාදී විදිහට අපි ජනතා නියෝජිතයෝ ලෙස හිතනවා නම් මේක තමුන්නාන්සේලාගේ පාලන කාලයේ වුනත් අවශ්‍ය දෙයක්. මේ කාරණාව වැදගත් යෝජනාවක් හැටියටයි මෙ පළාතේ 21 ලක්ෂයක් වූ ජනතාවගේ

කළහැකි ව්‍යාපෘතීන් ගැන අපි කල්පනා කරලා,මේ තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන ලද කාලාන්තරයක් තිස්සේ එන මේ වැදගත් යෝජනාව ගරු සභාව අනුමත කරලා දෙන්න කියලා මම ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. දැන් අපි උදාහරණයක් විදිහට ගත්තොත් ගරු සභාපතිතුමනි, ප්‍රවාහන අධිකාරිය. ප්‍රවාහන අධිකාරියට මම ප්‍රවාහන ඇමතිවරයා හැටියට වැඩ භාරගන්න අවස්ථාවේ ප්‍රවාහන අධිකාරියේ ස්ථිර තැන්පතු කෝටි ගණන් දාන්න පුළුවන් විදිහට අපි ව්‍යාපෘතියක් අලුතින් සකස් කරලා ගරු සභාපතිතුමනි, ඒක අද ලාභ ලබන ආයතනයක් බවට අද පත් කරලා තියනවා. අපට මේවා ඕන විදිහකට හිතන්න පුළුවන්. හැබැයි ක්‍රියාකාරීත්වය ගැන අපි හරියට හදවතට එකඟව අපි කථා කරන්න ඕන. ඉතින් ඒක නිසා මම ඉතාමත්ම ඕනෑ කමින් ඉල්ලනවා මේ ගරු සභාව අපට මේ ඊළඟ අවුරුද්දේ වැඩ කටයුතු සම්බන්ධයෙන් අපි දෙගොල්ලම එකතු වෙලා ඒකමතිකව මේ සභාවේ ඉදිරි වර්ෂයේ වැඩ කටයුතු අනුමත කරපු නිසා, ඒ නිසා කරුණාකරලා මේක අපට තර්ක ඉදිරිපත් කරන්න පුළුවන් අවස්ථාවන් අපි ඔබතුමන්ලාට නිසි පරිදි අවස්ථානුකූලව දීලා තියනවා. ඒක නිසා මෙවැනි කරුණු දිගින් දිගටම අනවශ්‍ය විදිහට කල් දාන්නේ නැතුව මේ අපේ ඇවිල්ලා තියනවා ගරු සභාපතිතුමනි, මේ අතුරු ව්‍යවස්ථා. මේවා මේ පළාත් පාලන

අවශ්‍යතාවයක් පිරිමහන්න, මධ්‍යස්ථානයක් හැටියට පරකඩුව කියන තැන අපි ඒ ස්ථානය තෝරාගෙන ගරු සභාපතිතුමනි, මේක ඉතාමත්ම හොඳින් අධ්‍යයනය කරලා, විශේෂයෙන්ම මේ ගරු සභාවේ විශේෂිත මන්ත්‍රී කණ්ඩායම් මේක හොඳට අවබෝධ කරගෙන ඉන්නේ. ඉතින් ඒ නිසා මෙහි තමුන්නාන්සේලා අසුභවාදී විදිහට හිතන එක වෙනුවට සුභවාදීව හිතලා ඒ තුළින් ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික තත්ත්වය නඟාසිටුවීම සඳහා ඒ තුළින් ක්‍රියාත්මක

ආයතනවලට අවශ්‍ය දේවල්. මේවා නැතුව පවත්වාගෙන යන්න නොහැකි නිසා ඇති කරන ලද අතුරු ව්‍යවස්ථා. එවැනි කටයුතු ගරු සභාපතිතුමනි, අපේ පාලන කාලයේ වේවා, ඔබතුමන්ලාගේ පාලන කාලයේ වේවා ඒ සෑම කාලයකම මෙවැනි වැඩ කටයුතුවලට අපි දෙපාර්ශවයම බොහොම කල්පනාකාරීව තීන්දු ගන්න එක තමයි මගේ අදහස. ගරු විපක්ෂනායකතුමනි, ඒ නිසා ඔබතුමන්ලාගේ සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මේවා

අනුමත කරලා මේ සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාමේ දී ප්‍රායෝගිකව අපි හැම අවස්ථාවකම බොහොම සුහදශීලීව කටයුතු කරන පළාත් සභාවක මහජන නියෝජිතයෝ ලෙස මේ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අපට ඕනෑම දෙයක් ඕනෑම සංශෝධනයක් අපට ඉදිරිපත් කරලා අපට නවත්වන්න කථා කරන්න අපහසුතාවයක් ඇති වෙන්නේ නෑ. අපි විපක්ෂයෙන් කරන යෝජනා සෑම අවස්ථාවකම අපි ඔබතුමන්ලා එක්ක එකතු වෙලා තියනවා. ඒ නිසා මේ කරුණු ගැන ඉෆ්ලාර් මන්ත්‍රීතුමා හිටියේ නෑ මේ සභවේ. මම කිව්වේ අවස්ථා දෙකක් ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීම් සඳහා මන්ත්‍රීතුමන්ලා කැඳවලා තිබුණා. අදාළ තාක්ෂණ නිළධාරීන් සමඟ සම්බන්ධ නොවුන එක ගැන අපි කණගාටු වෙනවා. මීට වඩා ගරු සභාපතිතුමනි, මම කරුණු පැහැදිලි කරන්න යන්නේ නෑ. මේ ගැන වාදයක්, විවාදයක් නැත්නම් මේ ගැන මතභේදයක්, මත ගැටුමක් නෑ. ඉදිරිපත් කිරීමක් විතරයි කියලා මම අදහස් කරනවා. ඒ නිසා මේ කරුණු අනුව අද ඉදිරිපත් කරන ලද මේ කරුණු අනුමත කරලා දෙන්න කියලා නැවත වරක් ඉල්ලා සිටිමින් ගරු සභාපතිතුමනි, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. මේ සම්බන්ධයෙන් ඡන්දයකට යායුතුයිද ? නැත්නම් තමුන්නාන්සේලාගේ අදහස මොකක්ද ? ප්‍රධාන ඇමතිතුමා අනුමත කරදෙන ලෙස ඉල්ලා සිටිනවා. විපක්ෂනායකතුමා, ඔබතුමන්ලා ඡන්දයකට යායුතුයිද ? නැත්නම් සභාවේ....

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, විපක්ෂනායකතුමා සඳහන් කළා එතුමන්ලා නිශ්ශබ්දව සිටිනවා කියලා. ඒ නිසා මම හිතනවා ඡන්දයකට යායුතු වෙන්නේ නෑ. අපි එකඟතාවයෙන් අනුමත කළා කියලා තීන්දුවකට යාම සුදුසුයි.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමතිතුමා කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ගුවන් විදුලියේ, රූපවාහිනියේ අවශ්‍යතාවය තියෙන්න පුළුවන්. නමුත් අපි පැහැදිලි කරලා දුන්නා මෙහි ස්වාධීනත්වය සහ මුදල් පාලනය

ගැන අපට විශ්වාසයක් නෑ කියන එක. ඒ නිසා අපි විපක්ෂයේ මන්ත්‍රීවරු සාකච්ඡා කරලා අපි ගත්ත තීන්දුව තමයි අපට මේකට අනුමැතියක් දෙන්න බෑ කියන එක.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
***Hon.Chief Minister Mahipala Herath***

-----------------------------------------

මේක දිගින් දිගටම මෙවැනි සාකච්ඡා කරන එකේ මම දකින්නේ නෑ අවශ්‍යතාවයක්. ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ ගැන අපට ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය සභාවේ තීරණය ලබා ගැනීමට කටයුතු කරන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ගරු විපක්ෂනායකතුමා පැහැදිලි කරන ආකාරයට මීට ඉහතදී මේ යෝජනාව ඉදිරිපත් වුනේ. මේ යෝජනාව පිළිබඳව සභාවේ අපි කලිනුත් සාකච්ඡා කළා. ඒ අනුව අද නැවත සාකච්ඡාවට භාජනය කළා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව සාකච්ඡා කළා. විපක්ෂනායකතුමා පැහැදිලි කරන ආකාරයට එතුමා කියන්නේ එතුමන්ලාට කණ්ඩායමක් හැටියට අනුමැතිය දීමේ ගැටළුවක් තියනවා කියන එක. ඒ නිසා මේ කරුණ අනුමත කර ගැනීම සඳහා ඡන්දයක් පැවැත්විය යුතුයි කියලා මම

විශ්වාස කරනවා. ඒ අනුව සබරගමුව ප්‍රජා ගුවන් විදුලිය සහ රූපවාහිනි මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ධවල පත්‍රිකාව සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අත් ඔසවන්න.

(ආණ්ඩු පක්ෂයේ ගරු මැති ඇමතිතුමන්ලා අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන ලද අතර විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඡන්දය දීමෙන් වැළකී සිටින ලදී.)

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

හොඳයි. ඒ අනුව සබරගමුව ප්‍රජා ගුවන් විදුලිය සහ රූපවාහිනි මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ඉදිරිපත් කරන ලද ධවල පත්‍රිකාවට අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාවේ දී පක්ෂව ඡන්ද 14 ක් ලැබී තියනවා. ගරු මන්ත්‍රීතුමන්ලා 9 දෙනෙක් වැළකී ඉඳලා තියනවා. මේ අනුව අදාළ යෝජනාව වැඩි ඡන්ද 14 කින් සභා සම්මත වූ බව ප්‍රකාශයට පත් කරනවා.

මීළඟට තියෙන්නේ පළාත් පාලන ආයතන නියෝජිතයින් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය කෙටුම්පත පිළිබඳ සභාවේ සාකච්ඡා කිරීම සහ අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් මේ යෝජනාව ඉදිරිපත් කරලා තියනවා සභාවට. සභාවෙන් මේ පිළිබඳව කමිටුවක් පත් කෙරුවා. කමිටු වාර්තාව සභාවට බාරදීලා

තියනවා. අද නැවත යෝජනාව ඇවිල්ලා තියනවා සභාව සඳහා. මේ පිළිබඳව සභාව ගන්නා වූ පියවර පිළිබඳව කරුණාකරලා පැහැදිලි කරන්න කියලා ඉල්ලා සිටිනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තියනවා. විපක්ෂනායකතුමා මේ පිළිබඳව සාකච්ඡා නොකළ යුතුයි නම්, ඡන්දයකට යා යුතුයි නම් ඒ සම්බන්ධයෙන් අවස්ථාව තියනවා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මීට පෙර අපි සාකච්ඡාවට අරගෙන කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ වාර්තාවක් ඉදිරිපත් කරලා තියනවා. ඒකේ සංශෝධන කීපයක් කරලා තියනවා. ඒ සංශෝධනවලට යටත්ව අපි අනුමැතිය දෙනවා.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන නියෝජිතයින් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ නිර්දේශ ලබාදීම සඳහා රැස් වෙච්ච කමිටුව ඉතාම ගැඹුරින් මේ ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව සාකච්ඡා කරනු ලැබුවා. ඇත්තටම ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවය පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැතුව, සියළුදෙනාගේම එකඟතාවයෙන් ආචාර ධර්ම පද්ධතියක් අවශ්‍යයි කියන එක අපට නොයෙක් අවස්ථාවන්වල දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රාජ්‍ය21 නිළධාරීන්ට ඕනෑම ආයතනයක ආචාර ධර්ම පද්ධතියක් අවශ්‍යයි. ඒක අපේ බුදුරජාණන්වහන්සේගේ කාලයේ දීත් විනය පිටකයේ දේශණා කරලා තියෙන්නේ වරින්වර සංඝයාවහන්සේ තුළ ඇති වෙච්ච හැසිරීම් රටාවේ යම් යම් දෝෂයන් සිද්ධ වෙච්ච අවස්ථාවල බුදුරජාණන්වහන්සේ විනය පිටකය දේශණා කරලා තියනවා. ඒ වගේ මේක ලැජ්ජා වෙන්න කාරණයක් නෙමෙයි. ආචාර ධර්ම පද්ධතියක් නීතිගත කළාම ඒකට අනුව හැසිරීම් රටාව අපි හදාගන්න එක ලැජ්ජා වෙන්න කාරණයක් නෙමෙයි. ඒ නිසා අපේ පළාත් පාලන ආයතනවලට ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම වැදගත් වෙනවා. මෙහි එක් කාරණයක් හැටියට මම සඳහන් කරන්න ඕන අපි ඉතාම සුළු සංශෝධන තමයි අපි ගෙනාවේ අපේ කමිටුව මඟින්. අපි දැක්කා එක කාරණයක්. ඇත්තටම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම මේකට සහභාගී වුනා. අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලා තමයි මේ යෝජනාව ගෙනාවේ. මොකද කීප වතාවක දී දිවුරුම් දීම අවශ්‍ය නැති බවත්, ආණ්ඩුක්‍රම පනත යටතේ දිවුරුම් දෙන අවස්ථාවේ දී රට දෙකඩ කිරීමට කටයුතු කරන්නේ නැත, ඒ දිවුරුම් දෙන අවස්ථාවේ දීම, රජයට පක්ෂපාතීව කටයුතු කරනවා කියලා දිවුරුම් දෙන

එක පළමුවෙන්ම අනුමත කළා. අපේ කොමසාරිස්තුමිය පළාත් පාලන ආයතන නිළධාරින් එක්ක කරපු සාකච්ඡාවේ දී පළාත් පාලන ආයතන නියෝජිතයින් මේකට එකඟතාවයක් නැත කියන එක සඳහන් වෙච්ච නිසා අපි නැවත වරක් ඒ පිළිබඳව විශ්ලේෂණය කරලා බැලුවා. බැලුවාම ඒ අවශ්‍යතාවය හැඟී යන බැවින් අපි එයට විරුද්ධව අපි ඇත්ත වශයෙන්ම කමිටුව තීන්දු කළා යම් යම් සංශෝධන ආචාර ධර්ම පද්ධතියක් අවශ්‍යයි කියලා. ආචාර ධර්ම පද්ධතියක් අවශ්‍යයි කියන අවස්ථාවේ දීම මේ ආචාර ධර්ම පද්ධතිය අනුව කටයුතු කරනවා කියන දිවුරුම් දීමත් ඒ අවස්ථාවේ දීම දෙන්න කියන සංශෝධනය ගෙනාවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. අපි ඒකට එකඟතාවය පළ කළා. ඒ අනුව ඒ සංශෝධනය මේකට අඩංගු වියයුතුයි කියන එක අපි සඳහන් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරයෙක් විදේශගත වන අවස්ථාවක අවසර ලබා ගැනීම පිළිබඳව, ඇත්ත වශයෙන්ම අවසරයක් ලබා ගැනීම අවශ්‍ය වෙනවා. එතකොට

දැනට පවත්වා ක්‍රමය විෂයය භාර අමාත්‍යතුමාගේ නිර්දේශය මත ආණ්ඩුකාරවරයා විසින් ඒ අනුමැතිය ලබාදීම සිදුකරනවා කියන දැන් පිළිවෙත බව පළාත් පාලන කොමසාරිස්තුමිය සඳහන් කළා. ඒ ගැන අවධානය යොමු කරපු කමිටුව සඳහන් කලේ ඇත්ත වශයෙන්ම විෂයය භාර ඇමතිතුමාගේ අනුමැතිය ඇතුව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාදීම සුදුසු බවට තීන්දු කළේ.

මොකද මෙහි සඳහන් වෙනවා විදේශ සංචාරයක් සඳහා පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතිය ප්‍රමාණවත් බව. විදේශගත වීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට අමතරව විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගත යුතුය යන්න තම මතය බව ප්‍රකාශ කරලා තිබුණා. පළාත් පාලන නියෝජිතයන්ට විදේශගත වීමට අවශ්‍ය වූ විට විෂයය භාර අමාත්‍යවරයාගේ සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීම දැනට පවත්නා ක්‍රමය. එම ක්‍රමවේදයම පවත්වාගෙන යාම සුදුසු බවට කමිටුව තීරණය කළා. හේතුව විෂයය භාර අමාත්‍යවරයා සම්බන්ධ වීම තුළ අසාධාරණයක් සිදු නොවන බවට කමිටුවට හැඟීයන නිසා. ඉස්සෙල්ලා තිබුනේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය

කියලා. අපි ඒක විෂයය භාර ඇමතිතුමාගේ නිර්දේශය අවශ්‍යයි කියන එක අපි සංශෝධනයක් හැටියට ඉදිරිපත් කළා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම සඳහන් කරන්න තියන සංශෝධන හැටියට අපට සඳහන් කරන්න පුළුවන් වෙන්නේ ඒක. විදේශ සංචාර සඳහා පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතිය ප්‍රමාණවත් බව පක්ෂ විපක්ෂ දෙකටම අත්‍යාවශ්‍ය වන්නේ නම් චක්‍රලේඛයක් සැකසීම සුදුසුයි කියලා යෝජනා කරලා තිබුණා නියෝජිතයින්ගේ සාකච්ඡාවේ දී. ඇත්තටම ඒක අපි සාකච්ඡා කළේ නෑ. මොකද ආචාර ධර්ම පද්ධතියට ඒක අදාළ වෙන්නේ නැති නිසා. ඊළඟට නිර්නායක මත මිස පුද්ගලිකත්වය මත විදේශ සංචාර නොකිරීම සහ තම බල ප්‍රදේශය වෙනුවෙන් විදේශ සංචාර අදාළ මහජන නියෝජිතයින්ට ලබාදීම කියන එක සාකච්ඡා කළේ නෑ. එහෙම යෝජනාවක් නියෝජිතයින් විසින් කරලා තිබුණා. අපි සාකච්ඡා කළේ නෑ. ඒකත් ආචාර ධර්ම පද්ධතියට අදාළ නොවන නිසා. ඊළඟට පළාත් පාලන අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් උපදේශක මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවට සඳහන් කරලා තිබුණා. මෙම යෝජනාව අවශ්‍ය නොවන බව ප්‍රකාශ වුනේ අවසාන තීන්දුව ගන්නේ අමාත්‍යවරයා බැවින් මෙම යෝජනාව අවශ්‍ය නොවන බවත්, සඳහන් වුනා. මොකද අවසාන තීන්දුව ගන්නේ අමාත්‍යවරයා නිසා අමාත්‍යවරයාට ඒ කටයුත්ත සඳහා උපදේශක මණ්ඩලයක් අවශ්‍ය නම් අමාත්‍යතුමාටම පුළුවන් වෙනවා පත් කරගන්න. එහෙම අවශ්‍ය නැත්නම් ඒ කටයුත්ත ඉටු කිරීම ගැන කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නෑ. ඒ වගේම සභාපතිතුමනි, අපි මීට වඩා යමක් සංශෝධනය කළේ නෑ. ඒ සංශෝධන මත මේ ආචාර ධර්ම පද්ධතිය සඳහා නිර්දේශය ලබාදීම සුදුසුයි, අපේ

එකඟතාවය ලබාදීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු සභානායකතුමනි.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------

ගරු සභාපතිතුමනි, පැහැදිලිව ඔබතුමාගේ නිර්දේශය මත කමිටුවක් පත් කරන ලද, ඒ කමිටුවේ අපේ සභානායකතුමා සභාපතිත්වය දරමින් දින කීපයක් මේක දීර්ඝ ලෙස සාකච්ඡා කරලා ඒ අනුව තමයි අද සභානායකතුමා මේ සභාව දැනුවත් කළේ. එහෙම නම් තවත් මේක කල් යවන්නේ නැතුව මෙම සභාව අද දිනයේ මේක සම්මත කරමින් ඒ කියන ලද සංශෝධන කීපයට යටත්ව මෙය සම්මත කර යැවීම සුදුසුයි කියලා මේ සභාවේ යෝජනා කරනවා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-------------------------------------------

ගරු සභාපතිතුමනි, මමත් මෙම කමිටුවේ සාමාජිකයෙක් හැටියට කටයුතු කළා. විශේෂයෙන් අපේ සභානායකතුමා ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධයෙන් එක කාරණාවක් මතක් කරන්න ඕන. මේකේ අර සංශෝධිත විස්තර ටික අපට ලැබුනේ නෑ. විශේෂයෙන්ම කමිටු සාමාජිකයන් හැටියට අපටත් මේක ලැබෙන්න සළස්වලා නෑ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ඒ කියන්නේ කමිටු වාර්තාවද?

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-------------------------------------------

වාර්තාව. ඒ පිළිබඳව ඔබතුමා විශේෂ අවධානය යොමු කරන්න. මොකද කමිටුවේ සාමාජිකයෙක් හැටියට අපට වගකීමක් තිබෙනවා ඒක ලබා ගැනීම. අපට ඒක ලැබුනෙ නෑ ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමනි. ඒ අනුව ගරු සභානායකතුමා විසින් සභාගත කරන ලද කමිටුවේ වාර්තාව සභාවේ මන්ත්‍රීතුමන්ලා සඳහා යැවීමට අපි කටයුතු සිද්ධ කරනවා. ඒ අනුව පළාත් පාලන නියෝජිතයින් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය කෙටුම්පත පිළිබඳව සභාවේ සාකච්ඡා කිරීම හා අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව යටතේ මේ පිළිබඳව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සැදුම්ලත් කමිටුව විසින් කරන ලද වාර්තාවත්, ඒ වගේම සභාවේ දැන් තිබෙන තත්ත්වයත් සභාව තුළ ප්‍රකාශ කරන්න යෙදුනා. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙය සභාගත කළා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ විශේෂයෙන් විපක්ෂනායකතුමා ප්‍රකාශ කරනවා මෙය තවදුරටත් සාකච්ඡා කිරීම

අවශ්‍ය වෙන්නේ නෑ. කමිටුවේ වාර්තාව අනුව, සංශෝධන සහිතව මේ කටයුතු ඉස්සරහාට අරගෙන යන්න කියලා. එහෙම නම් සභාවේ ඒකඟතාවය අනුව මේ පිළිබඳව ඡන්ද විමසීමකට යන්නේ නෑ. ඒ අනුව ඉහත සඳහන් පළාත් පාලන ආයතන නියෝජිතයින් සඳහා වූ ආචාර ධර්ම පිළිබඳ කෙටුම්පත සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද සංශෝධන සහිතව ඒ යෝජනාව ඒකඡන්දයෙන් සභා සම්මත වූ බව සභාවේ ප්‍රකාශ කරනවා. ඒ යෝජනාව අපි රේඛීය අමාත්‍යාංශයේ පළාත් පාලන ලේකම්තුමාටත්, ඒ වගේම අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම්තුමාටත් දන්වා යැවීමට කටයුතු කරනවා.

මීළඟට පැල්මඩුල්ල, ඇඹිලිපිටිය, වැලිගෙපොල සහ දෙහිඕවිට යන ප්‍රාදේශීය සභාවන්හි අතුරු ව්‍යවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම හා අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව. මෙය මීට සභාවාර කීපයකට ඉහත දී ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් මේ අතුරු ව්‍යවස්ථා සියල්ලම ගරු මන්ත්‍රීතුමන්ලාට ඉදිරිපත් කරලා සභාවේ න්‍යාය පත්‍රය තුළ ඉස්සරහාට අරගෙන

ඇවිල්ලා තියනවා. ඒ අනුව අද නැවත මේ යෝජනාව ගෙනල්ලා තියනවා. අදහස් දැක්වීමට අවශ්‍යතාවයක් තියේවිද ? එහෙම නැත්නම් මේ කටයුතු ඉස්සරහාට අරගෙන යනවාද ? කියන එක පිළිබඳව සභාවේ අදහස් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් කාරක සභාවට යොමු කරලා කාරක සභාවේ තීන්දුව ප්‍රකාරව කටයුතු කිරීම සුදුසුයි කියලා අපි යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

ඔබතුමන්ලා කියන්නේ කාරක සභාව තුළ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මේ අදාළ අතුරු ව්‍යවස්ථා සහ ඊට අමතරව පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය පිහිටුවීමේ ප්‍රඥප්තියත් තියනවා. ඒ සියල්ලම ප්‍රඥප්ති කාරක සභාවට යොමු කරන්නද තමුන්නාන්සේලා ඉල්ලන්නේ ?

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, පින්නවල සම්බන්ධයෙන් ප්‍රඥප්ති කාරක සභාවේ සාකච්ඡා කළා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

අතුරු ව්‍යවස්ථා ටික විතරද තමුන්නාන්සේලා ඉල්ලන්නේ කාරක සභාවට යොමු කරන්න කියලා ? හොඳයි ඒ අනුව පැල්මඩුල්ල, වැලිගෙපොල, ඇඹිලිපිටිය හා දෙහිඕවිට යන ප්‍රාදේශීය සභාවන්හි ඉදිරිපත් කර ඇති අතුරු ව්‍යවස්ථා 13 සාකච්ඡා කිරීම සඳහා අපි මාසයක කාලයක් ඇතුළත මේ අතුරු ව්‍යවස්ථා පිළිබඳ සාකච්ඡා කරලා ගරු සභාවට වාර්තා කරන ලෙස අපි මේ පිළිබඳව ප්‍රඥප්ති කාරක සභාවට යැවීමට අපි කටයුතු කරනවා.

මීළඟට පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය පිහිටුවීම පිළිබඳ සාකච්ඡා කිරීම හා අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව. ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමා මේක ප්‍රඥප්ති කාරක සභාවේ සාකච්ඡා කරපු කාරණාවක්ද මේක ?

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ඔව්, සභාපතිතුමනි, අපි ගරු ප්‍රධාන ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වපු ප්‍රඥප්ති කාරක සභාවේ අපි මේක සාකච්ඡා කරලා එකඟතාවයකට ආවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! මේ පිළිබඳව සභාවේ තවදුරටත් සාකච්ඡා කළයුතුයිද ? නැත්නම් ඡන්දයකට යායුතුයිද ? මේ සම්බන්ධයෙන් සභාවේ අදහස් ?

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව නැවත සාකච්ඡා කිරීම අවශ්‍ය නැති බව ප්‍රකාශ කරන්න ඕන. මොකද අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තියන නිසා. ඒ නිසා සම්මත කර ගැනීමට අනුමැතිය දෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ඡන්දයකට යායුතුයිද ?

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

අවශ්‍ය නෑ .

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ප්‍රඥප්ති කාරක සභාව අනුව කටයුතු කරන ලෙස යෝජනා කරනවද ? ස්තුතියි ! තමුන්නාන්සේලා සියළුදෙනාටම. ඒ අනුව පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය පිහිටුවීමේ ප්‍රඥප්තිය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ගරු ප්‍රධාන ඇමතිතුමා විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප්‍රඥප්ති කාරක සභාවේ මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට ඇතුළත්වෙලා තියනවා. ගරු විපක්ෂනායකතුමා පැහැදිලි කරනවා ප්‍රඥප්ති කාරක සභාවේ දී සාකච්ඡා කළ කරුණු අනුව මේ යෝජනාව ඡන්දයකට යායුතු නෑ. ඒ අනුව ඒ සංශෝධන සහිතව ඒක ඡන්දයෙන් මේ යෝජනාව සභා සම්මත වූ බව ප්‍රකාශ කරනවා.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දේගම මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2015/14 දරණ යෝජනාව මීට ඉහත දී මේ ගරු සභාවට ඉදිරිපත් කරලා, ඊට අමතරව පසුගිය සභා වාරයේ දි මේ පිළිබඳව නැවත සාකච්ඡා කරපු මොහොතේ දී ගරු රංජිත් බණ්ඩාර අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කළා විෂයය භාර අමාත්‍යවරයා සභාවේ නැති නිසා මෙය සාකච්ඡා කිරීම වෙනත් දවසක සුදුසු බව. ඒ අනුව යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමාගෙන් කරන ලද ඉල්ලීම අනුව එතුමා කිව්වේ යෝජනාව සාකච්ඡාවට ගතයුතුයි කියලා. ඒ අනුව යෝජනාව සාකච්ඡාවට ගත්තා. සාකච්ඡාවට ගැනීමෙන් අනතුරු ගරු ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අදහස් පළකළා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීම සඳහා තමයි මේ යෝජනාව ඉදිරිපත් වුනේ. ඒ වගේම එදා අජිත් කුමාර මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා යෝජනාව සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න. ඊළඟ සභාවාරයේ දී ගරු ප්‍රධාන ඇමතිතුමා ඉදිරියේ දී එතුමාගේ නිරීක්ෂණ ලබාදීමට අවස්ථාව දෙන්න කියලා කියපු නිසා සභාපතිවරයා හැටියට එතුමාගේ යෝජනාවට අවස්ථාව ලබාදීලා රීති ප්‍රකාරව අද දින සභාවට ගෙනල්ලා තියනවා. ඒ අනුව ඒක සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවයක් අපි දකින්නේ නෑ. ඒ අනුව ප්‍රධාන අමාත්‍යතුමාට අපි අවස්ථාව ලබාදෙනවා ඒ පිළිබඳව කටයුතු කිරීමේ

අවස්ථාව ලබාදෙන්න. ගරු ප්‍රධාන ඇමතිතුමනි, ඔබතුමාගේ අවස්ථාව.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
***Hon.Chief Minister Mahipala Herath***

------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ සභා සම්ප්‍රදායේ හැටියට සාමාන්‍යයෙන් මේ සභාවට ඉදිරිපත් කරන යෝජනාවක එහි පිළිතුරට ඒ විසඳුම සඳහා කටයුතු කළයුතු අමාත්‍යවරයා නොසිටින අවස්ථාවක ඒක සාකච්ඡාවට අපි නොගන්නා සම්ප්‍රදයක්

තමයි මේ සභාවේ තිබුනේ. මේ කරුණ අපේ ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා පැහැදිලිව මේ ගරු සභාවට දන්වා තිබියදීත් එම යෝජනාව ඉදිරිපත් කරන අජිත් කුමාර මැද්දේගම මැතිතුමා මා නොමැති අවස්ථාවක මේ කාරණාව සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තියනවා. මේ සභාවේ පසුගිය මා හිටපු දොලොස් වසර තුළම මෙවැනි දෙයක් සිද්ධ වෙලා නෑ. මොකද අපි පක්ෂ විපක්ෂ භේදයක් නැතුව සුහදතාවයකින් මේ කරුණු සාකච්ඡා කරගෙන යනවා මිසක් කාටවත් පෞද්ගලික විදිහට මේ යෝජනා තුළින් පහරවල් එල්ල කරන්න අපේ සභාව කොයි මොහොතකවත් කටයුතු කරලා නෑ. ඉතින් ඒක නිසා ඊටත් අමතරව ගරු සභාපතිතුමනි, මම එදා රෝහල්ගත වෙලා හිටියේ. මට දැන ගන්න ලැබුණා, මොකද මම මේ සභාවට නොපැමිණෙන්නේ කලාතුරකින්. එහෙම අවස්ථාවකවත් මම ප්‍රධාන ඇමතිවරයා ලෙස ඒ සැළකිල්ලක්වත් නොදක්වමින් මේ කටයුත්ත එතුමා සාකච්ඡාවට ගත්ත නිසා ගරු සභාපතිතුමනි, මම මේ කාරණාව සම්බන්ධයෙන් මගේ ඉදිරි කටයුතු මෙතනින් නවත්වනවා. මොකද මට ඒ කාරණාවට මා නැතුව කරන ලද සාකච්ඡාවක් නිසා නැවත ඒ සම්බන්ධයෙන් වගකීමක් ගන්න මට බැහැ. ඒ වගේම මම ඉතාමත්ම කණගාටු වෙනවා ඊට වඩා මේ පළාත් සභාව ඉදිරිපිට එදා උද්ඝෝෂණයක් පවත්වමින් මේක අනවශ්‍ය අපි අතර නැති ආරවුල් ඇති කිරීමට මේ කරුණු අරගෙන යනවාද කියන එක මට සැකයක් තියනවා. මොකද අපි පසුගිය කාලයේම අපි බොහොම සුහදතාවයකින් අපි කටයුතු කරන්නේ මේ සභාවේ ගරුත්වය ආරක්ෂා කරගෙන. මේකේ අපි කාටවත් පහරවල් ගහන්න කොයිම මොහොතකවත් මේ විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් කිසිම අවස්ථාවක කටයුතු කරලා නෑ. ගරු සභාපතිතුමනි, එවැනි මුහුකුරා ගිය තරුණ මන්ත්‍රීවරු පවා සභාවට ගරුත්වයක් ඇතුව, සභාවේ ඉන්න සියළුම මන්ත්‍රීවරු තම සහෝදරත්වය සළකන පිරිසක් හැටියටයි කටයුතු කරලා තියෙන්නේ. දේශපාලන මතිමතාන්තර තියෙන්න පුළුවන්. අද පවතින රජය යහපාලනය යටතේ රජයක්. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමාට විරුද්ධ වෙන්නේ නෑ. එතුමා මම හිතන්නේ එතුමාගේ යම් පරිනතභාවයක් තියනවා නම් එතුමා මේ ප්‍රශ්නය මම එන තෙක් තියනවා. මොකද මම කොයිම අවස්ථාවකවත් පෞද්ගලිකව මම කිසි කෙනෙකුගේ පාර්ශවයක් අරගෙන මේ සභාවේ වැඩ කරලා නෑ. ඒ නිසා මට මේකට මැදිහත් වෙන්න තිබුණා. ගරු විපක්ෂනායකතුමනි, මගේ ඒ අවස්ථාව පැහැර හැරලා. මෙතන අනවශ්‍ය විදිහට උසිගැන්වීම් තුළින් මේ සභාව තුළ ජනතාව කුපිත කරවන ආකාරයට වැඩ කරනවා නම් අපි මේ මහජන නියෝජිතයෝ නෙමෙයි. අපි ඒක සාධාරණව සාකච්ඡා කරලා විසඳාගන්න පුළුවන් මට්ටමක දේශපාලන පරිනත තත්ත්වයකට අපි පත්වෙන්න ඕන. ගරු සභාපතිතුමනි, මම කණගාටුවෙන් වුනත් කියනවා මීට ඉහත මේ සභාවේ ඉදලා තියෙන්නේ එක්කෙනයි. මම නම මතක් කරන්නේ නෑ සභාවේ නැති නිසා. එවැනි තත්ත්වයකට පත් වෙනවා නම් ගරු විපක්ෂනායකතුමනි, අපි එදා ඒකමතිකව අයවැය අනුමත කරමින් මේ ඉතිරි අවුරුදු එක හමාර යාම සඳහා අපි සුහදත්වයෙන්, මිත්‍රත්වයෙන් අපි සියළුදෙනාම මෙහි තියන මේ ප්‍රතිපාදන බෙදා හදාගෙන යන ගමනක ඉන්න ඕන. එක පැත්තක තව කෙනෙකුට පහර ගහමින් කථා කරන්නට අපි මම හිතන්නේ සූදානම් වෙනවා නම්, කවුරු හෝ මේ සභාව ඒ සඳහා යොදා ගන්නවා නම් ගරු සභාපතිතුමනි, මම ඒ ස්ථානයේ නෑ. ඒ නිසා අපේ ගරු අජිත් මැද්දේගම මන්ත්‍රීතුමනි, ඔබතුමාට පුළුවන් රජය තියනවා, මධ්‍යම රජයේ වැඩක්. මේක අපිට මැදිහත් වෙලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නෙමෙයි. නමුත් ඔබතුමාට ගරු කරලා මම එදා

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ඒ අනුව.....

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

------------------------------------------------------------

වචන කීපයක් කථා කරන්න අවස්ථාව තියනවාද මට ?

කිව්වා ස්ථානගත පරීක්ෂණයක් කරලා මම සභාගත කරනවා වාර්තාව කියලා ප්‍රකාශයක් කළා. ඒ පොරොන්දුව ඔබතුමා ඒ වචන කිසි විශ්වාසයකට ගන්නේ නැතුව උද්ඝෝෂණ පවත්වමින් කටයුතු කිරීම මේ සභාවට කරන ලද අපහාසයක්, අගෞරවයක් හැටියටයි ගරු සභාපතිතුමනි, මම දකින්නේ. මේ සභාවේ කිසිදු මන්ත්‍රීවරයෙක් මීට පෙර මෙවැනි අපහසුතාවයකට පත්වෙලා නෑ. ඒක මම ඉතාම කණගාටුවෙන් වුනත් ප්‍රකාශ කරමින් මේ ප්‍රශ්නය මීට ඉදිරියට ගෙනයාම සඳහා මගේ කිසිම සහභාගීත්වයක් නොමැති බව මම කණගාටුවෙන් ප්‍රකාශ කරමින් මේ සභාව යම් අවස්ථාවක මගෙන් වෙනත් ඕනෑම කටයුත්තක් ගැන මේ මන්ත්‍රීතුමන්ලා මගෙන් ඇහුවොත් ඒ ඕනෑම කටයුත්තකට මම ඔබතුමන්ලා සමඟ එකතු වෙනවා. මම කණගාටු වෙනවා අජිත් මැද්දේගම මන්ත්‍රීතුමා මේ ගෙන යන වැඩ පිළිවෙලත් එක්ක අපි අතර තියන සුහදත්වය කොයි මොහොතේ හෝ බිඳෙයිද කියලා මට සැකයක් තියනවා. මම මේ සභාවේ අවුරුදු දොළහක අත්දැකීම්, පාර්ලිමේන්තුවේ අවුරුදු දහයක අත්දැකීම් තුළින් මම කථා කරන්නේ. ඒ නිසා අපි

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ඉතාම කෙටියෙන්, සාකච්ඡා කරන්න එපා. කෙටියෙන් ඉවර කරන්න.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
***Hon.Chief Minister Mahipala Herath***

--------------------------------------------

අතර මේ ඇතිවෙලා තියන මිත්‍රත්වය මනුෂ්‍යත්වයත් එක්ක තියන මිත්‍රත්වයක්. මේක දේශපාලන වශයෙන් තමන්ගේ තමන් යන ගමන තමන් වඩාත්ම ඉක්මණින් යන්න දරණ උත්සාහයන් තුළ මම හිතන්නේ ඒ ගමන් කොට වෙනවා කියන එකයි මම දකින්නේ මගේ තියන දේශපාලන අත්දැකීම්තුළ. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ ප්‍රශ්නය ගැන මම මීට පස්සේ වචනයක්වත් මේ සභාවේ කථා කරන්නට මම කැමති නැති බව ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මම ගරු ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් කථා කරනවා නම් මම සභාවෙන් යනවා දැන්. න්‍යාය පත්‍රයේ මට අදාළ කරුණුවලට විතරයි මේක දාලා තිබුනේ. මේ ප්‍රශ්නය එදා කථා කරලා තියනවා. ඊට අදාළ නැවත කරුණු පැහැදිලි කරන්න මේ සභාවට ඉඩදෙනවා නම් ඔබතුමා මේ තියන සභා රීතිවලට විරුද්ධයි. මොකද මගෙයි, විපක්ෂනායකතුමාගෙයි අපි දෙන්නාගේ කථාවලින් පස්සේ තවත් මන්ත්‍රීවරයෙකුට ඒ මාතෘකාව යටතේ කථා කිරීමේ අයිතියක් නෑ ගරු සභාපතිතුමනි. එහෙම නම් වෙනම යෝජනාවක් දාලා වෙන දිනයක පුළුවන් මේ ගරු මන්ත්‍රීතුමාට මට විරුද්ධව හෝ මේ කාරණාව සම්බන්ධයෙන් ගන්න. නමුත් මේ ප්‍රශ්නය කථා කිරීමට දෙනවා නම් ගරු සභාපතිතුමනි, සභා රීති අනුව මම විරුද්ධයි.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

මට චෝදනාවක් ආවා උද්ඝෝෂණයක් කළා කියලා. මම එහෙම දෙයක් කළේ නෑ.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
***Hon.Chief Minister Mahipala Herath***

-----------------------------------------------

සභාපතිතුමනි, මේ සභාව පාලනය කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

හරි, මහ ඇමතිතුමනි. ඔබතුමාගේ යෝජනාව පිළිබඳව ඉදිරි අවස්ථාවක දී ඒ පිළිබඳව පැහැදිලි කිරීමට ඉඩකඩ තියනවා.

ඔබතුමාගේ යෝජනාව 6/1/2015/14 දරණ යෝජනාව පිළිබඳව පසුගිය සභා වාරයේ දී සාකච්ඡා කරන්න යෙදුනා. ඒ පිළිබඳව ගරු විෂයයභාර අමාත්‍යවරයා හැටියට එතුමා මේ පිළිබඳව දක්වන අදහස් ඉදිරිපත් කරන්න කටයුතු කළා. ඒ අනුව මේ ඉදිරිපත් කරන ලද කරුණු සියල්ලම මේ සඳහා පක්ෂව

විපක්ෂව සහ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා යෝජනා අදහස් ඉදිරිපත් කළා. ඒ අදහස් අදාළ ආයතන වෙත අපි යැවීමට කටයුතු කරනවා. ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට අපි කටයුතු කරනවා. මීළඟට ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/12 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමාට අපි අවස්ථාව ලබාදෙනවා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*

-----------------------------------------------

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යවරුනි. ගරු මන්ත්‍රීවරුනි, වර්තමානයේ ප්‍රශස්තම පාලන ක්‍රමය ලෙස පිළිගන්නා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ක්‍රියාවට නැඟෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ලෙසයි. එනම් මහජනතාව විසින් කලින් කළට මැතිවරණ මඟින් තෝරා පත්කර ගනු ලබන මහජන නියෝජිතයින් හරහායි. එලෙස නියෝජිතයින් තෝරා පත්කර ගනුයේ භූමිය හා ජනගහණය පදනම්කොට ගත් කොට්ඨාශ මුල්කොට ගෙනයි. අද මෙරට ක්‍රියාත්මක වෙන සමානුපාතික ඡන්ද ක්‍රමය තුළ මැතිවරණ කොට්ඨාශය විශාල බලප්‍රදේශයක් වීම නිසාත්, පුද්ගලයින් තෝරා ගැනීමේ දී ඇති මනාප තරඟය නිසාත් බරපතල ගැටළු රැසක් මතුවී තිබේ. එය මෙරට දේශපාලන සංස්කෘතියට අයහපත් ලෙස බලපා තිබේ. එසේම සමව ඒ ඒ ප්‍රදේශවලට වගකියන නිසි මහජන නියෝජිතයින් නොමැති නිසා සංවර්ධන ක්‍රියාවලිය සමතුළිත නොවේ. ජනතා අවශ්‍යතා ඉටුකිරීම සාධාරණ නොවේ.

එබැවින් කේවල ඡන්ද ක්‍රමයට හෙවත් කොට්ඨාශ ඡන්ද ක්‍රමයට වඩාත් බර තැබෙන සමානුපාතික ක්‍රමයේ සාධනීය ගුණයන් එක්කරගත් නව ඡන්ද ක්‍රමයක් පළාත් සභා මැතිවරණය සඳහා ද හඳුන්වා දියයුතු බවට අදාළ වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටීමට මෙම සභාවට යෝජනා කරන්නීය.

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව මේ ගරු සභාවේ සම්මත වන බව අපි දන්නවා. හැබැයි මේ සභාවේ සම්මත වුනත් මේක මේ රටේ ක්‍රියාත්මක වෙයිද නොවෙයිද කියන කාරණාව මම දන්නේ නෑ. මේ තියන සමානුපාතික ක්‍රමය නැත්නම් මනාප ක්‍රමය පෞද්ගලිකව අපි අපට වාසි සහගතවෙන්න පුළුවන්. හැබැයි මේ රටේ දේශපාලන සංස්කෘතියේ හැරවුම් ලක්ෂයක් විදිහට වෙනස් වියයුතුයි කියන තැන ඉදගෙන මේ යෝජනාව මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා. ගරු සභාපතිතුමනි, අද අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමය. අර අර්නස්ට් බේකර් කියන දේශපාලන චින්තකයා කියනවා සමානුපාතික ඡන්දය ක්‍රමය ගැන මෙහෙම. දේශපාලන පක්ෂයකට ඡන්දය දුන් ඡන්ද දායක සංඛ්‍යාවට අනුපාතිකව එක් එක් දේශපාලන පක්ෂ සඳහා නියෝජිතයන් ලබාදීම තමයි සමානුපාතික ඡන්ද ක්‍රමය කියලා කියන්නේ. එතකොට ඒ ඒ පක්ෂ ගන්නා ඡන්දවලට අනුපාතිකව නියෝජිතයන් ලබාදීම තමයි සමානුපාතික ක්‍රමය කියලා කියන්නේ. ගරු සභාපතිතුමනි, මට අවසර දෙන්න මේ රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්කවල අනුපාත ගැන කියන්න. රත්නපුර දිස්ත්‍රික්කයේ 8,010,000 ක් ඡන්ද දායකයෝ. නියෝජිතයින් 24 දෙනයි. එතකොට 33,000 ට 1 නියෝජිතයයි. කෑගල්ලේ 650,000 යි. නියෝජිතයෝ 18 යි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ 36,000 ට 1 යි. ඔන්න අනුපාතයේ අවුලක්. ඡන්ද ප්‍රතිඵල 2002 කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් සභා ඡන්දය. 213,000 ක් ගන්නවා සන්ධානය. මන්ත්‍රීවරු 11 දෙනයි. එතකොට 19,000 ට 1 යි. යූ.එන්.පී එක 130,000 යි. මන්ත්‍රීවරු 6 යි. 21,000 ට 1 යි. එතනත් අනුපාතයේ අවුලක්. ඊළඟට සී.ඩබ්.සී. එක ගන්නේ ඡන්ද 8,900 යි. එක මන්ත්‍රීවරයයි. එතකොට අර අර්නස්ට් බාකර් කියන ඒ ඒ පක්ෂ ලබාගත්ත අනුපාතයේ හැටියට නියෝජිතයෝ ලැබෙන්නේ නෑ. ඒ හින්දා සමානුපාතික නියෝජන ක්‍රමය අපේ රටේ ක්‍රියාත්මක කිරීමම විකෘතියක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපේ රටේ ක්‍රියාත්මක වෙන සමානුපාතික ක්‍රමය වැරදියි.

දැන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඉතා පැහැදිලි දෙයක්. රත්නපුර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ 8 ක් තියනවා. ඇහැළියගොඩ ආසනයේ ඡන්ද 96,170 යි. ගරු සභාපතිතුමනි, අපි 7 දෙනෙක් ඉන්නවා. ඇහැළියගොඩ ආසනයේ ඡන්ද දායකයෝ 13,000 ට 1 ගානේ ඉන්නවා. කලවාන ආසනයේ ඡන්ද දායකයෝ 62,000 ක් ඉන්නවා. පළාත් සභාව නියෝජනය කරන එකදු මන්ත්‍රීවරයෙක්වත් නෑ. බලන්ගොඩ 106.000 ක් ඡන්ද දායකයෝ ඉන්නවා. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා නියෝජනය කරන බලන්ගොඩ. පළාත් සභාවේ ඉන්නේ මන්ත්‍රීවරු දෙන්නයි. 50,000 ට 1 යි. ඒ හින්දා ගරු සභාපතිතුමනි, ඉතා පැහැදිලි දේ තමයි මම මේ සමානුපාතික ක්‍රමයේ නරක ටික කියන්නම්. බැලූ බැල්මටම සමානුපාතික ක්‍රමය අනුපාත නියෝජන ක්‍රමයක් කියලා කිව්වාට ඒක එහෙම නෙමෙයි. ඒ හින්දා මහජනතාවට සාධාරණයක් වෙන්න නම් මේ සමානුපාතික ක්‍රමය වෙනස් වෙන්න ඕන. මෙතනින් එහා ගිය අපට බලපාන

කරුණු ටිකක් තියනවා ගරු සභාපතිතුමනි. අපි ඡන්ද කාලයට අර කොළඹ දිස්ත්‍රික්කයේ මායිමේ දිවුරුම්පිටියෙන් පටන් ගත්තාම හම්බන්තොට කෙලවරේ තුංකමට යනකල් යන්න ඕන. අරහේ හල්දුම්මුල්ල, මෙතන ඉංගිරිය, අතන දෙණියායේ සිංහරාජ කෙලවර. මේකයි කතන්දරය මෙහෙන් කෑගල්ල කෙලවර. එතකොට අති විශාල බලප්‍රදේශයක් තමයි අපි ඡන්ද කොට්ඨාශයක් විදිහට මේ මනාප ක්‍රමය තුළ සළකන්නේ. මේ කාලයේ අපට තියන නැති බැරි අමාරුකම් කියන්න ඕන කමක් නෑ. අපි ඡන්ද කාලයට ගිහිල්ලා මොනවා හරි ගේම් ගහගෙන ඇවිල්ලා මනාප ටිකක් අරගෙන තමුන්ගේ ආසනයට ගිහිල්ලා ඉන්නවා. මහජනතාවට කරන කොයි තරම් අසාධාරණයක් ද ගරු සභාපතිතුමනි. ඡන්ද කාලයට ගිහිල්ලා අපි මොනවා හරි

ටිකක් කියලා, කථා කරලා, නෑදෑකම් ටිකක් මතු කරගෙන ඡන්ද ටික අරගෙන එනවා, කොහොම හරි මනාප ටිකක් අරගෙන මේ සභාව නියෝජනය කරන්න.

හැබැයි අපට ඡන්දය දීපු මිනිස්සු එක්ක බැදීම් නෑ. හේතුව තමයි ඡන්ද බලප්‍රදේශය විශාල වීම නිසා තියන නරක. ඊළඟ එක මනාප තරඟය. අද අපි මෙතෙන්ට ඇවිල්ලා හිනා වෙලා කථා කරලා හිටියාට ගරු සභාපතිතුමනි, ඡන්ද කාලෙට තමුන්නාන්සේලා අපි එකම පිළේ අපි කොයි තරම් නපුරු, නරක විදිහට ද කටයුතු කරන්නේ. ගහ ගන්නවා, මරාගන්නවා. පෝස්ටර් ඉරා ගන්නවා. මේක තමයි මනාප ක්‍රමයේ තියන නරකම දේ. ඒ හින්දා ගරු සභාපතිතුමනි, මේ සමානුපාතික ක්‍රමය මේ රටේ දේශපාලනය මහා පිළිකාවක්. මනුස්සකම නෑ අපි ලඟ ඒ කාලයට. ඒ හින්දා මේ මනාප ක්‍රමය වෙනස් වියයුතු නැද්ද ගරු සභාපතිතුමනි.

ඊළඟට සමහර අයෙක් අකමැති වෙයි මේ කාරණය කියනවාට. මේ ඡන්ද ක්‍රමය දුවන්න පුළුවන් වෙන්නේ සල්ලි තියන, ඇති හැකි අයට විතරයි. මං වගේ වඩු බාස්උන්නැහේ කෙනෙකුගේ පුතෙකුට හරි අමාරුයි මේ ඡන්ද ක්‍රමය කරන්න. ගරු සභාපතිතුමනි, සල්ලි තියන අය ඇති තරම් යාන වාහන දාගෙන අපි දන්නවා ඡන්ද කාලෙට වාහන 100 ක්, 200 ක් යනකොට අපි ත්‍රීවිලර් එකේ නැගලා අත වනාගෙන යනකොට මිනිස්සු අපට හිනා වෙනවා. ඇයි දෙවියනේ මම අර කලින් කිව්වා වගේ තුංකම ඉදලා දිවුරුම්පිටියට කොහොම දුවන්නද ? මේක තමයි කතන්දරය. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ සමානුපාතික ඡන්ද ක්‍රමය, මනාප ක්‍රමය ඇති හැකි බලපුළුවන්කාරයින්ට ඉඩ දෙන ඡන්ද ක්‍රමයක්. ඒ හින්දා හැබෑ මහජන නියෝජිතයිනගේ හද ගැස්ම නියෝජනය කරන්නේ නෑ. ඒක නිසා ගරු

සභාපතිතුමනි, මේක වෙනස් වියයුතුයි නේද ? ඊටත් වැඩිය අර මම කලින් කිව්වේ අපි නැති බැරි පන්තිය නියෝජනය කළත් අපි කොහොම හරි අඩු වියදමකින් මෙතෙන්ට එන ක්‍රමයක් තියනවා. ඒක තමයි මේ මනාප ක්‍රමයේ තියන දුර්ගුණ, නරක. මොනවාද ඡන්ද කාලෙට අපි ගිහිල්ලා නෑදෑකම් මතුකර ගන්නවා. කුලය කියනවා. ආගම කියනවා. මේවා හදාගෙන තමයි මේ ඡන්ද ක්‍රමයෙන් අපි කොහොම හරි ගොඩ එන්න බලන්නේ. මට ඡන්දය දෙන නෑදැයින්ව මම ගෞරවයෙන් සිහිපත් කරන්න ඕන, දිස්ත්‍රික්කය පුරා ඉන්න. ඒ අයගේ ඡන්දයෙන් අපි මෙතෙන්ට ආවා තමයි. ඔවුන්ට අසාධාරණයක් නෙමෙයි. හැබැයි මේ හැබෑ කතන්දරය කියලා මේක වෙනස් වියයුතුයි ගරු සභාපතිතුමනි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදයේ තියන නරක දුර්ගුණයන් මේ මනාප ක්‍රමය තුළ මතු වෙනවා කියන කාරණාව වගකීමෙන් කියන්න ඕන ගරු සභාපතිතුමනි. ඒ හින්දා මා යෝජනා කරනවා මේ සමානුපාතික ක්‍රමයේ තියන

මේ වැරදි දේවල්, අඩුපාඩු නිවැරදි වෙන්න ඕන. ඒකෙන් අපි කියන්නේ නෑ සමානුපාතික ක්‍රමය සඳහටම නැති කරලා අර තියන සරළ ඡන්ද ක්‍රමයකට යන්න, කේවල ඡන්ද ක්‍රමයකට යන්න කියලා අපි යෝජනා කරන්නේ නෑ. එතනදී කියන්නේ මැතිවරණයේ දි තරඟ කරන ආසනයෙන් බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබන තැනැත්තා ජයග්‍රාහී අපේක්ෂකයා ලෙස නම් කිරීම. ඒක තමයි කේවල් ඡන්ද ක්‍රමය කියලා කියන්නේ. කොට්ඨාශයට තරඟ වදිනවා. එතනදී වැඩිපුර ඡන්ද ගත්ත කෙනා දිනනවා. අනෙක් එක්කෙනා ගෙදර. ඒක ඉතා හොඳ ක්‍රමයක් නෙමෙයි. ඒකෙත් අඩුපාඩු තියනවා. ඒ හින්දා ගරු සභාපතිතුමනි, අර සමානුපාතික ක්‍රමයේ තියන නරක අයින් කරලා වඩා වාසි සහගත ජනතාවගේ හදගැස්ම නියෝජනය කරන විදිහට සරළ බහුතර නියෝජන ක්‍රමය කේවල ක්‍රමයට වඩා බරක් තැබෙන ක්‍රමයක් හැදිය යුතුයි.

එදාට තමයි කලවානට හැබෑ නියෝජනයක් මේ පළාත් සභාවට එන්නේ. එදාට තමයි අර මම කලින් කිව්වා වගේ කොලොන්නේ 140,000 ක් ඡන්ද දායකයෝ. නියෝජිතයෝ 3 යි. ඇහැළියගොඩ 96,000 ට 7 යි. මේක වෙනස් වෙලා ඒ ඒ කොට්ඨාශයට වගකියන මහජන නියෝජිතයෙක් මේ ආයතනවලට එන්නේ. එදාට ඒ ජනතාවට ඒ මහජන නියෝජිතයෝ වගකියයි. ඇත්තම කාරණාව තමයි ගරු සභාපතිතුමනි, ඔබතුමයි මමයි නියෝජනය කරන ඇහැළියගොඩ ආසනයේ අපි හත් දෙනෙක් ඉන්න බව හැබෑව. ඇත්තටම ඇහැළියගොඩ ආසනයේ සංවර්ධනය ගැන හරි කථිකාවතක්, හරි සාකච්ඡාවක්, ජනතාවගේ ප්‍රශ්න සාකච්ඡා වෙනවාද ? නෑ, හේතුව අපි එකිනෙකා බලන්නේ මනාපය ගහගන්න මිසක ජනතාවගේ හැබෑ ප්‍රශ්නය කරට අරගෙන ඒවා විසඳන්න නෙමෙයි. ඒ හින්දා ගරු සභාපතිතුමනි, අවසාන වශයෙනුත් මා

යෝජනා කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය තමයි අද පිළිගන්නා ප්‍රශස්තම පාලන ක්‍රමය. ඒක ක්‍රියාවට නඟන්න තියෙන්නේ මැතිවරණ හරහා තමයි. ඒ මැතිවරණ ක්‍රමය පදනම් කරගන්නේ ජනගහණ හා භූමිය පදනම් කරගත්තු කොට්ඨාශ ක්‍රමයට. මේ තියන කොට්ඨාශ විශාල වැඩියි අපට. ඔරොත්තු දෙන්නෙ නෑ. ඒ හින්දා ජනතාවගේ ප්‍රශ්න විසඳෙන්නේ නෑ. ඒ හින්දා කුඩා කොට්ඨාශ පදනම් කරගෙන ඡන්ද ක්‍රමයක් ආ යුතුයි. මෙතන ඉන්න වැඩිහිටියෝ දන්නවා ඉස්සර තිබුණ ඡන්ද කොට්ඨාශ ක්‍රමය. ඒ ක්‍රමයට අපි යායුතුයි. පළාත් සභා අඩුම ගානේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්වත් එක් කොට්ඨාශයක් විදිහට හැදෙන ක්‍රමයකට කොට්ඨාශ ක්‍රමය සකස් වියයුතුයි. එහෙම කරන ගමන් අර කලින් කිව්වා වගේ දිනන එක්කෙනා විතරක් නෙමෙයි පරාද වෙන එක්කෙනාටත් යම් ඉඩක් ලැබෙන නියෝජනය නොවෙන ජනතාවට ජන

කොට්ඨාශයකට පක්ෂවලට, කණ්ඩායම්වලට ඉඩක් ලැබෙන සමානුපාතික ක්‍රමයේ තියන හොඳ ගුණාංගත් ඒකට එකතු කරන්න ඕන. එහෙම නැත්නම් අපට සී.ඩබ්.සී. එකේ ගරු මන්ත්‍රීතුමා මේ සභාවට එන්නේ නෑ. එතුමාටත් මේකේ ඉඩ තියෙන්න ඕන. එහෙම නැතුව අපි එතුමාව ප්‍රතික්ෂේප කරන්න කියලා කියන්නේ නෑ. එහෙම ක්‍රමයක් සමානුපාතික ක්‍රමයේ හොඳ ගුණාංගත් එකතු කරගත්ත සරළ බහුතර නියෝජන ක්‍රමයක් පළාත් සභා මැතිවරණයේ දී හඳුන්වා දියයුතුයි කියන යෝජනාව මේ ගරු සභාවට ගෙන එමින්, ඇහුම්කන් දීම පිළිබඳව හැම දෙනාටම ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තුතියි ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමනි. මීළඟට ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. ඒවගේම එතුමා යෝජනාව ගෙන එමින් කරන ලද කතාව ඉතාම සාධාරණයි. ඒවගේම ප්‍රායෝගිකයි. තාත්තයි පුතයි ඡන්දය ඉල්ලුවත් ඒදෙන්නා ඇණ කොටා ගන්න ක්‍රමයක් තමයි මේ මනාප ක්‍රමය තුළ ජනිත වෙලා තියෙන්නේ. 78 ව්‍යවස්ථාවේදී හිටපු ජනාධිපති

ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා මැතිවරණ ක්‍රමය සංශෝධනය කළා. හැබැයි ඒ අවස්ථාවේදී එතුමා ගෙනාවේ පක්ෂයේ මහලේකම්වරයා ඉදිරිපත් කරන ලැයිස්තුව ඡන්ද ප්‍රමාණය අනුව අනුපාතයක් හැටියට ලේකම්ගේ නිර්දේශය මත මන්ත්‍රීවරුන් ගැසට් කරන ක්‍රමය . ඒක තමයි පළවෙනි 78 ව්‍යවස්ථාවේ තිබුණ එක. ඊට පස්සේ මැතිවරණ පනතට සංශෝධනයක් ගෙනල්ලා අතිගරු අපේ හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා තමයි මේ මනාප ක්‍රමය අපිට හඳුන්වලා දුන්නේ. අපේ කරුණාපාල මන්ත්‍රීතුමා හිටියා නම් මනාප

ක්‍රමයට පළමුවෙන්ම මැතිවරණයකට මුහුණ දුන්නේ ගරු සභාපතිතුමනි අපි. පළවෙනි පළාත් සභාවේ. ඒ වෙලාවේ මහා ලොකු මනාප ප්‍රමාණයකට යන්න ඒවගේම මැතිවරණයකට මහා ලොකු පෝස්ටර් ව්‍යාපාර කාඩ් ගහන්න එහෙම පුළුවන් ක්‍රමයක් තිබුණේත් නෑ. ඒ ගැන දැනීමක් තිබුණේත් නෑ කොහොමද මේක කරන්නේ කියලා. දහ දාහක් විතර එක ආසනයකින් ප්‍රතික්ෂේප වෙනවා ඡන්ද . මේක පාවිච්චි කරන්න දන්නේ නැති හින්දා. දැනුත් ඒවගේ තියෙනවා. ඒ කාලයේ. මට මතකයි මම මැතිවරණයට ඉදිරිපත් වෙන වෙලාවේ මම ගැහුවේ පෝස්ටර් 250 යි. ඒකත් ඔය කොළ පාටයි. වන් කලර්. 88. කාඩ් ගැහුවේ ගරු සභාපතිතුමනි මේ බිස්ටල් බෝඩ් වලින් කාඩ් එක ගහලා කාඩ් එක දෙනවා දීලා අංකය දෙනවා. දීලා ආපහු ඡන්දය දාපු එක්කෙනාගෙන් කාඩ් එක එකතු කර ගන්නවා එතන ඉඳන් කීප දෙනෙක්. කාඩ් 500 ක් විතර තමයි ගහලා

තියෙන්නේ. බොහොම සුළු වියදමක්. හැබැයි ඊට පස්සේ මමත් ඒ පළාත් සභාවේ ළාබාලම මන්ත්‍රීවරයෙක් හැටියට ඡන්ද නමදාහක් විතර අරගෙන මම පත් වුණා. හැබැයි ඒ ඡන්ද ප්‍රමාණය මම දිස්ත්‍රික්කයේ හය වෙනියා බවට පත් වුණා. ඊට පස්සේ මේ ක්‍රමය හුඟක් වෙනස් වෙන්න පටන් ගත්තා. අද ඡන්දයක් කරන්න බෑ රුපියල් ලක්ෂ හැත්තෑපන්දාහක් විතර වියදම් කරන්න ඕණේ. හැත්තෑපහෙන් එහා මුදලක් වියදම් කළේ නැත්නම ඒ පුද්ගලයාට ඡන්ද විසිපන්දාහක් පහළොස්දාහක් ගන්නවා කියන එක අමාරු කාර්යයක්. මේවගේ වියදමක් අපිම තමයි සකස් කර ගත්තේ. අපි එක්කෙනෙක් අභිබවා ගන්න කරන්න පුළුවන් ක්‍රමවේදය මොකක්ද කියලා බැලුවා. මාධ්‍ය පාවිච්චි කරන්න ප්‍රචාරය පාවිච්චි කරන්න ඒවගේම මිනිස්සුන්ගේ හිත ගන්න යම් යම් දේවල් දෙන්න. පුද්ගලිකව . මට මතකයි මුල් මැතිවරණය වෙලාවේ සාමාන්‍යයෙන් පුරුද්දකට ගිහිල්ලා සමහර තැන් වලට කිලෝමීටරයක් දෙකක් යන්න තියෙනවා නම් එතනට වාහනයක් දීපු එක්කෙනාට තමයි මනාපය පාවිච්චි කරන තත්ත්වයට පත්වෙලා තියෙන්නේ. සමහර ගම් වලට ගියාම අපිට වාහනයක් දෙන කෙනාට තමයි අපි ඡන්දය දෙන්නේ අපිට ප්‍රවාහන පහසුකම් දෙනවා නම් කියලා. ඒ තත්ත්වයට එන්න එන්න පත්වෙන්න පටන් ගත්තා. පහුගිය වකවානුව වෙනකොට වතුර බෝතලයත් තමන්ගේ අංකය ගහලා දෙන්න පටන් ගත්තා. තමන්ගේ පක්ෂයේ පාට,ලාංඡනය ගහන්න පටන් ගත්තා. ලොකු වියදමක් කරන්න ඕණේ. ඒ වියදම අතිවිශාලයි. ඒ පුද්ගලයාගෙන් හරියාකාරව සේවයක් වෙනවද කියන එක ගැන අපිට ලොකු ප්‍රශ්නයක් තියෙනවා . ලක්ෂ සීයක් හමාරක් වියදම් කරලා ආවහම ගණන් හදලා බැලුවහම මොන වගේ පුද්ගලයෙකුටද මේක ලැබෙන්නේ කියලා. ඒ නිසා ඒවගේම මහජන

අපේ තාත්තා මුණ ගැහෙන්න සිංහල අවුරුද්දට හුඟක් දෙනෙක් එනවා. එතුමා ආපුවහම ඥාති මිත්‍රාදීන්ට යම්කිසි තෑගි සැලකිලි කරනවා. ඒ අවුද්දේ ඒක නැවැත්තුවා. මොකද මේ මැතිවරණයට පගාව දෙයි කියන චෝදනාව එයි කියලා. අපි පොඩි ලීප්ෆට් එකක් ගහලා මේස උඩ තිබුණා එන කෙනෙකුට බලන්න. ඒක අතින් දුන්නේ නෑ බයයි. ඒ මුල් කාලයේ. හැබැයි පසුකාලීනව ඒක අපිට සිද්ධ වුණා වෙනස් කරන්න ඇයි ජනතා විමුක්ති පෙරමුණත් ආපු වෙලාවේ ඒ භීෂණයත් එක්ක සහෝදර මන්ත්‍රීවරු කවුරුත් ලැස්ති වුණා ඡන්දය පාවිච්චි කරන්න ඡන්ද පොළට මිනිස්සු ගේන්න මිනිස්සුන්ගේ මතයක් ඇති කරන්න. අන්න එතන තමයි අපි ලොකු වියදමක් කරන්න අපි පුරුදු වෙන්න පටන් ගත්තේ. අපිට සිද්ධ වුණා යම් යම් දේවල් දෙනවා කියලා ගෙන්න ගන්න. ඒක දෙපැත්තේම. එක පැත්තක නෙමෙයි. අපිට පහසුකම් සපයන්න සිද්ධ වුණා. වාහන දෙන්න සිද්ධවුණා. අද ඒක නියෝජිතයෙක් පත් වෙන එකේ අභිලාසය වෙන්නේ ජනතාවට සේවය කරන්න. අපි දෙවෙනි පළාත් සභාවේ ඉන්න කොට ඒක එක්සත් ජාතික පක්ෂයේ බලයේ තිබුණේ. මන්ත්‍රීවරුන්ට තමයි ප්‍රධාන ඇමතිතුමා ලබලා දෙනවා වගේ මුදල් ලබලා දුන්නේ. ඒ කාලයේ අපිට හම්බ වුණේ ලක්ෂ හත හමාරක් වගේ. අර ඔබතුමා කිව්වා වගේ බලංගොඩ ආසනයේ මන්ත්‍රීවරු හය දෙනෙක් හිටියා. එක්සත් ජාතික පක්ෂයෙන් තුන් දෙනයි. අනිත් පක්ෂයෙන් තුන් දෙනයි. ඇහැලියගොඩ ආසනයේ හිටියා පස් මන්ත්‍රීවරු තුන්දෙනෙක්. රත්නපුර ආසනයේ හිටියා ඇමතිවරු දෙන්නෙක් එක්ක මන්ත්‍රීවරු පස් දෙනෙක්. අපි ගණන් හදලා බැලුවහම සැලසුම් එකෙන් කොහොමද මුදල් ලැබිලා තියෙන්නේ කියලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට කියලා දුප්පත්ම කියලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ලැබිලා තිබුණේ රුපියල්

හැත්තෑපන්දාහයි. අයගමට. ඊළඟට කොලොන්නට. ඒවගේ ආසන හුදකලා වුණා. ඒ නිසා අපි ඒ පළාත් සභාවේ තීන්දු කෙරුවා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටම ලක්ෂ විස්සක් යන්න ඕණේ. ඒ විස්ස ඇතුළේ අපි මන්ත්‍රීවරු විදිහට යෝජනා ඉදිරිපත් කරන්න ඕණේ. අනිවාර්යයෙන් ලක්ෂ විස්සක් ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට සංවර්ධනය සඳහා යනවා. මේ ක්‍රමය කරන්න ටිකක් අමාරුයි. මේ ක්‍රමයට මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නේ නැහැ. ඒ නිසා නැවත ආපහු අර පුද්ගලික මන්ත්‍රීවරුන්ට මුදල් අතට පත් වෙන ක්‍රමයක් ආවා. මෙතනදී යම්කිසි ඡන්දදායකයින්ට අසාධාරණයක් වෙනවා. ඒ නිසා මේ සියළු දේ පිළිබඳව සොයලා බලලා අපිට පුළුවන් නම් මහජනයාට උත්තර බඳින්න පුළුවන් මහජනයාට වගකියන්න පුළුවන් මන්ත්‍රීවරයෙක් තමන්ගේ ප්‍රදේශයේ මොන පක්ෂයෙන් හරි බිහි කරන්න අන්න ඒ අවස්ථාව

ලබලා දෙන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා නම් මැතිවරණ ක්‍රමය තුළ ඒ ගැන සොයන්න. අද නොයෙක් විදිහේ කථිකාවතට ලක් වෙලා තියෙනවා. ජර්මන් ක්‍රමය පාවිච්චි කරලා ඒකත් දකුණු අප්‍රිකාවේ ක්‍රමයක්. සංකලනය කර ගත්තු ලංකාවටත් ආවේනික කර ගත්තු මේ පිළිබඳව පුළුවන්ද කියලා අපිට යම්කිසි එක මතයකට එන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

මන්ත්‍රීතුමා අවසන් කරන්න.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
---------------------------------------------------------

එතෙන්දී ඔබතුමා කිව්වා වගේ සුළු ජන කොටස් වලට නියෝජනයක් කොහොමද ලැබෙන්නේ කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා මේ සියළු දේවල් පිළිබඳව කල්පනා කරලා බලලා සුදුසු ක්‍රමයකට කොට්ඨාශ ක්‍රමයකුත් එක්ක තියෙන ක්‍රමයකට එනවා නම් ඒක ඉතාම කාලෝචිතයි කියන එක එතුමාගේ යෝජනාව අනුමත කරමින් අපි කතා කරනවා කියන එක මතක් කරමින් ඔබතුමාට කාලය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තූතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමනි. මීළඟට අජිත් ශාමින්ද මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් ශාමින්ද***
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුමත කරමින් යම් වචන කීපයක් කතා කරන්න බලාපොරොත්තු වුණේ. විශේෂයෙන් අපි දන්නවා මේ වකවානුව

වෙන කොට පළාත්පාලන මැතිවරණය ඒ කියන්නේ ප්‍රාදේශීය සභා ,නගර සභා, මහ නගර සභා මැතිවරණ පැවැත්වීම පිළිබඳව දිවයිනේම රට තුළම දීර්ඝ කථිකාවතක් තියෙනවා කොට්ඨාශ ක්‍රමයට එය සිදු කළ යුතුයි කියලා. ඒ අනුව පසුගිය පාර්ලිමේන්තුවේත් පනතක් ඉදිරිපත් කරලා සම්මත කරලා මේ වෙන කොට සීමා නිර්ණය කිරීමේ අදියරේ තමයි තියෙන්නේ. ඒක නැවතත් පසුගිය ආණ්ඩුවෙ පෙරළියත් එක්ක ඒක නැවතත් සංශෝධන සලකා බැලීමේ අවස්ථාවකුත් මේ අප්‍රේල් මාසය දක්වා දීර්ඝ කරලා තියෙනවා. ඒ වෙන කොට අපිට තේරෙන කරුණක් තමයි ප්‍රාදේශීය සභා මැතිවරණයට දැන් පළාත් සභා මැතිවරණයටත් වඩා අර පුංචිම මන්ත්‍රීතුමා ආවේ එතනින් තමයි. ඉස්සෙල්ලාම ගිහිල්ලා ප්‍රාදේශීය කොට්ඨාශයටම වැඩ කරන්න හම්බ වෙනවා. ඒකට නම් පළාත් සභාවට තරම් කළේ. අපි පැහැදිලිවම දන්නවා පාර්ලිමේන්තු මැතිවරණයත් ආසන ක්‍රමයට සහ මනාප ක්‍රමයේ සම්මිශ්‍රණයක් කේවල ක්‍රමයේ විදිහට තමයි තැබිය යුත්තේ කියන මතය මේ සියළු දෙනාටම තියෙනවා. ඒ දෙකට මැදි වෙච්ච පළාත් සභාවටත් එහෙම නම් මේ තියෙන ක්‍රමයෙන් බැහැරව ගිහිල්ලා කොට්ඨාශ ක්‍රමය එහෙම නැත්නම් එතුමා කිව්වා වගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට මන්ත්‍රීවරයෙක් කොහොම හරි බිහි වෙන විදිහක් අර මනාප ක්‍රමයෙනුත් යම් සුළු පක්ෂ සුළු ජාතීන් ,ස්වාධීන ඒ විදිහට මට්ටම අදහස දරණ ඒ දේශපාලන අයත් ඒ පළාත් සභාවට එන්න පුළුවන් විදිහේ ක්‍රමයක් ඇතුළත් කරලා ඇතුළත් විය යුතුයි කියන මතයේ තමයි මේ යෝජනාව සාකච්ඡා වෙන්නේ. ඇත්තෙන්ම අපිට ප්‍රායෝගිකව පේනවා මේකේ වාසි සහ අවාසි. වැඩියෙන් බලන කොට අවාසි තමයි වැඩි

සල්ලි හම්බ වෙන්නේ නෑ. ගරු සභාපතිතුමනි ලක්ෂයකින් දෙකකින් කොහොම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක වැඩ කරන්නේ කියන එක පිළිබඳව ප්‍රශ්නයකට මුහුණ දීලා ලොකු ප්‍රායෝගික ගැටළුවක්. ඒ අනුව විවිධ අදහස් මත ඒක කොට්ඨාශ ක්‍රමයට එන්න සහ සමානුපාතික ක්‍රමයේ සම්මිශ්‍රණයක් විදිහට තමයි ඒකත් යෝජනා කරලා තියෙන්නේ. ඒ අනුව ඒ කථිකාවත තියෙන්නේ. ඒකෙත් අවසාන තීන්දුවක් නෑ. අපි දන්නේ නෑ මැතිවරණය එන කොට මේ ක්‍රමය තියෙයිද සමානුපාතික ක්‍රමය එයිද කියන එක පිළිබඳව අපිට සැකයක් හා පැහැදිලිතාවයක් නෑ. ඒ අනුව ප්‍රාදේශීය සභාවලට පළාත් පාලන ආයතන වලට ඒ විදිහට ඡන්දය තියෙනවා නම් ප්‍රාදේශීය සභාවට සහ පළාත් සභාවටත් ඒ අනුව සමානුපාතිකව යම් ක්‍රමයක් අනුගමනය කළ යුතුයි කියන අදහස අනුව තමයි මං හිතන්නේ සලිත මන්ත්‍රීතුමා ඒ ප්‍රායෝගික තත්ත්වයත් පැහැදිලි කරලා මේ යෝජනාව ඉදිරිපත් වෙන්නේ. දුප්පත් කෙනෙකුට මේ ක්‍රමයට අපේ අජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ ලක්ෂ හැත්තෑපහක් වියදම් කරන්න බෑ. ලක්ෂ හැත්තෑපහක් වියදම් කරලා ඇවිත් වැඩකුත් නෑ. ඒ අනුව බලන කොට ගමේ ජනතාවට සේවයක් කරන්න නම් අපිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට පළාත් සභා මන්ත්‍රී කෙනෙක් බිහි වෙන ක්‍රමයක් ඇති වුණොත් ජනාවගේ පැත්තෙන් සුභදායි කියන මතය අපිට පිළිගන්න වෙනවා. ඒ ක්‍රමය විතරක් නෙමෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට අනිවාර්යයෙන් මන්ත්‍රීවරයෙක් බිහි වෙනවාත් සමඟ සුළු පක්ෂ සුළු ජාතීන් සහ ස්වාධීන අයටත් එන්න පුළුවන් විදිහට ඒ සම්මිශ්‍රණයක් තමයි අපි මේ මැතිවරණ සංශෝධනයත් එක්ක බලාපොරොත්තු වෙන්නේ.

ඒ නිසා මේ පළාත් සභාව විදිහට මේ මැතිවරණ ක්‍රමය ගැන අපිට මේ පාර්ලිමේන්තුවේ විවාද වෙන කොට

ප්‍රාදේශීය සභාවල කථිකාවත් තිබුණහම මැතිවරණ තියෙන සමයක පළාත් සභාවේ අපි නිහඬව ඉන්නේ නැතුව මේ ගැන අපේ අදහස් ඉදිරිපත් කරන්න මේ යෝජනාව ඉදිරිපත්වීම පිළිබඳව අපේ සලිත මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

ඒ නිසා මම දිගින් දිගටම අදහස් දක්වන්න කතා කරන්න බලාපොරොත්තුවක් නෑ. මගෙත් මතය වෙන්නේ ප්‍රාදේශීය සභාව කොට්ඨාශ ක්‍රමයට සහ ඒ මනාප ක්‍රමයේ සම්මිශ්‍රණයක් එන කොට ඒ හා සමානව පාර්ලිමේන්තුවේත් ඊට ආසන්නව එක් මන්ත්‍රීවරයෙක් හා අනිකුත් සුළු ජාතීන් හා පක්ෂ නියෝජනයට යම් තැනක් එන ක්‍රමයක එන කොට පළාත් සභාවටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට එක්

කෙනෙක් හා අනිකුත් සුළු ජාතීන් හා සුළු පක්ෂ නියෝජිතයෙක් එක් වෙන්න මන්ත්‍රීවරුන් බිහි වෙන්න ක්‍රමයක් මේ අතරින් තෝරා බේරා ගෙන හොඳම ක්‍රමය සකස් විය යුතුයි කියන මතයේ තමයි මාත් ඉන්නේ.

ඒ නිසා මේ පිළිබඳව අදාල ස්ථාන වලට අදාල බලධාරීන්ට ගරු පාර්ලිමේන්තුවට අපේ අදහස් යෝජනා කරලා යැවීම ගරු සභාපතිතුමනි වැදගත් වෙනවා. ඒ නිසා සලිත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතා වැදගත් අපේ ආයතනයටත් බලපාන්නේ මේක බලපානේ කෙසේද කියන විග්‍රහය අපි කළ යුතුයි. ඒ නිසා එතුමාගේ යෝජනාව අනුමත කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

ස්තුතියි ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමනි. මීළඟට යෙහෙයියා එම්. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

----------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව කාලීන ඒවගේම වැදගත් ප්‍රදේශයේ විශේෂයෙන් මහජන

නියෝජිතයින්ට පළාත තුළ ජීවත් වෙන ජනතාවට වැදගත් මාතෘකාවක් යටතේ ගෙන එන ලද යෝජනාවක් කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්. මෙම යෝජනාව ස්ථිර කරමින් මේ යෝජනාව සභාවේ සාකච්ඡා කරන මොහොත ඉතාමත් වැදගත් මොහොතක්. වැදගත් කාල වකවානුවක් තුළ තමයි මේ යෝජනාව මේ පළාත් සභාවට මේ මොහොතේ ගෙනල්ලා තියෙන්නේ. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් කථිකාවතක් නිර්මාණය වෙලා තියෙන මොහොතක මහජන අදහස් මේ වනවිට ලබා ගනිමින් තිබෙන මොහොතක මෙවැනි මාතෘකාවක් තුළින් ජනතාව දැනුවත් කරමින් මේ අදහස මේ සභාවේ සියල්ල ඒකරාශී කරගෙන ගරු සභාපතිතුමා ඔබතුමාගේ යෝජනාවක් වශයෙන් ලබන 27 වෙනිදා 29 වෙනිදා පෙබරවාරි මාසයේ දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් යෝජනා ලබාගැනීමේ කමිටුව රැස් වෙනවා ගරු සභාපතිතුමනි. මෙම කමිටුවට සලිත කරුණාරත්න ගරු

මන්ත්‍රීතුමාගේ අදහස වැදගත්. මේ සියළු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ඊටත් වඩා වැදගත් වෙනවා. අපි එක පැත්තකින් තවත් කෝණයකින් බලන කොට තවත් විශාල අදහස් රාශියක් මේ තුළ ගැබ් වෙනවා. අනිත් එක තමයි මේක තමයි හොඳම කාල වකවානුව මේ මාතෘකාව සම්බන්ධයෙන් කතා කරන්න. මොකද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් අළුතින් නිර්මාණය වෙන කොට මහජන අදහස් ලබා ගන්න කොට ඒ මහජන අදහස් වලට මේ වන කොට විවිධ අදහස් මේ වන කොට දක්වනවා. මම ඔබතුමාගේ තනතුර ගත්තත් ගරු සභාපතිතුමනි මේ පළාත් සභාව ගත්තහම සභාපතිවරයා කිව්වහම ප්‍රාදේශීය සභාවල සභාපතිවරුත් ඉන්නවා. ඔබතුමාගේ තනතුර සන්සන්ධනාත්මකව පළාත් සභාව ගත්තහම ඔබතුමා නියෝජනය කරන්නේ පුංචි පාර්ලිමේන්තුව. අපි අදහස් කරනවා

හොඳට අධ්‍යයනය කළා. මේකේ වැඩිම අවාසිය වෙන්නේ මං වගේ මිනිහෙකුට. ඇත්තම කතා කළොත් ගරු සභාපතිතුමනි මේකේ වැඩිම අවාසිය නිර්මාණය වෙන්නේ සාමාන්‍යයෙන් පළාත් සභා ඡන්දයකට ඉදිරිපත් වුණොත් කිසිම කරදරයක් නැතුව දිනන්න පුළුවන් විදිහක් තමයි මේ තියෙන මැතිවරණය. නමුත් ඊළඟට එන මැතිවරණය ප්‍රශ්නාර්ථයක් වෙන්න පුළුවන්. ඒත් මම එකඟයි. වෙන හේතුවක් නිසා නෙමෙයි අද අපි මැතිවරණ ක්‍රමය පෞද්ගලිකව තමන් ගැන නෙමෙයි හිතන්න ඕනේ. සමස්ත ප්‍රජාව ගැන ඒ එක්කම මම දැක්කා එතුමා ඉදිරිපත් කරන විට අදහස් කීපයක්. සංඛ්‍යා ලේඛණ රාශියක්. මේක තමයි වෙන්න ඕණේ. ඒ එක්කම අපි කතා කළහම සමහර අවස්ථා වලදී අපි සංවර්ධනයේ මොන තරම් කතා කළත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන්

ඊට වඩා ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා පාර්ලිමේන්තුවේ කථානායකවරයා වෙන කොට සබරගමුවේ ඔබතුමා අපි මේ මොහොතේ ආමන්ත්‍රණය කරන සභාපතිවරයා අපි ආමන්ත්‍රණය කරන්න බලාපොරොත්තු වෙන්නේ පළාත් කථානායකවරයා කියන සමාන වචනයකට. එහෙම නැතුව අපි සන්සන්දනාත්මකව අදහස් කරන වචනයකට අපි පළාත් සභා ක්‍රමය පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෙ. මොකද අද කවුරු හරි සභාපතිවරයෙක් ගිහිල්ලා යමක් කළහම නැත්නම් නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් කළහම අපේ පළාත් සභාවේ තියන ගරුත්වය ගෞරවාන්විත තත්ත්වය හැල්ලුවට ලක් වෙලා තියෙනවා. මොකද ඔබතුමා පළාත් සභා මන්ත්‍රීවරුන්ට වඩා සභාපතිවරයෙක් වශයෙන් මේ තනතුර හැල්ලුවට ලක් වෙන අවස්ථා අපි දැකලා තියෙනවා. ඒකත් අපි මේ මොහොතේ මේ අවස්ථාවේදී මේ පළාත් සභා තනතුරු පිළිබඳවත් සාකච්ඡා කළ යුතු වකවානුවක්. ඒ එක්කම මම මේ ගැන

ගලා යන්නේ නෑ. යම් නියෝජිතයෙක්, යම් පුද්ගලයෙක් යම්කිසි විදිහට නියෝජනයක් තියෙනවා නම් ඔහුට යම් මුදලක් වෙන් වෙනවා නම් අද අපි අගය කරනවා සමහර තැන්වලදී. වර්තමාන ආණ්ඩුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම සේවක වසමකට මුදල් වෙන් කරනවා. ඒ තත්ත්වයට අපි යායුතුයි. සමහර ග්‍රාම සේවක වසමක කිසිම මුදලක් ලැබෙන්නේ නෑ. කිසිම සංවර්ධන ක්‍රියාවලියක් සිද්ධ වෙන්නේ නෑ. ඒ ප්‍රදේශයේ ජනතාව බදු ගෙවන ජනතාව තමන් නියෝජනය කරන ප්‍රදේශයේ තමන් හැල්ලුවට ලක් වෙනවා. අපි අගය කරනවා. මේ වෙන කොට ලක්ෂ 15 ක් ලැබෙනවා ග්‍රාම සේවක වසමකට. එතකොට ඒ සියල්ල තෝරා ගන්නේ ග්‍රාම සේවා වසමේ ඒ ග්‍රාම රාජ්‍ය නිර්මාණය වෙනවා. ඒ තුළින් තමන්ට අවශ්‍ය සියළු දේ හඳුනාගෙන කටයුතු කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මේකේ සීමා නිර්ණයන් පිළිබඳවත් අපි සඳහන් කරන්න ඕනේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගත්තහමත් සමහර ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශ ලොකු අර්බුදයකට මුහුණ දෙනවා අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා කියපු දේ. මම එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක මම එක ප්‍රාදේශීය සභාවක් කියන්නම්. ඔබතුමා නියෝජනය කරපු කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ ප්‍රාදේශීය සභාව ඒකේ වටප්‍රමාණය වැඩියි. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය. යම්කිසි ක්‍රියාවක් කරන්න ගියහම අපේ අතුල කුමාර මන්ත්‍රීතුමාට මතක ඇති ගුරුබැවිල ගම ඉඳලා මේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අත්සන් කර ගන්න එන්න ඕණේ. ග්‍රාම සේවක සහතිකයක් අත්සන් කර ගන්න ගුරුබැවිල කියන ගමේ ඉඳලා රත්නපුර නව නගරයට එන්න ඕනෙ. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමන්ගේ රැකියාවට යන්න හරි අඩුම ගානේ දරුවා ඉස්කෝලයට දාගන්න ග්‍රාම සේවක

කළොත් තමයි එතුමා බලාපොරෝත්තු වෙන කොට්ඨාශ ක්‍රමය මිශ්‍ර ක්‍රමය ඇති වෙන්නේ. මේ මොන ක්‍රමය හැඳුවත් කමක් නෑ මම ඉල්ලීමක් කරනවා පක්ෂ විපක්ෂ කවුරු කළත් සෑම ජන කොටසකගේම අදහස් මේ සඳහා ඇතුළත් වන සේ නියෝජනයක් අපි ලබා ගන්න ඕණේ. සමහරවිට විවිධ පක්ෂ වෙන්න පුළුවන් විවිධ ජාතීන් වෙන්න පුළුවන් ඔවුන්ගේ අදහස් මේ තුළට ගලා එන්න ඕණේ. ඒ නියෝජනය වෙන විදිහට කටයුතු කළොත් විතරයි රටක් තුළ පළාතක් තුළ එහෙමත් නැත්නම් රාජ්‍යක් තුළ සියළු දෙනාට සමගියෙන් එකමුතුවෙන් අදහස් ප්‍රකාශ කිරිමේ අවස්ථාව උදා වෙන අතර ඒ අයට අවශ්‍ය කරන සංවර්ධන කටයුතු සඳහා එහෙම නැත්නම් වෙනත් ප්‍රශ්න සඳහා ඔවුන්ට මැදිහත් වෙන්න අවස්ථාව උදා වෙන බව ප්‍රකාශ කරමින් තමුන්නාන්සේ

සහතිකයක් ගන්න ගියහම රත්නපුරට එන්න ඕනෙ. මේවගේ විශාල අඩුපාඩු රාශියක් අපි දකිනවා. මොකද මේක ඕන කෙනෙකුට උඩ ඉඳලා කියන්න පුළුවන් ප්‍රායෝගිකව ගත්තහම ප්‍රායෝගිකව ගැටළු රාශියක් මතු වෙනවා. මම ඒකයි කිව්වේ ගරු සභාපතිතුමනි ඔබතුමා මේකට මැදිහත් වෙන්න ඕනෙ. ඔබතුමා හරහා මේක 27 වෙනිදා 29 වෙනිදා යන දවස් දෙකේ සබරගමු පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් ඔබතුමා මේ යෝජනාව අපිටත් ඕනේ නම් ඔබතුමා ආරාධනා කරලා ඔබතුමා සහභාගි වෙලා අදහස් ප්‍රකාශ කරන්න අපේ අමාත්‍ය මණ්ඩලය මේ මොහොතේ නොසිටියත් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ හැමෝටම මේකට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. වාසනාවකට මේක රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මේක පවත්වන්නේ. මේ අදහස් වලින් ප්‍රකාශ කරන්න ඕණේ අපි මේක මෙතන කතා කරනවා මේක ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙන විදිහට ඒකට අවශ්‍ය කරන වටපිටාව අපි සකස් කළ යුතුයි. එහෙම

මට අවස්ථාව සලසාදීම පිළිබඳව අනේක වාරයක් ස්තුතිවන්ත වෙමින් තමුන්නාන්සේගෙන් මම ඉල්ලීමක් කරනවා 27 වෙනිදා 29 වෙනිදා මේ මේ කරන සාකච්ඡාවේ සියළු දේ ඒකාබද්ධ කරමින් මේකේ හොඳ අදහසක් ඉදිරිපත් කරන්න මේක තුළින් අපි බලාපොරොත්තු වෙන ඒ අවශ්‍යතාවය ඉටු කිරීමට හැකියාව,ශක්තිය,ධෛරය ,වාසනාව ලැබේයා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. ඔබතුමා කියන ඔය යෝජනාව පිළිබඳව මාව තවම නිළ වශයෙන් දැනුවත් කිරීමක් කරලා නැහැ. කැඳවීමක් ඒ සම්බන්ධයෙන්.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
-----------------------------------------

ඒ වෙන කොට මාධ්‍ය හරහා දිගින් දිගටම 27 වෙනිදා, 29 වෙනිදා රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් එකේ අපි දැනුවත් වෙලා හරි කළ යුතුයි. මම හොඳටම දන්නවා 27 වෙනිදා 29 වෙනිදා තියෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

නිළ වශයෙන් මට දැනුවත් කිරීමක් කරලා නෑ. අපි ඒ අනුව කටයුතු කරමු. මීළඟට ගරු ප්‍රභාත් මහේෂ් ද අල්විස් ගරු මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස් ගරු මන්ත්‍රීතුමා

***ගරු මන්ත්‍රී** ප්‍රභාත් මහේෂ් ද අල්විස්*
***கௌரவ உறுப்பினர் பிரபாத் மஹேஷ த அல்விஸ்***
*Hon.Member Prabath Mahesha de Alwis*
-----------------------------------------

ගරු සභාපතිතුමනි අද සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ගෙනාවේ ඉතාමත් කාලෝචිත යෝජනාවක්. අපි දන්නවා විශේෂයෙන්ම මේ මැතිවරණයට ඉදිරිපත් වුණහම කවුරුත් ඉන්නේ මැතිවරණයට ඉදිරිපත් වෙලා මේ ගරු සභාවට තේරී පත් වෙච්ච නියෝජිතයින්. මැතිවරණයට ඉදිරිපත්වීම තුළ අපිට මුහුණදීමට සිදු වෙන ප්‍රායෝගික ගැටළු අපි සියළු දෙනාම හොඳින් අවබෝධ කරගෙන තියෙන්නේ. ඒ නිසා ඒ ගැන දීර්ඝව කතා කළ යුතු වෙන්නේ නෑ. විශාල ප්‍රදේශයක් නියෝජනය කරන්න ඕනෙ. විශාල ප්‍රදේශයක මනාප ලබා ගන්න විවිධ පොරොන්දු බලාපොරොත්තු ජනතාව තුළ ඇති කරන්න ඕනෙ. විවිධ පොරොන්දු දෙන්නට ඕනෙ. ඒවගේම විශාල මනාප තරඟයක් ඇති කරලා ඒ තුළ අර සලිත මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ බොහොම සහෝදරත්වයෙන් ආශ්‍රය කරන අය මහ බරපතල අනතුරු බවට පත් වෙනවා මේ මැතිවරණ කාල පරිච්ඡේදයක් තුළ. ඒ තත්ත්වය තුළ මේ මැතිවරණ ක්‍රමයේ තියෙන අභාග්‍යසම්පන්න බව තුළින් මේ සමාජයට සේවය කරන්නට හැකි හරි අවස්ථාව අපිට ලැබෙනවාද නැද්ද කියන එක තමයි අපිට ප්‍රධාන ගැටළුව වෙන්නේ. විශේෂයෙන් දැන් මැතිවරණයක් තුළ අපි දන්නවා ලැබෙන සීමිත ප්‍රතිපාදන වලින් එහෙම නැත්නම් තමන්ගේ පුද්ගලික ධනය පාවිච්චි කරලා මනාප ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් විවිධ වාසි විවිධ ලාභ ලබා දෙන්නට සිදු වෙනවා. මේකනේ ප්‍රායෝගික තත්ත්වය. එහෙම නැත්නම් පුටු ටිකක් ගෙනියන්න වෙනවා. හට් එකක් දෙන්න වෙනවා. මොනවා හරි මේවගේ පුද්ගලික පරිත්‍යාගයන් මත පදනම් වෙච්ච මැතිවරණ ක්‍රමයකට අපිට යන්න වෙනවා. ඡන්ද කාලයට අපි කවුරුත් කාටත් කරන්න වෙනවා. නමුත් එතකොට නියම ප්‍රතිපත්ති සම්පාදකයාද ප්‍රතිපත්ති සම්පාදනය කරන්න සුදුසු මන්ත්‍රී කණ්ඩායමද නියම වශයෙන් මේ ගරු සභාවට තෝරා පත් කර ගන්නේ. ජනතාවගේ පැත්තෙන් ජනතාව නියෝජනය කරන්න පුළුවන් ඒ සෑම ප්‍රදේශයක්ම නියෝජනය වෙන විදිහේ නිවැරදි කණ්ඩායමක් මේ පළාත් සභාවට තේරී පත් වෙනවද කියන එක තමයි

එතනදි ඇති වෙන ප්‍රශ්නාර්ථය. ඉතිං මේ ක්‍රමයේදී වෙනස් විය යුතු තැන් සලිත මන්ත්‍රීතුමා හොඳට පැහැදිලි කළා විශාල ධනස්කන්ධයක් ඕනෙ මේ මැතිවරණයක් කරන්න. මේ සභාවෙ කවුරුත් මන්ත්‍රීවරු පැහැදිලි කළා. විශාල ධනස්කන්ධයක් මත පදනම් වෙලා තමයි මේ මැතිවරණය කරන්න වෙන්නේ. එතකොට ඒ අතරම තවත් පසුබිම් තමන්ගේ පසුබිම පාවිච්චි කරලා වෙනස් වාසිසහගත තත්ත්වයන් ඇති කර ගන්න මේ මැතිවරණයේදී අපේක්ෂකයන්ට සිදු වෙනවා. නිරායාසයෙන් ඒ තත්ත්වයට යන්න වෙනවා. මේ තත්ත්වය වෙනස් විය යුත්තේ සභාවට එන මන්ත්‍රීවරු සෑම ප්‍රදේශයක්ම සාධාරණව සමානුපාතිකව නියෝජනය කරන්නේ නෑ. මන්ත්‍රීතුමා පැහැදිලි කළා දැන් කලවාන ආසනයට මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේ නැහැ.

එතකොට වෙන්කරන විමධ්‍යගත මුදල් එහෙම නැත්නම් මේ සභාවේ කතා කරන යෝජනාවල්වලදී ඒ ප්‍රදේශ වලට සංවර්ධන නිසියාකාරයෙන් ගලා නොයන තත්ත්වයක් නිරායාසයෙන්ම ඇති වෙනවා. ඒ තත්ත්වය තුළ නියම සමානුපාතික ක්‍රමය වචනයෙන් පරිසමාර්ථයෙන් ඉටු වෙන්නේ නැති තත්ත්වයක් උදා වෙලා තියෙනවා. නමුත් අපි කියන්නට ඕන කාරණාවක් මේකෙදී මේ සියළු ජාතීන් නියෝජනය කරමින් සියළු ජන කොට්ඨාශ නියෝජනය කරමින් ජනවරම සෑම ප්‍රදේශයකටම සෑම දිස්ත්‍රික්කයකම ජනතාවගේ කැමැත්ත අනුව මන්ත්‍රී කණ්ඩායමක් තේරී පත් වෙනවා. සී.ඩබ්.සී පක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රීතුමන්ලාට මේ කිච්චා වගේ කරමින් එන්න අවස්ථාව ලැබුණා. ඒක හොඳයි. සියළු ජන කොට්ඨාශ මේ සභාවක් තුළ නියෝජනය විය යුතුයි. ඒ නිසා තමයි ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා කරන්නේ සමානුපාතික ක්‍රමය තුළ සාධණීය ගුණයන් එක් කර ගත් නව ඡන්ද ක්‍රමයක් පළාත් සභා මැතිවරණය සඳහා හඳුන්වාදිය යුතුයි කියලා. මේ සාධණීය ගුණයන් මොනවද මේ සාධණීය ගුණයන් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කරලා මේ සාධණීය ගුණයන් එකතු කර ගත්ත සියළු ජන කොට්ඨාශ වලට මේ ගරු සභාව නියෝජනය කරන්න පුළුවන් විදියේ ජනතාවගේ කැමැත්ත නියෝජනය වෙන විදිහේ ඒවගේම සෑම ප්‍රදේශයකටම සාධාරණයක් වෙන විදිහේ මැතිවරණ ක්‍රමයක් සකස් විය යුතුව තිබෙනවා. මේකෙදි විශේෂයෙන් අපි දන්නවා මේ දිනවල පළාත් පාලන මැතිවරණ ක්‍රමය පිළිබඳ කොට්ඨාශ ක්‍රමයේ මැතිවරණයක් ඇති කරන්නට දැන් සාකච්ඡා වෙමින් පවතිනවා. ඒවගේම ඒ පිළිබඳව නීති සම්පාදනය කරලා තියෙනවා. පළාත් පාලන ක්‍රමය පාර්ලිමේන්තුව ඒ ගමන් මඟට යන කොට පළාත් සභාවත් ඒ මඟට ඇතුළත් විය යුතුව තිබෙන බව

විශේෂයෙන් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් හැටියට අපි සිහිපත් කරමින් ඒ තුළින් වඩාත් සාධාරණ සමාජයත් ඉටු කර ගන්නට අපේ ඡන්දදායකයන් වෙනුවෙන් වඩාත් සාධාරණයක් කරන්නට හැකියාව ලැබෙයි කියලා අපි ප්‍රාර්ථනා කරනවා. අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ යෝජනාව අනුමත කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

--------------------------------------------------------

ස්තූතියි ගරු ප්‍රභාත් මහේෂ් ද අල්විස් මන්ත්‍රීතුමනි. දැන් වේලාව මධ්‍යහ්න 12.30 යි. මෙම ගරු සභාව දිවා ආහාරය සඳහා මධ්‍යහ්න 12.50 දක්වා කල් තබනවා.

**දිවා ආහාරයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදී.**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

සියළු දෙනාටම නැවතත් සභාවෙ කටයුතු ආරම්භ කිරීම සඳහා ගරු නිමල් විජේනායක මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

***ගරු මන්ත්‍රී** නිමල් විජේනායක*
***கௌரவ உறுப்பினர் நிமல் விஜேநாயக***
*Hon.Member Nimal Wijenayaka*
-----------------------------------------

ගරු සභාපතිතුමනි අපේ හිතවත් සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා අපි කාගේත් මුවින් ප්‍රකාශ වෙච්චි පරිදි ඉතාමත් කාලෝචිත යෝජනාවක් ගෙනාවා. එතුමා කරපු බොහොම සාධාරණ කරුණු කාරණා ඉදිරිපත් කරලා සියළුම කාරණා වලට අපි එකඟයි. අපි කණ්ඩායම් රැස්වීමේදීත් අපි උදේ හමු වෙච්ච වෙලාවේදීත් අපි කිව්වා ඒ යෝජනාවට අපි සියළු දෙනා එකඟතාවය පළ කළා. අපි ඇත්තටම අපේ ඉෆ්ලාර් මන්ත්‍රීතුමා ,අජිත් ශාමින්ද මන්ත්‍රීතුමා මේ ගැන කතා කරද්දී කිව්වේ මේකේ වැදගත්කම. ඇත්තටම මේ වකවානුව තුළ කවුරුත් අපේ ප්‍රභාත් මන්ත්‍රීතුමා කිව්වේ මේකේ වැදගත්කම. මේ වකවානුව තුළ ප්‍රභාත් මන්ත්‍රීතුමාත් කිව්වේ අපි කවුරුත් කතා කරන්නේ පළාත් පාලන කොට්ඨාශ මැතිවරණ ක්‍රමය ගැන. ඒවගේම පහුගිය ජනවාරි මාසයේ 8 වෙනිදා අළුත් වෙනසත් එක්ක දේශපාලන වෙනසත් එක්ක මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමා ජනාධිපති වෙච්ච අවස්ථාවේදීත් දින 100 රජය තිබුණොත් මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න උත්සාහයක් දැරුවා. මේ අවස්ථාවේදීත් අපිට විසිවෙනි ආණ්ඩු ක්‍රමව්‍යවස්ථා සංශෝධනයේදීත් ගෙනල්ලා ඒක ක්‍රියාවට නන්වන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මම දකින එක හේතුවක් තමයි ප්‍රධාන පක්ෂවල දෙපැත්තේම මුල් පුටුවල ඉන්න දේශපාලඥයෝ මාධ්‍යට මේක කතා කළාට මේක ගේන්න ඕනේ කියලා කිව්වට මං හිතන්නේ හිත යටින් ඒගොල්ලෝ කැමති නෑ මේක ගේන්න. ඒක නිසා මං කාලෝචිත යෝජනාවක් හැටියට මම දකින්නේ අද මේ ජාතික ආණ්ඩු සංකල්පයත් එක්කලා මේක ගේන්න සුදුසුම කාලවකවානුව හැටියට මම දකිනවා. දෙපැත්තේම ශ්‍රීලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය වගේම. ප්‍රධාන පක්ෂ දෙකේ දේශපාලන අධිකාරිය යම්කිසි එකඟතාවයට ඇවිල්ලා තියෙනවා මේ අවුරුදු දෙකක් තුළ මේ රට පාලනය කරන්න අන්‍යෝන්‍ය සහයෝගය ඇතුව වැඩ කටයුතු කරන්න. මොන යෝජනා ගෙනාවත් ව්‍යවස්ථා සංශෝධන හැටියට ගෙනාවත් ,අලුත්ම ව්‍යවස්ථාවක් ගෙනාවත් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක අනුමැතිය නොලැබෙන්නට අපිට මේක අපිට ක්‍රියාවට නන්වන්නට බෑ ගරු සභාපතිතුමනි.

ඒ නිසා අද මේ සකස් වෙලා තියෙන දේශපාලන වපසරිය තුළ මං හිතන්නේ මේක තමයි හොඳම අවස්ථාව අපිට මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම පිළිබඳ යෝජනාව. ඇත්තටම කතා කරන්නේ මධ්‍යම රජය. ඒවගේම පළාත් පාලන මැතිවරණය ගැන. නමුත් පළාත් සභා මැතිවරණයේ වෙනස්වීම ගැන කතාබහ වෙනවා අඩුයි. ඒකත් ඉතාමත් වැදගත්. සලිත මන්තීතුමා ඒ ගැන මේ

ගෙනාපු යෝජනාව මේ වකවානුව තුළ රත්නපුරයට මේ උපදේශක සභාව මෙහේට එනකන් අවශ්‍ය නෑ. දැන් කොළඹ ඒ උපදෙස් ගන්න ඒ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට යෝජනා අදහස් මේ දවස්වල භාර ගන්නවා. ඒ නිසා මම යෝජනා කරනවා මේ ගෙනාපු යෝජනාව ඉතාමත් වැදගත් යෝජනාවක්. පළාත් සභා මන්ත්‍රීවරුන්ට අපිටත් වැදගත්. මේ වික්ෂිප්තභාවයක් තියෙනවා මේ ඡන්ද කොහොම වෙයිද කියලා. කොට්ඨාශයක් අපිට හම්බ වෙනවා නම් මුළු දිස්ත්‍රික්කය පුරාම මැතිවරණ ව්‍යාපාරය දියත් කරලා වැඩක් නෑ. ඒ නිසා කඩිනමින් මේක යෝජනාවක් හැටියට ඉතාමත් කාලෝචිත වැදගත් යෝජනාව ඒ ව්‍යවස්ථා කාරක සභාවට යෝජනා කරලා

යෝජනාවක් හැටියට අපි ඒකච්ඡන්දයෙන් සම්මත කරලා මේ හඬක් නැඟීම මේ තුළින් අපිට අවස්ථාවක් ලැබෙනවා ඒ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට මේක එක පරිච්ඡේදයක් හැටියට එක වගන්තියක් හැටියට ඇතුළත් කරලා පළාත් සභා වලටත් මේ ඡන්ද ක්‍රමය මේ පළාත් සභාවට අදාල වන පරිදි ආසන මට්ටමින් ගෙනල්ලා ඉතාමත් වැදගත් විදිහට අපි කවුරුත් දන්නවා මේක හංගන්න ඕනෙ නෑ . මේක ගෙනාවේ 78 ආණ්ඩුවේ අපේ මේ රටේ බහුතර ජනතාව නියෝජනය නොකරන විරුද්ධ පක්ෂය අමිර්තලිංගම් ප්‍රධාන පක්ෂයයි එදා විපක්ෂයට ගියා. ලෝකය බැලුවා වැරදි විදිහට. ලෝකය බැලුවේ විපක්ෂය කියන්නේ මේ රටේ වැඩිම ජන කොටසක් නියෝජනය කරන විපක්ෂයක් හැටියට. ඒක නෙමෙයි ඇත්ත. ශ්‍රීලංකා නිදහස් පක්ෂය වැඩි ජන කොටසක් එදා නියෝජනය කළා. නමුත් පාර්ලිමේන්තුව නියෝජනයක් තිබුණා. හිස් ගෙඩි ගණන තිබුණේ නෑ. ඒකයි එදා අපිට අවස්ථාවක් නොතිබුණේ. ඒ නිසා ඉතාමත් වැදගත් වූ මේ යෝජනාව ඒ අඩුපාඩු හදාගෙන එදා හිතුවේ නෑ එක්සත් ජාතික පක්ෂයේ අපේ ජනාධිපතිතුමා ව්‍යවස්ථා කමිටුව මේ අඩුපාඩු ගැන. අද නොයෙකුත් අඩුපාඩු නිර්මාණය වෙලා තිබුණා . ඒ නිසා ඒවා නිවැරදි කරගෙන සාධාරණ වූ හැමෝටම බලපාන වැදගත් වන මේ මැතිවරණ ක්‍රමය අළුත් ව්‍යවස්ථාවේ එක පරිච්ඡේදයක් හැටියට ඇතුළත් කරන්න යෝජනා කරමුයි කියන ඉල්ලීම කරමින් අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

ස්තූතියි ගරු නිමල් විජේනායක මන්ත්‍රීතුමනි. මීළගට පරාක්‍රම අතාවුද ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී*** *පරාක්‍රම අතාවුද*
***கௌரவ உறுப்பினர் பராக்கரம அதாவுத***
*Hon.Member Parakrama Athawuda*

----------------------------------------

අපේ ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා කාලීන යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. මං හිතන්නේ මේක 1978 එවකට හිටපු ජනාධිපති ජේආර්.ජයවර්ධන උතුමාණන් විසින් මේ රට විශාල පරිවර්තනයක් කරන වෙලාවක ආපු එකක කොටසක්. විකෘති කොටසක් හැටියට මට පෙනී යනවා. එවකට විපක්ෂයේ හිටපු ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ නායිකාව හැටියට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ඇතුළු

විපක්ෂයේ සියළු දෙනාම මේකේ ගුණ අගුණ කතා කරලා කියලා පෙන්නලා දුන්නා.

එවකට ලංකා සමසමාජ පක්ෂය කොමිනිස්ට් පක්ෂය ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා ආචාර්ය එන්.එම්.පෙරේරා වගේ මැතිතුමන්ලාගේ අදහස් උදහස් විශාල වශයෙන් පෙන්වලා දුන්නා. මේ ක්‍රමය මේ රටට උචිත ක්‍රමයක් නොවන බව. ඒ අනුව එදා සිට අද දක්වා ඒ ක්‍රමය පක්ෂවලට වෙනස් කර ගන්න බැරි වුණා. ඒ නිසා මේ ක්‍රමයේ වෙනස මේ සියළු දෙනාටම අවශ්‍ය කාරණාවක්. එදා

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ත්‍රස්තවාදය මුලිනුපුටා දාලා මේ රට බේර ගත්ත වගේ වැඩක් තමයි මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් මා දකින්නේ. එදා වගේ මේ ව්‍යවස්ථාවෙන් මේ කොටසින් දැන් අපි කතා කළහම රටක් දියුණු වෙන කොට ඒ රටේ බෙදීම් අඩු කරන්න ඕනෙ. මේකෙන් දැන් වෙලා තියෙන්නේ බෙදීම් වැඩි කරන එක. ආගම් භේදය ඇවිල්ලා. කුල භේදය ඇවිල්ලා ,ජාති භේදය ඇවිල්ලා සියළු භේද මෙතන තියෙනවා. මේ ඡන්ද ක්‍රමයෙන්. දැන් එදා උදාහරණයක් ගත්තහම රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ආසනයේ අබුසාලි මැතිතුමාට ඡන්දය දුන්නා සියළු දෙනා එකතු වෙලා. එතුමා පාර්ලිමේන්තුවට ඇරියා. නමුත් අද එහෙම එකක් කරන්න බෑ. අද කුල භේදය නැති කරන්න මේවාට එදා අපේ වාම වාදී අදහස් තියෙන දේශපාලඥයින් කටයුතු කරලා ඒවා අඩුවීගෙන යන යුගයක තමයි නැවතත් 1978 න් පස්සේ නැවතත් ඒවා ඉස්මතු වෙලා තියෙන්නේ. අද සමහර ගම්මාන තියෙනවා ඒවාට ගිහිල්ලා සමහර අයට ඡන්දය ඉල්ලන්න බෑ. මොන වැරදි කළත් මොන දේ කළත් ඒ ගම්මාන දෙන්නේ ඒ අය ඡන්දය දෙන්නේ ඒ අයට තමයි. මේ ප්‍රතිපාදන හදලා දීලා තියෙන්නේ මේකෙන්ම තමයි. නැතුව කාගේවත් වරදක් කියනවා නෙමෙයි මේක. දැන් සමහර පැති තියෙනවා ඒකට ඒ ආගමේ අයම යවන්න ඕනෙ. රට දියුණු වෙන කොට භේද අඩු වෙන්න ඕන යුගයක මේකෙන් ඒ භේද වැඩි වෙන තත්ත්වයක් උදා වෙලා තියෙනවා. මේකත් මේක නිකන් වෛද්‍ය විද්‍යානුකූලව කියනවා නම් මේ බෝ නොවන රෝගයක් වගේ මේක. හැබැයි බෝවන රෝග ආපුවහම තමයි අපි බය වෙන්නේ. මේකෙන් බෝ නොවෙන රෝග ආපුවහම ලෝකයේ වැඩියෙන්ම මිනිස්සු මැරෙන්නේ 67% ක්. ඒක තේරෙන්නේ නෑ. හර්ද අකර්නමාතාවය කියයි. අගාදය කියයි. වෙනත් දියවැඩියාව කියයි. ඒවෙන් මැරෙන සංඛ්‍යාව ඉතාම වැඩියි. නමුත් ඒ ගැන කිව්වහම අපි කියපු ඩෙංගු හැදිලා විශාල සංඛ්‍යාවක් මැරුණා කිව්වොත් අන්න ඒකට අපි පොඩ්ඩක් බය වෙනවා. නමුත් ඊට වඩා භයානකයි මේක. මේකෙන් ඒ ප්‍රතිපාදන දීලා කුළ භේද,ආගම් භේද ,ජාති භේද සියළුම භේද ඇති කරලා තියෙනවා. ඊළඟට අපි කතා කරනවා මේ යුගයේ.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------

ගරු මන්ත්‍රීතුමාට බාධා කරනවා නෙමෙයි ගරු සභාපතිතුමනි ස්ථාවර නියෝග අත්හිටුවා මෙම ගරු සභාව පස්වරු 4.00 දක්වා පවත්වාගෙන යාම මම යෝජනා කරනවා.

***ගරු මන්ත්‍රී*** *පරාක්‍රම අතාවුද*
***கௌரவ உறுப்பினர் பராக்கரம அதாவுத***
*Hon.Member Parakrama Athawuda*
---------------------------------------

මැර ප්‍රචණ්ඩත්වය මේවා ගැන කතා කරනවා. දැන් මේ ඡන්ද ක්‍රමය තුළින් අපි දුවන්න ඕනෙ දිස්ත්‍රික්ක පුරාම යනවා. ඒකට මුදල් හොයන්න ඕනෙ. මේ මුදල් හඹායාම තියෙනවා. ඉතිං මේකෙම තියෙන ප්‍රතිපාදන තුළින් තමයි මේක වෙලා තියෙන්නේ. ඉතිං අපේ යුතුකමක් තමයි මේ ඡන්ද ක්‍රමය වෙනස් කළ යුතුමයි. ඒක අර යුද්ධය හා සමාන දෙයක්. පක්ෂය ඇතුළේ මට මතකයි මම පොඩි කාලයේ මගේ තාත්තා හිටියේ රුවන්වැල්ල ආසනයේ ආසන සංවිධායකවරයා හැටියට ගහලා තිබුණා

පොඩි පෝස්ටර් එකක්. පොප්ස්ටර් එකක් නෙමෙයි අතින් ඇඳපු ලොකු බැනර් එකක්. ඒකේ තියෙනවා අතා සභායට වාසු කියලා. අල්ලපු ආසනයේ සංවිධායකතුමා මෙහා පැත්තේ සංවිධායකතුමාට සභායට යන්න රැස්වීමට කතා කරයි. අද අල්ලපු ආසනයේ එක්කෙනා මෙහා පැත්තේ ආසනයේ එක්කෙනාට සහයෝගයට කතා කරයිද. අද කියයි උඹ අරුගේ නේද. ඉතිං මේක පක්ෂ තුළත් භේද. මේක යන්න බැරි දෙයක්. මේක විසඳිය යුතු දෙයක්. මං හිතන්නේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත දෙයක් මේ ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ ඡන්ද ක්‍රමය තුළින් මේ රටේ අපි නොදැනුවත්වම ඇති වෙලා තියෙන ප්‍රශ්න ගොඩක් ඇති වෙලා තියෙනවා. ඒ ප්‍රශ්න වලට 50% විතර උත්තර අළුත් ඡන්ද ක්‍රමයෙන්ම කටයුතු කරයි. එතුමා මෙම යෝජනාව ඉදිරිපත් කරන ගමන් ප්‍රකාශ කළා අර ප්‍රතිශත කලවාන ආසනයේ වෙලා තියෙන්නේ. හැට පන්දාහක් විතර ජනතාවට අද නියෝජිතයෙක් නැති වෙලා තියෙනවා. ඇහැලියගොඩ ආසනයට පහළොස් දෙනෙක් විතර ඉන්නවා. මේවා ඇත්ත සාකච්ඡා කරලා කටයුතු කරන්න ඕනෙ. ඒවගේම ඉෆ්ලාර් මැතිතුමා මෙතන නැති වුණත් කිව්වා එතුමා ඉන්නවා. මට මතක අර පුටුව ඒ පුටුව දිහා මම බැලුවේ.

ඒ නිසා එතුමා කිව්වේ මට ඒ ක්‍රමය හොඳයි. ඒක තමයි බිය. හුඟක් කෙනෙක් බිය වෙනවා මනාප ක්‍රමය තිබුනොත් මට දිනා ගන්න පුළුවන් ලේසි වෙයි කියලා.

නෑ එහෙම නෑ තමුන්නාන්සේ මේ ක්‍රමය ඉවර වෙලා තමුන්නාන්සේගේ පක්ෂයෙන් තමුන්නාන්සේ කොට්ඨාශයට ගිහිල්ලා තමුන්නාන්සේ යෝජනා කළහම ඒ යෝජනාවට ජනතාව ඡන්දය දුන්නේ. එහෙම නැතුව මෙවා මේ ආගමේ, මෙයා මේ කුළයේ අන්න ඒ ක්‍රමය නැති

කරන්න තමයි මේ ක්‍රමය හදා ගන්න ඕණේ. ඒ නිසා ඒ හුඔස් බිය අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන්ටත් තියෙනවා. ඒ අය වැඩි කරගෙන ගියා . තමන්ගේ ගමේ අය අසතුටුයි. ගමේ අය කැමති නෑ ඒ අය වෙනත් තැනකින් ඡන්ද ටික ගත්තා දැන් ඒ නිසා මේ ක්‍රමය වෙනස් කෙරුවාට කැමති නෑ ඒවගේ දෙයක් තමයි මේ තියෙන්නේ. ඒක ඇත්ත. අපි මේ ගැන ඒ අයට කියලා දීලා අළුත් සංවාදයක් ඇති කරලා ජනතාවට මේ අළුත් දේ ගැන කතා කරන්න ඕනෙ. දැන් 1978 ට පස්සේ 1977 අවසාන හැටියට තිබුණේ කොට්ඨාශ ක්‍රමයට මැතිවරණය. 77 ඉපදිච්ච ළමයා දන්නේ නෑ 2016 වෙන කොට මේ තියෙන ප්‍රායෝගික දේවල්. ඒ ප්‍රායෝගික පැත්ත අමතක කරලා මේ කතා කරන්නේ. ඒ නිසා අපි බොහොම සතුටු වෙනවා අපේ කාලයේම මේක විසඳලා ඊළඟ එන පරම්පරාවට මේ කුලල් කෑම නතර කරලා මේ අළුත් ක්‍රමයෙන් අළුත් ඡන්ද ක්‍රමයක් ඇති කරලා මේ කොට්ඨාශ ක්‍රමයට ගේන්න කියලා. ඒවගේම අපේ සලිත මන්ත්‍රීතුමාගේ කතාවේදී කිව්වා විශාල මුදලක් නැත්නම් මේ ගමන යන්න බෑ. මුදල් නැති කෙනෙක් හෝ වේවා මේ තනතුරට ආවට පස්සේ එයා මේ සඳහා මුදල් හම්බ කිරීමට පෙළඹෙනවා. එහෙම නැත්නම් ඊළග පාර ඡන්දයට යන්න බෑ. මෙන්න මේකයි ඇත්ත කතන්දරය.

මෙන්න මේකයි තත්ත්වය. මේ සත්‍යයෙන් එහාට අපිට යන්න බෑ. මේ සත්‍ය සාකච්ඡා කරලා අපේ හිටපු ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා කොමිටියක් පත් කරලා ඒ කොමිටියේ සභාපති විදිහට දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා පත් කරලා මේ ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමය කොට්ඨාශ ක්‍රමයට ගේන්න කියලා එතුමා ගෙනල්ලා ඒ කටයුත්ත අවසන් කිරීම පිළිබඳව සතුටට කරුණක්. දැන් එතනින් එහාට යන්න ඕණේ. ඒක ප්‍රාදේශීය සභාවට විතරක් නෙමෙයි. පළාත් සභාව ,පාර්ලිමේන්තුවටත් ගියොත්

මේ ක්‍රමය ඉතාම සාර්ථක ක්‍රමයක් බවට පත් වෙනවා. ඉතිහාසයෙන් ඒක අපිට දීලා තියෙනවා.

ඒ නිසා අපි මෙතුමාගේ මේ යෝජනාවේ තියෙනවා. මොකක්ද, නව ඡන්ද ක්‍රමයක් හදා ගන්නේ කොහොමද සමානුපාතික ක්‍රමයේ සාදනීය ගුණත් අරගෙන විශේෂිත කරුණක් හැටියට තියෙනවා. ඒකේ තියෙන්නේ මහා සංකීර්ණභාවය ඒකේ තියෙන ගැටළුභාවය අයින් කරලා අපේ තියෙනවා සමහර වෙනත් වෙනත් පක්ෂවල සුළු පක්ෂවල ,වෙනත් වෙනත් ආගම්, වෙනත් පක්ෂ පිහිටුවාගෙන තියෙන අය ඒ අය ඕනේ. සෝවියට් දේශයේ හදපු එක්කෙනා කියනවා සෑම රටකම ඉන්නවා එක එක අන්තවාදී කොටස්. එක එක ආගම්වලට ලැදි ඉතාම ගැඹුරින් ඒවාට ඇතුල් වෙච්ච කොටස් ඉන්නවා. නමුත් ඒ අයව තලා පෙළා ඒ අයව අයින් කරලා සමාජයක් රටක් ගොඩ නගන්න බෑ. ඒ අයත් මේකට එන්න ඕණේ. ඒ නිසා ඒ අයට අඬන් තේට්ටන් කරන්න එපා. ඒ අයගේ නියෝජිතත්වයත් මේකට ගන්න කියලා. අන්න ඒ අනුව මම හිතන්නේ මේකේ තියෙන සාදනීය ගුණ ටිකත් එකතු කරලා ජනතාවට සුදුසු ක්‍රමයක් හදලා දෙන්න කියලා අපි යෝජනාව ස්ථිර කරමින් තමුන්නාන්සේලාගේ යෝජනාව සභාපතිතුමා දැන් මට නවත්තන්න කියලා කියනවා. ඒ නිසා ඔබතුමාට මගේ ගෞරවය ,ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි වෛද්‍ය පරාක්‍රම අතාවුද මැතිතුමනි. මීළඟට ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක මැතිතුමා. එතුමා සභාවේ නැහැ. මීළඟට ගරු මන්ත්‍රී සමිත ආටිගල මැතිතුමා.

***ගරු මන්ත්‍රී සමිත ආටිගල***
***கௌரவ உறுப்பினர் சமித ஆடிகல***
*Hon.Member Samitha Atigala*

---

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව කාලෝචිත යෝජනාවක් හැටියට අපි දකිනවා. නව මැතිවරණ ක්‍රමයක අවශ්‍යතාවය අපි කවුරුත් පිළිගන්නා කාරණාවක්. ඒ අනුව තමයි අපි මේ වනවිටත් පළාත් පාලන ආයතන ඡන්ද පවත්වන්න කේවල ක්‍රමය අනුව ඡන්ද පවත්වන්න නීති රීති සම්මත කරලා අවසානයි. ඒ අනුව අපි සඳහන් කරන්න ඕනේ ගරු සභාපතිතුමනි මේ මැතිවරණ ක්‍රමය සමානුපාතික ක්‍රමයක් දකින්න ලැබෙනවා. ඒවගේම කේවල ක්‍රමය

යටතේ මේ මැතිවරණය පවත්වන ආකාරය කොයි වගේද කියන එක අපි අත්දැකීමෙන් දන්නේ නෑ. නව මැතිවරණ ක්‍රමයක අවශ්‍යතාවය තියෙනවා වගේම ඒක මේ තියෙන ක්‍රමයට වඩා හොඳ වෙන්න ඕනෙ. මේ ක්‍රමය වෙනස් කළාට මීට වඩා නරක ගුණාංග තිබුණොත් එහෙම ඒක සුදුසු නැහැයි කියන එක සඳහන් කරන්න ඕනෙ. මොකද මේක 100% ක්ම කේවල ක්‍රමය අනුව පැවැත්වෙන මැතිවරණ ක්‍රමයක් හැටියට

මැතිවරණ නීති රීති තදින්ම ක්‍රියාත්මක වෙන්න දරපු උත්සාහයන් තුළ අපි දැක්කා ඒ මැතිවරණවල නිදහස් හා සාධාරණයක් තියෙනවා. ඉතිං මනාප ක්‍රමයත් ඉතාම කණගාටුදායක තත්ත්වයට පත් වුණේ. පත් වෙන්න ප්‍රධානම හේතුව වුණේ මැතිවරණ නීතිරීති තදින්ම ක්‍රියාත්මක නොවීච්චි නිසා තමයි කියලයි අපි විශ්වාස කරන්නේ. ඒවගේම කේවල ඡන්ද ක්‍රමය තුළත් හරියාකාරව නීතිරීති අතීතයේ ක්‍රියාත්මක වෙලා

නෙමෙයි පළාත් පාලන ආයතනවල ඡන්ද පවත්වන්නේ. සමානුපාතික ක්‍රමයක ගුණාංගත් මේකේ දකින්න ලැබෙනවා. සමානුපාතික ක්‍රමය පක්ෂ වලට අවශ්‍යතාවයක් ඇති කරනවා. ප්‍රධාන දේශපාලන පක්ෂ වලට සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ නියෝජිතයෝ තෝරන්නේ කොහොමද කියන එක සොයලා බලන්න ඕනෙ. 1983 මුලින්ම සමානුපාතික ඡන්ද ක්‍රමය අනුව ඡන්ද තිබ්බා පළාත් පාලන ආයතනය. එදා ඒ සමානුපාතික ඡන්ද ක්‍රමය අනුව ඡන්ද තියලා එක පක්ෂයකට මන්ත්‍රීවරු පහක් තේරුණා නම් ඒ පහ තේරුවේ ඒ ලැයිස්තුවේ ඉන්න උඩ ඉඳලා පහළට හිටපු පස් දෙනා තමයි තේරුවේ. එතෙන්දී ඒ පක්ෂයේ ගත්තු තීරණය අනුව ඉහළට හිටියා නම් මොන ජාති පුද්ගලයෙකුට වුණත් මන්ත්‍රී ධූරයක් ලබාගන්න හැකියාව තියෙනවා. අන්න ඒකට විකල්පයක් හැටියට ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් මේ සමානුපාතික ඡන්ද ක්‍රමයේ ලබාදීපු ප්‍රතිඵලයක් හැටියට තමයි මනාප ක්‍රමය හඳුන්වලා දුන්නේ. මනාප ක්‍රමය අනුව පක්ෂයක ඉහළම හිටියා කියලා නැහැ මනාප අනුව තමයි මන්ත්‍රීවරු තේරෙන්නේ. මනාප ක්‍රමයේ හොඳ ගුණාංග තියෙන විත්තිය අපි සඳහන් කරන්න ඕනේ. අපිට මේ මනාප ක්‍රමයේ මේ සමාජයට අපි සියළු දෙනාටම කරදරයක් බවට පත් වෙලා තියෙන්නේ. හරියාකාරව නීතිරීති ක්‍රියාත්මක නොවීච්චි නිසා. පසුගිය කාලයේත්

තියෙනවා. පොඩ්ඩක් එහා මෙහා ගියොත් එහෙම මැතිවරණ ඡන්ද පෙත්සම් වලට මුහුණ දීලා මන්ත්‍රී ධූර අහිමි වෙච්ච ඒවගේම අතුරු මැතිවරණ පවත්වන්න සිද්ධ වුණ ඉතිහාසයක් තියෙනවා. ඒ කාලයේ නීති හරියට ක්‍රියාත්මක වෙච්චි නිසා පොඩි වැරැද්දක් සිද්ධ වුණත් ඡන්ද පෙත්සම් වලින් ඒවා අභියෝගයට ලක් කරලා සහන ලබාගැනීමේ හැකියාව තියෙනවා. ඉතිං කේවල ක්‍රමයට වුණත් ඡන්ද තියලා නීතිරීති ක්‍රියාත්මක නොවුණොත් එහෙම තේරුමක් නෑ. මොකද අපහාස නීතිය කියන එයලා වියදම් කරන නීතියක් තියෙනවා ඒවගේ දේවල් ගොඩාක් තිබුණා. ඒවා හරියාකාරව ක්‍රියාත්මක වෙන්න ඕනෙ. මොන මැතිවරණ ක්‍රමය හඳුන්වලා දුන්නත්.

ඒ වගේම මේ සමානුපාතික ඡන්ද ක්‍රමය අනුව සමානුපාතික ක්‍රමයටත් මේ කේවල ක්‍රමයට අමතරව මන්ත්‍රීවරු තෝරා ගන්නවා. අන්න එතෙන්දී මන්ත්‍රීවරු තෝරන්නේ කොහොමද කියලා ගැටළු තියෙනවා. මොකද අපි දන්නවා ජාතික ලැයිස්තුවෙන් පවා මන්ත්‍රීවරු තෝරා ගන්න කොට ඒකේ නොයෙකුත් ආකාරයේ අක්‍රමිකතා සිද්ධ වෙනවා කියන එක අපි කාටත් සතුටු වෙන්න හැකියාවක් නැහැ කියන එක පසුගිය මහ මැතිවරණයේදීම අපිට අත්දැකීම් තියෙනවා. පරාජයට පත් වුණු

මන්ත්‍රීවරු ජාතික ලැයිස්තුවෙන් පත් වුණා. මේ කේවල ක්‍රමයට අමතරව සමානුපාතික ක්‍රමයකුත් හඳුන්වලා දීලා තියෙනවා. ඒ අනුව දේශපාලන පක්ෂ වලට හැකියාව තියෙනවා තමන්ට ඕන පුද්ගලයෝ 70% ක් කේවල් ක්‍රමය අනුව තේරෙනවා නම් 30% ක් තමන්ට ඕන පුද්ගලයෝ තෝරා ගන්න හැකියාව තියෙනවා. ඒ විදිහට ගත්තහම අපි විශ්වාස කරනවා පළාත් පාලන

ආයතනවල ක්‍රියාත්මක කළ ඒකේ අඩුපාඩුත් දැකලා සංශෝධන ගෙනල්ලා කළ යුතු ක්‍රමයක් හැටියට තමයි අපි හඳුන්වන්නේ . එහෙම නැතුව එක පාරට ක්‍රියාත්මක කරලා ඉවර වෙලා මීට වඩා කණගාටුදායක තත්ත්වයක් නිර්මාණය වුණොත් එහෙම ඒක සුදුසු නැහැ. අපි සඳහන් කරන්න කැමතියි මුලින්ම පළාත්පාලන ආයතන වලට හඳුන්වලා දීලා ඒ අඩුපාඩුත් සම්පූර්ණ කරන්න පුළුවන් කාටත් සතුටු වෙන්න පුළුවන් ක්‍රමයක් මේ මැතිවරණ ක්‍රමය හරහා නිර්මාණය කළ යුතුයි කියන එක සඳහන් කරමින් මගේ කතාව අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමනි. මීළඟට අකිල සාලිය එල්ලාවල මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*

---

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් තමයි මම මේ සාකච්ඡාවට ඇතුළ් වෙන්නේ. කෙසේ වෙතත් මට පෙර කතා කරපු සියළුම මන්ත්‍රීවරුන් සමානුපාතික ක්‍රමයේ අඩුපාඩු ගැනත් කියලා කෝට්ඨාශ ක්‍රමයේ තියෙන කාලෝචිත අවශ්‍යතාවයක් බව සඳහන් කළා. අපි දන්නවා සමානුපාතික ක්‍රමයේත් හොඳ ලක්ෂණ තියෙනවා. සුළු

පක්ෂ නියෝජනය කරන්න අවස්ථාවක් තියෙනවා. දැන් සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා කිව්වා ඡන්ද අටසිය ගාණක් රත්නපුර දිස්ත්‍රික්කයෙන් ගත්ත සී.ඩබ්.සී. පක්ෂයට මන්ත්‍රී ධුරයක් හිමි වෙනවා 2002 දී. ඒක හොඳ ලක්ෂණයක්. නැත්නම් සී.ඩබ්.සී. වගේ පක්ෂයකට අපි පහත් කරලා කතා කරනවා නෙමෙයි. නමුත් සුළු පක්ෂ කියලා අපි දන්නවා. රටේ තියෙන ප්‍රධාන පක්ෂ දෙකක් මොකක්ද කියලාත් අපි දන්නවා. මේ පක්ෂ වලට ඡන්ද හැට දාස් ගණන්,හැත්තෑදාස් ගණන්, ලක්ෂ ගණන් ගන්න හැකියාවක් නෑ. නමුත් එවලේදී කුඩා ඡන්ද සංඛ්‍යාවක් අරගෙන මන්ත්‍රී ධුරයක් ලබාගැනීම මං හිතන්නේ හැම පක්ෂයකටම අවස්ථාවක් ලැබීමක් හැටියට තමයි මම දකින්නේ.

ඒවගේම අපේක්ෂකයෙක් තමන්ගේ කොට්ඨාශයේ පැරදුණත් අනිකුත් ප්‍රදේශ වලින් ඡන්ද අරගෙන මන්ත්‍රී ධුරයක් ලබාගැනීමේ අවකාශයකුත් තියෙනවා. මේ සමානුපාතික මැතිවරණ ක්‍රමයේදී. ඒවා ඇරෙන්න අයහපත් දේ බහුලයි. මට පෙර කතා කරපු මන්ත්‍රීවරු කිව්වා වගේ එකම පක්ෂයේ අපේක්ෂකයෝ අමනාප වෙලා අන්තිමට තමන්ගේ මැතිවරණ කාලයේදී විතරක් නෙමෙයි තමන්ගේ ජීවිත කාලයටමත් අමනාප වෙච්චි අවස්ථා අපි දැකලා තියෙනවා. විශේෂයෙන් පළාත් සභා පාර්ලිමේන්තු විතරක් නෙමෙයි

පළාත්පාලන මැතිවරණ වලදී 1991 මැතිවරණයේ තරහ වෙච්චි අපේක්ෂකයෝ තාමත් තරහයි. පළවෙනි මනාප ක්‍රමයෙන් පටන් ගත්තහම මේ ආකාරයට ඉතිහාසයට ගියොත් එහෙම අපි දන්නවා 1978 මේ ව්‍යවස්ථාව ගරු ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා හදන්නේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ස්වයං පෝෂිත ආර්ථික

ක්‍රමයක් කියන ආර්ථික රටාවට සම්පූර්ණයෙන් පටහැනිව ජනතාවගේ ප්‍රසාදය ලබාගන්නත් මේ විවෘත ආර්ථික ක්‍රමයත් එක්ක තමයි මේ 1978 හදන්නේ. අපි දන්නවා මේ අඩුපාඩු ගැන කතා කරන ඉතිහාසය කෙසේ වෙතත් අපි දන්නවා 19 වෙනි ව්‍යවස්ථාව ගැන කතා කළොත් එහෙම අපි අනුරාධපුරයේ වැඩ මුළුවට ගිහයම අපි දැක්කා 19 වෙනි ව්‍යවස්ථාවේ පළාත් සභාව ගැන කතා කරන්නේම නෑ. පළාත් පාලන ආයතන ගැන කතා කරනවා. පළාත් සභාව ගැන කිසිම දෙයක් සඳහන් වෙන්නේ නෑ කියලා ඒ වැඩ මුළුව ෆෝග්‍රෑම් එක කරපු නිළධාරියා අපිට සඳහන් කළා. මේවගේ හැම ව්‍යවස්ථාවකම මේ වගේ අඩුපාඩු තියෙනවා. අර සමිත මන්ත්‍රීතුමා කිව්වා වගේ අඩුපාඩු තියෙනවා. නැති ව්‍යවස්ථාවක් නෑ. ඕන ව්‍යවස්ථාවක් තියෙනවා. ඒ අඩුපාඩුකම් අපි හදා ගන්න ඕනෙ. කෙසේ වෙතත් වර්ථමානයේ කොට්ඨාශ ක්‍රමයට මැතිවරණයක් පැවැත්වීම ඉතාම හොඳයි. මොකද අපේ අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා කිව්වා එතුමාගේ පළවෙනි මැතිවරණයේදී එතුමාගේ පෝස්ටර් 250 ප්‍රින්ට් කළේ කියලා. නමුත් අද තමන්ගේ ගෙදර අයටත් ගහලා මදි. රෑ ගහලා උදේ බලන කොට ඒ පෝස්ටර් 250 ම වහලා. පෝස්ටර් ලක්ෂ ගණන් වලින් තමයි අද ගහන්නේ. අද ලක්ෂ හැත්තෑ පහක් කියපු කතාව ඇත්ත. නමුත් මේකේ හැමෝටම අතුරු ඵලයක් හැටියට අද අපි දන්නවා වෘත්තීයවේදීන්, වෛද්‍යවරුන් ඉංජිනේරුවන්, නීතිඥවරුන්

දේශපාලනයට එන්න අකමැතියි. මොකද ඇවිල්ලා ලක්ෂ හැත්තෑ පහක්, සීයක් වියදම් කරලා දිනා ගන්න පුළුවන් වුණොත් මන්ත්‍රීකම හරි තියෙනවා එහෙම නැත්නම් ගෙදර යන්න ඕණේ. දිනා ගත්තත් තමන්ගේ වත්කමක් විකුණලා හරි මැතිවරණය කරලා දිනුවොත් එහෙම මොකක්ද කරන්න ඕනෙ ඒ ලක්ෂ හැත්තෑ පහ තමන්ගේ දූලා පුතාලාට

වියදම් කරන්න තියෙන මුදල් නැවත උපයා ගන්න ක්‍රමයක් හොයා ගන්න ඕනෙ. ඒකනේ සත්‍ය. ලක්ෂ හැත්තෑපහක් වියදම් කරපු ඒ මුදල තමන්ට ලබා ගන්න උපයා ගන්න උපක්‍රම යොදනවා. උපක්‍රම යොදන කොට වංචා දූෂණ වලට නිකන්ම අහු වෙනවා. ඒ නිසා තමයි සිංගප්පූරුව වැනි ආර්ථික අතින් ශක්තිමත් රටවල්වල ඇමතිවරුන්ට පවා තමන්ට නිළ රථයක් දුන්නොත් ඒ නිළ රථය පාවිච්චි කරන්න පුළුවන් නිළ ගමන් වලට විතරයි. හවස ගෙදර යන කොට නිළ රථය අමාත්‍යාංශයේ පාක් කරලා තමන්ගේ වාහනයෙන් හරි බස් එකෙන් හරි කෝච්චියෙන් හරි ගෙදර යන්න ඕනෙ. නමුත් වාර්ෂික දීමනාව අතිවිශාලයි. ඩොලර් මිලියනයටත් වඩා එහා ප්‍රමාණයක් ලැබෙනවා මන්ත්‍රීවරයෙක්ගේ දීමනාව. හේතුව තමයි අනවශ්‍ය දූෂණ,වංචා වලට මන්ත්‍රීවරු යොමු වෙන්නේ නැති හින්දා. මේ ආකාරයට මැතිවරණ ක්‍රමයේ තියෙන දූෂිත තත්ත්වයන් මේවයි.

ඒ නිසා කෝට්ඨාශ ක්‍රමයේ තියෙන හොඳ පැත්ත දැක්කොත් එහෙම අපි දන්නවා ආසනයකට කොට්ඨාශයකට තමන්ට මන්ත්‍රීවරයෙකුට ලැබෙන ප්‍රතිපාදන 100% ඒ තමන්ගේ කොට්ඨාශයේ ජනතාවට සුභ සිද්ධිය උදෙසා වෙන් කරන්න පුළුවන්. නමුත් මේ තුළින් ජනතාවට ලැබෙන සේවය ජනතා නියෝජිතයෙක්ගෙන් ලැබෙන සේවය 100% ක්ම ලැබෙනවා. ඒවගේම

කියන්න ඕනෙ බලංගොඩ ආසනය මම නියෝජනය කරන ආසනය උදාහරණයකට ගත්තොත් එහෙම මේ සමානුපාතික මැතිවරණ ක්‍රමය නිසා 1994 ඉඳන් අද වෙනකන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නෑ. අපි දන්නවා මගේ පියතුමාට 740 ක් ඡන්ද මදි වෙලා පාර්ලිමේන්තු යන්න බැරි වුණා. භාණු

ඇමතිතුමාට 760 විතර ඡන්ද මදි වෙලා පාර්ලිමේන්තු යන්න බැරි වුණා. 800 ක්ද විතර මදි වෙලා යන්න බැරි වුණා. මේ ආකාරයෙන් අදටත් පාර්ලිමේන්තු නියෝජනයක් නෑ අබුසාලී මැතිතුමාගෙන් පස්සේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම් මල්ලිකා රත්වත්තේ මැතිණියගෙන් පස්සෙ 1970 පස්සේ තාම පාර්ලිමේන්තු නියෝජනයක් නෑ. මේ ආකාරයෙන් කවුද පීඩාවට පත් වෙන්නේ. පීඩාවට පත් වෙන්නේ බලංගොඩ ආසනයේ ජනතාව. අද අපිට කොච්චර කැප වෙලා තියෙනවා නම් රැකියා ප්‍රශ්නය. ඒවගේම ප්‍රදේශයට ලැබෙන මුදල් ,සංවර්ධනයට ලැබෙන මුදල් මේ සියල්ලක්ම බලංගොඩ ආසනයට මිළ කරන්න බෑ. මොකද වසර පහක් ඇතුළත ලැබෙන මුදල අනිත් ආසනවලට ලැබෙන කොට අපිට ලබෙන්නේ නෑ. මේ ආකාරයෙන් කියනවා නම් කොට්ඨාශ ක්‍රමය ඉතාමත් උචිතයි මේ පවතින දේශපාලන ක්‍රමයට. විශේෂයෙන්ම මේ ක්‍රමය තුළ මම තව ඉල්ලීමක් කරනවා යෝජනාවක් තියෙනවා ඉතිහාසයේදී අපේ පැරණි මන්ත්‍රීවරුන් දන්නවා ඉතිහාසයේදී ඡන්ද ගණන් කිරීමේදී එම කොට්ඨාශයේම තමයි ගණන් කළේ. නමුත් දැන් සෙන්ට්‍රල් එකට ගෙනල්ලා රත්නපුරට ගෙනල්ලා තමයි රත්නපුර කච්චේරියේ තමයි රත්නපුර දිස්ත්‍රික්කයේම ඡන්ද ගණන් කරන්නේ. මේ ක්‍රමයේදී මම කියනවා මගේ මනාප හොරකම් කළා. මගේ මනාප අර මන්ත්‍රීවරයා ගත්තා. අර ඇමතිවරයා ගත්තා. මේ චෝදනා සියල්ලක්ම නැති වෙනවා. තමන්ගේ ආසනයේම නැත්නම් ඒ කොට්ඨාශයේම ඡන්දය ගණන් කළොත් එහෙම මේ චෝදනා නැගෙන්නේ නෑ. එතකොට ඒ අවස්ථාවේදීම දන්නවා මොකක්ද ප්‍රතිඵලය කියලා. නමුත් ඒ ක්‍රමයත් කාලෝචිත වෙන්න ඕනෙ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

මන්ත්‍රීතුමා අවසන් කරන්න.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*
------------------------------------------------------------

සියළු ජන කොට්ඨාශ නියෝජනය වෙන ආකාරයට අළුත් මැතිවරණ ක්‍රමයක් බිහි වෙන්න සලිත ගරු මන්ත්‍රීතුමගේ යෝජනාවත් එක්කම අළුත් මැතිවරණ ක්‍රමයක් සැදෙමින් පවතිනවා කියලා සලිත මන්ත්‍රීතුමා කිව්වා. එසේ වෙන්න කියලා ඉල්ලා සිටමින් සියළු දෙනාටම ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තුතියි ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමනි. මීළගට බී.ආරියවංශ මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී බී.ආරියවංශ***
***கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ***
*Hon.Member B.Ariyawansha*
-------------------------------------------

ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරුනි, ඒවගේම අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු ඉතා වැදගත් යෝජනාවක්. අපේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ප්‍රකාශ කළා කොට්ඨාශ ක්‍රමය පළාත් සභාව තුළ ක්‍රියාත්මක කරන්න ඕණේ කියලා. ඒ නිසා අපි දන්නවා නව රජය බලයට පත් වෙලා ඉන් පසුව මේ කොට්ඨාශ ක්‍රමය ප්‍රාදේශීය මට්ටමින් ,පළත් සභා මට්ටමින් ක්‍රියාත්මක කරන්න සැළසුම් කරන මොහොතක ඒවගේම පාර්ලිමේන්තුවේ ඒ ආසන ක්‍රමය ක්‍රියාත්මක කරන්න හදන මොහොතක පළාත් සභා ගැන අපි දැක්කේ නෑ කොහේවත් කතා කරලා තියෙනවා. ඒ නිසා සබරගමු පළාත් සභාව තුළ එම යෝජනාව සලිත කරුණාරත්න අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කිරීම පිළිබඳව අපි ඉතාමත් සතුටු වෙනවා. ඒවගේම අපි දන්නවා පළාත් සභාව තුළ මේ කොට්ඨාශ ක්‍රමය ගෙන ඒම තුළ අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට ඒවගේම අපේක්ෂකතුමන්ලාට පහසු වෙනවා වගේම අපේ ජනතාවටත් විශාල සේවාවක් ඉටු වෙනවා කියලා කියන්න පුළුවන්. මොකද අතීතයේ අපි දැක්කා මේ කොට්ඨාශ ක්‍රමය එහෙම නැත්නම් ආසන ක්‍රමය ගම් තුළ ක්‍රියාත්මක වෙන කොට එදා ඒ ප්‍රදේශයට වග කියන මන්ත්‍රීවරයෙක් වශයෙන් ජනතාව ගැන වඩාත් අවධානයෙන් යුතුව කටයුතු කරපු මොහොතක් අපි දැක්කා. ඒත් සමානුපාතික ක්‍රමය තුළ ඒ මනාප ක්‍රමය තුළ ගොඩක් අපේ මහජන නියෝජිතයින් ජනතාවගෙන් ඈත් වෙලා ඉන්න බවට පත් වෙලා තියෙනවා. මොකද තමන්ගේ කොට්ඨාශයට වඩා විශාල බලප්‍රදේශයක් ආවරණය කරන්න තියෙන නිසා

ඒවගේම මන්ත්‍රීවරුන්ට කාර්යය බහුලතාවය ඒවගේම අධික වියදම ඒවගේ තුළ අද ජනතාව අතරට යන්න නොහැකි තත්ත්වයක් උදා වෙලා තියෙනවා. ඒ තුළ අපි දකිනවා අපේ මන්ත්‍රීතුමන්ලාට ඒවගේම ඒ ජනතාවට ඒ සේවය ඉටු කරන්නට අවස්ථාව ලැබෙන්නේ නෑ. විශේෂයෙන් කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජීවත් වෙන පුද්ගලයෙක් වශයෙන් අපි දැක්කා පළාත් සභා ඉතිහාසය තුළ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට මන්ත්‍රීවරයෙක් පත් වුණේ නෑ. මම 2008 පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණත් ඒ අවස්ථාව මට ලැබුණේ නෑ. ඒවගේම 2012 ඉදිරිපත් වුණත් මට ඒ අවස්ථාව ලැබුණේ නෑ. මට මේ අවස්ථාව ලැබුණේ මේ ප්‍රදේශය නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ අපේ මන්ත්‍රීවරු දෙදෙනෙක් පාර්ලිමේන්තුවට යාම තුළත් එක මන්ත්‍රීවරයෙක් මිය යාමත්, එක මන්ත්‍රීවරයේ හිරේට යාම තුළත් තමයි මට මේ පළාත් සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ. මොකද කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ. ඒවගේම මේ කොට්ඨාශය තුළ අපි දකිනවා ඒ ප්‍රදේශ දියුණු කරන්න අවශ්‍ය කොට්ඨාශය ගැන වගකීමක් දරණ මන්ත්‍රීවරුන් පත් වෙනවා මේ කොට්ඨාශය තුළ. එම නිසා විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරලා සමානුපාතික ක්‍රමය යටතේ අර අපේ මන්ත්‍රීවරුන් කිව්වා වගේම මැතිවරණයට ඉදිරිපත් කරලා ඉන් පසුව මන්ත්‍රීවරුන්

බවට පත් වෙලා විවිධ දේවල් වලට පෙළඹෙණ අවස්ථා අපි දැක්කා. ඒ මන්ත්‍රීවරුන්ගේ දූෂණ,වංචා වලට. එම නිසා මෙවැනි කොට්ඨාශයකට සංවිධානය කිරීම තුළ ඒ කොට්ඨාශයේ ප්‍රදේශයේ ජනතාවගේ ඒ ප්‍රශ්නවලට විසඳුම් හොයන්නත් ප්‍රදේශය සංවර්ධනය කරන්නත් පුළුවන් වෙනවා ගරු සභාපතිතුමනි.

එම නිසා මම දීර්ඝ වශයෙන් කතා කරන් බලාපොරොත්තු වෙන්නේ නෑ . අපේ ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කලා. සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාවට අපි කාගේත් මේ පළාත් සභාවේ එකඟතාවය පළ කළා වගේ නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් එක අතක් නෙමෙයි අත් දෙකම හරි උස්සලා මේ යෝජනාව සම්මත කරන්න මගේ එකඟතාවය පළ කරනවා කියලා ගරු සභාපතිතුමාටත් අපේ ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාටත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු බී.ආරියවංශ මන්ත්‍රීතුමනි. මීළඟට ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා.

***ගරු අමාත්‍ය භාණු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***
*Hon. Minister Bhanu Munipriya*

---

ගරු සභාපතිතුමනි ඉතා කාලෝචිත යෝජනාවක් සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාගේ. මේ යෝජනාවට මම හිතනවා මුළු රටේම එකඟතාවයක් තියෙනවා. තේරුම් නොගත්ත අය පමණක් සමහර වෙලාවට කොට්ඨාශ ක්‍රමය එනවා කියලා භීතියක් ඇති කරගෙන තියෙනවා. නමුත් යෝජනාවේ තියෙන්නේ ඒක නෙමෙයි. යෝජනාවේ තියෙන්නේ මේ තියෙන

ක්‍රමය වඩා වැඩියෙන් ජනතාවට සම්බන්ධ වෙන මන්ත්‍රීවරයෙක් නිශ්චිත කොට්ඨාශයකට මැතිවරණ ක්‍රමයේ තියෙන මේ ලංකාවේ තියෙන ලැබෙන් පුළුවන් විදිහට මොන ක්‍රමවේදයක් හරි ඇතුළත් කරලා සමානුපාතික ක්‍රමයේ සංශෝධනයක් සහිත මැතිවරණ ක්‍රමයක් ඉල්ලන්නේ. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හදපු ජේ.ආර්.ජයවර්ධන මහත්මයා මැතිවරණ ක්‍රමය ගෙනාපුවහම 89 පළාත් සභා මැතිවරණ ක්‍රමය ගෙනල්ලා සමානුපාතික ක්‍රමය ඇතුල් කරපුවහම මේ සියල්ලට එදා හිටිය ප්‍රධාන විපක්ෂය විරුද්ධ වුණා. 78 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති වුණ විධායක ජනාධිපති ක්‍රමයේ තියෙන කුරත්වය ලෝකයේ කිසිම රටක නැති නිසා ඉතාමත් හදවත හොඳ මනුස්සයෙක් පිනට දහමට ලැදි මනුස්සයෙක් මහත්තයෙක් උපාසක මහත්තයෙක් විධායක ජනාධිපති වුණත් ඉතාමත්ම අත්තනෝමතික ඒකාධිපති තැනකට යන නිසා ඒක වෙනස් කළ යුතුයි කියලා මුලින්ම එන්.එම්.පෙරේරා මහත්තයාගේ පොත බලන්නකෝ. එන්.එම්.පෙරේරා මහත්තයාගේ පොත් පිංචක්. පිටු තියෙන්නේ බොහොම පොඩි ගාණයි. සරත් මුත්තෙට්ටුවගම මැතිතුමා රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ කිව්වා. එක්සත් ජාතික පක්ෂය ඒකට විරුද්ධ වුණා. නෑ නෑ මේක තමයි හරි කියලා කිව්වා.

ඊළඟට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ලංකාවේ පළවෙනි වතාවට 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව යෝජනාවක් ගෙනල්ලා 13 දෙනෙක් විරුද්ධව ඡන්දය දුන්නා. ඒක තමයි ඉතිහාසය. දැන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පස්සේ අවුරුදු ගාණක් ගිහින් අවුරුදු 37 ක්, 27,28 ක් යන කොට එක්සත් ජාතික පක්ෂය කෘත්‍යාධිකාරී

මණ්ඩලය කැඳවලා කිව්වා මේ ජනාධිපති ක්‍රමයේ පළ විපාක හේතු කරගෙන ජනාධිපති ක්‍රමය වෙනස් වෙන්න ඕණේ. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් වෙන්න ඕණේ. මැතිවරණ ක්‍රමය වෙනස් වෙන්න ඕණේ. දැන් ඒ යෝජනාව ගෙනල්ලා පාර්ලිමේන්තුවේ පළාත් පාලන මැතිවරණයට 2012 පාර්ලිමේන්තුවට ගෙනල්ලා දැන් ගැසට් කරලා නිශ්චිතයි කොට්ඨාශ සමානුපාතික ක්‍රමය ප්‍රාදේශීය මැතිවරණය. දැන් තියෙන්නේ කොට්ඨාශ තීරණය. අභියාචනා දෙදාහක් විතර තියෙනවා. ඒ අභියාචනා දෙදාහ අභියාචනය සලකලා බලලා අප්‍රේල් මාසයේ මැතිවරණය තියන්න පුළුවන් තත්ත්වයට තියෙනවා. දැන් එතකොට ඒක හැදිලා ඉවරයි. දැන් ව්‍යවස්ථා මණ්ඩලයක් හදනවා. අළුත් ව්‍යවස්ථාවක් හදන්න මේ පාර්ලිමේන්තුවේ කෙරෙන දේ මම කියන්නේ. අළුත් ව්‍යවස්ථා කෙටුම්පත හදන්න කෙටුම්පත් මණ්ඩලයක් හදන වෙලාව. ජනතාවගෙන් යෝජනා ඉල්ලගෙන දැන් ඉප්ලාර් මන්ත්‍රීතුමා කිව්වා වගේ රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මේ මස 27,28 එක් වෙන වෙලාව. මොකටද මේ වැරදි ක්‍රමය අවුරුදු 37 කට පස්සේ වෙනස් කරන්න ජනතාවගේ යෝජනා. ඒ යෝජනාවේ දෙයක් හැටියටත් මේ සලිත මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව මම දකින්නේ.

එක තමයි පාර්ලිමේන්තුව තීන්දු කළා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕනෙ. පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ඕනෙ. දැන් ප්‍රාදේශීය සභාව වෙනස් වෙලා තියෙනවා. අර ගොල්ලෝ යෝජනා වෙලා තියෙනවා තුනෙන් දෙකකින් බලය දෙන්න. මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න. දැන් මැද තියෙන එක වෙනස් විය යුතුයි කියන එක අපිට තීන්දු කරන්න අමාරු දෙයක් නෙමෙයි.

ගරු සභාපතිතුමනි ආසනයේ කේවල ක්‍රමයට ඡන්දය තිබ්බොත් ඇති වෙන ප්‍රතිඵල සාධාරණ නැහැ. දැන් රත්නපුර මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මේ කේවල ක්‍රමයට මම කියන්නේ 78 ට ඉස්සෙල්ලා තිබුණ ක්‍රමයට. විසිදාහක් ගන්නවා එක්සත් ජනතා නිදහස් සන්ධානය. එක්සත් ජාතික පක්ෂය දහඅට දාහක් ගන්නවා. ජනතා විමුක්ති පෙරමුණ දහදාහක් ගන්නවා. අනිකුත් ස්වාධීන සියළු පක්ෂ දහදාහක් ගන්නවා. කවුද දිනන්නේ. විසිදාහක් ගන්න එක්සත් ජනතා නිදහස් සන්ධානය දිනනවා. පරාජයි දහඅටදාහක් ගත්ත එක්සත් ජනතා නිදහස් සන්ධානය. දහදාහක් ගත්ත ජනතා විමුක්ති පෙරමුණ. දහ දාහත් ගත්ත අනිකුත් ස්වාධීන පක්ෂවල එකතුව. ඒගොල්ලන්ගේ ගාන තිස්අටදාහයි. විසිදාහක් ගත්ත කෙනා පාර්ලිමේන්තුවට යනවා. එතකොට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න මැතිවරණයෙන් ගියපු පුද්ගලයා පාරට බහින කොට විසිදාහක් ඒපැත්තේ ඉන්න කොට තිස්අටදාහක් ඉන්නේ විරුද්ධව. ඒක වැරදියි. ඒ ක්‍රමය වෙනස් වෙන්න ඕණේ නිසා සමානුපාතික ක්‍රමය ගෙනාපු නිසා අකිල එල්ලාවල මන්ත්‍රීතුමා කිව්වා මේකේ හොඳක් තියෙනවා. මොකද අපේ තොන්ඩමන් ඇමතිතුමාට අටදාහෙන් යන්න පුළුවන්කම ලැබුණා මේ ක්‍රමය තුළ කියලා. ඒක එහෙම නෙමෙයි වුණේ. තොන්ඩමන් මහත්තයාගේ සුළු පක්ෂය නිසා ආවා නෙමෙයි. ඉස්සෙල්ලාම කරන්නේ මේ ක්‍රමයට දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ

ගත්ත ඡන්ද ටික එකතු කරනවා. වලංගු ටික එකතු කරනවා. ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ ටික එකතු කරනවා. ඒකෙන් දිනුවේ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් ඒකට ගිය මන්ත්‍රී කොට්ඨාශය කීයද. දොළහයි. දොළහෙන් බෙදනවා අර කොටස. දොළහෙන් අපි ගත්ත කොටස බෙදපුවහම

අපේ අර මන්ත්‍රීවරයෙක්ගේ ගාන එනවා. අර දහනවදාහට අපිට එක්කෙනෙක් එනවා. අපිට දොළහයි. එක්සත් ජාතික පක්ෂයට අටක් ගියා. ඒගොල්ලෝ ගත්ත ගාන ගත්තහම අටෙන් බෙදනවා. එතකොට ඒගොල්ලන්ගේ එක මන්ත්‍රීවරයාගේ ගාන යනවා. ගියාට පස්සේ කොටසක් ඉතුරු වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ අට දෙනාට බෙදපුවහම ඉතුරුයි පන්දාහක්. මන්ත්‍රීවරයෙක් නෑ. ඒගොල්ලන්ට ඕනෙ. විසිඑක්දාහක්. හැබැයි තුන්දාහයි ඉතුරු. එක්සත් ජනතා නිදහස් සන්ධානය දොළොස්දාහ කළම ම ඉතුරුයි පන්දාහක්. හැබැයි කුකුළට වැටිලා තියෙනවා අටදාහක්. අර කොටේ යන්නේ අටදාහට. බැරි වෙලාවත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඉතුරු කොටේ නවදාහක් වුණා නම් ඒ කොටේ යන්නේ නෑ සුළු පක්ෂයට. ඒ නිසා සුළු පක්ෂ නියෝජනය කරන්න මේකෙන් එන්න පුළුවන් කියන කාරණය වැරදියි.

එම නිසා ගරු සභාපතිතුමනි මේ ක්‍රමය තුළ මම ඉතාමත් ස්තූතිවන්ත වෙනවා පරාක්‍රම අතාවුද මැතිතුමාගේ කතාවට. ඔක්කෝම මට අහන්න බැරි වුණත් ඒකේ හරය අරගෙන තමයි මම ගියේ. ගරු සභාපතිතුමනි අපි බහුවිද ජනවර්ගයත් එක්ක ජීවත් වෙන ජනතාවක්. සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර්, මැලේ. අපි එකට ජීවත් වෙනවා. මේ ඡන්ද ක්‍රමයේ අපි ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කිව්වා මේ ක්‍රමය එයාට හොඳයි. ඇයි මුස්ලිම් ජනතාවට කියනවා මේ අනිත් එවුන් වැඩක් නෑ අපේ එකාට දීපන්. අපේ එකා විතරයි උඹලා වෙනුවෙන් පෙනී ඉන්නේ. රාමචන්ද්‍රන් මහත්තයා දෙමළෙන් කතා කළාට වැඩක් නෑ එයා මුස්ලිම් නෙමෙයි. රාමචන්ද්‍රන් මහත්තයා කියනවා අපි දෙමළ අපි නියෝජනය කරන්න දීපන්. දැන් සිංහල අයට

මොකක්ද කියන්නේ. කතෝලික එක්කෙනෙක් ආවොත් එයා කියනවා කතෝලික අයට දීපන්. බෞද්ධයෙක් වැටුණොත් ඒක ඇතුළේ තියෙනවා වෙන දේවල්. බෞද්ධ කොටස කුළය මත පදනම් කර ගන්නවා. දැන් මේ රට හදන්නේ ජනවාර්ගිකයන් එකතු කරලා සමගියක් ඇති කරලා යෝජනා එකට ගෙනල්ලා මේ පළාතේ ප්‍රශ්න විසඳන්න තියෙන සභාවට කුළ වශයෙන් බෙදලා ආගම් වශයෙන් සිරස්ව බෙදනවා. ජාතීන් වශයෙන් සිරස්ව දෙනවා. එහෙම නැත්නම් තිරස්ව කුළ වශයෙන් බෙදිලා. එවා පදනම් කරගෙන මේකේ වාඩි වෙනවා. දැන් මේකේ වාඩි වුණහම මුස්ලිම් ජනතාවගේ නායකයා කතා කරන්නේ මුස්ලිම් ජනතාව ගැන. පොදුවේ කතා කළාට ඉලක්ක කරන්න ඕනෙ මුස්ලිම් ජනතාව. නැත්නම් ඡන්ද හම්බ වෙන්නේ නෑ.

ඒක නිසා ගරු සභාපතිතුමනි මේ ක්‍රමය තුළම ඇවිල්ලා වාඩි වෙන කොටම ජාතිය සමගිය ඇවිල්ලා ජාතියේ අසමගියත් එක්ක මේ මන්ත්‍රීවරු තෝරා අපිව පත් කරලා එවන්නේ. අනික මුදල. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් කතා කරලා කියනවා හිටපු ඇමතිවරයෙක්. මට ලක්ෂ අටසීයක් ගියා මේ පාර්ලිමේන්තු මැතිවරණයට. ඒක මං හොයා ගන්න ඕණේ. මේ ඉතිහාසය කිව්වේ නැද්ද. එහෙම කියන තත්ත්වයට ආවා. එක මන්ත්‍රීවරයෙක් කිව්වා මම ඉදිරියේ අපේ පක්ෂයේ නායකයාට. එයාට පාර්ලිමේන්තු මැතිවරණයට ගියා කියලා රුපියල් ලක්ෂ දෙදාස් හත්සීයක්.

අන්තිමට කරා කිව්වා අහසේ ඒ මන්ත්‍රී අපේක්ෂකයාගේ සම්පූර්ණම ඡායාරූපය අහසේ ඇවිද්දෙව්වා කිව්වා. සංගීතය අහන කොට මන්ත්‍රීවරයා අහසේ ඇවිදිනවා. ඒ විද්‍යාව සිංගප්පූරුවෙන් ගෙනාවා කිව්වා. ඉතිං ගරු සභාපතිතුමනි

ලියන්න බෑ. එයා ලියනවා බූ යන්නයි, ද් යන්නයි, ධ යන්නයි. මට පස්සේ අපේ ප්‍රධාන නායකයා යනකල් ඉඳලා පෙන්නුවා මෙන්න . නමුත් ඒගොල්ලන් අපේක්ෂකත්වයට තේරෙනවා. ඉහළ මනාප ගන්නවා. එම නිසා පක්ෂයට

මේ මාතෘකාව මම විනාඩි හතළිස් පහකට වඩා කතා කරලා තියෙනවා. මේ අපි ඉන්නේ පස්වෙනි පළාත් සභාවේ නම් දෙවෙනි පළාත් සභාවේ මාධ්‍ය එක වචනයක් ලිව්වේ නෑ. මේ මැතිවරණ ක්‍රමයේ තියෙන දූෂ්‍යභාවය සහ මේ මැතිවරණ ක්‍රමය තුළින් බහුවිද ජනවාර්ගික බහුවිද ආගමික ,බහුවිද කණ්ඩායමේ අයගේ සමගිය ඇති කරන්න බැරි නම් වෙනස්විය යුතුයි කියලා විනාඩි හතළිස්පහකට වඩා මම කතා කළා හැබැයි ඉතාමත් වැදගත් නැති දෙයක් පත්තරේ ලිව්වා . එදා ඒ යෝජනාව ලිව්වේ නෑ. ඒ නිසා ඒක ගැන කිව්වා කියලා එදා මාධ්‍ය නැගිටලා ගියා පළාත් සභාවෙන්. මම ඒක ගැන ඒ විදිහට කතා කරයි කියලා. ඒ නිසා මම මේක මාධ්‍යට කියනවා මේක රටේ තියෙන වැදගත් කාරණයක්. එම නිසා එන්න ඕනෙ මේ මුදල ප්‍රධාන කරගෙන ජයග්‍රහනය කරන්න පුළුවන් මැතිවරණ ක්‍රමයක් ඇති කිරීම තුළම පක්ෂය වැරදි කරන එක වලක්වන්න බෑ. ගරු සභාපතිතුමනි පක්ෂයට අවශ්‍යයි මිනිස්සු. මේ මැතිවරණය දිනන්න. 02.39.54 පක්ෂ කොහොමද තෝරන්නේ. පක්ෂ තෝරනවා සල්ලි තියෙන මනුස්සයා. බුද්ධිද,පාඬද, කියවන කෙනෙක්ද, ලංකාව කියලා රචනයක් ලියන්න වාක්‍ය පහක් ලියන්න කියලා ලංකාව ගැන වාක්‍ය පහක් ලියන්න පුළුවන් පුද්ගලයෙක්ද කියලා ඒවා බලන්න බෑ. මම එක දවසක් ගරු සභාපතිතුමනි ඉන්ටවීව් එකට යන වෙලාවේ මම හිටියේ අපේ පක්ෂයේ බුද්ධාගම කියලා ලියන්න බෑ. අපි ඉතාම ඉහළම බෞද්ධ නායකයෙක් ගැන කතා කරන කෙනෙක්ගේ පුතෙක්. ඔහුට තමන්ගේ අයදුම්පතේ බෞද්ධ කියලා

මොකක්ද ඕනෙ මේකට වියදම් කරන්නේ එහා පැත්තේ ඉන්න කොටිපතියෙක් නම් ප්‍රකෝටිපතියෙක් අපි දැම්මේ නැත්නම් ඒක යටකරගෙන දිනන් බෑ. ප්‍රකෝටිපතියෙක් තෝරන කොට ඔහු කුඩුකාරයෙක්, ඔහු එතනෝල්කාරයෙක්, ඔහු ගංජා විකුණන කෙනෙක්, එහෙම තමයි වෙන්නේ. නමුත් එයා තෝරන්න වෙනවා. පක්ෂයට ඒක කරන්න වෙනවා. ඒ නිසා පක්ෂ කිව්වහම පාර්ලිමේන්තුවේ ගිහිල්ලා වාඩි වෙන්නේ උත්තරීතර ආයතනයේ. පළාත් සභාවේ ගිහිල්ලා වාඩි වෙන්නේ ඒවේ නියෝජිතයෝ මිසක් ජනතා නියෝජිතයෝ නෙමෙයි.

ඒ නිසා සැබෑ ජනතා නියෝජිතයෙක් තමන්ගේ පළාතට ගන්න දැන් බලංගොඩට පාර්ලිමේන්තුවේ කෙනෙක් නැති වුණා. අවුරුදු ගාණකට. කලවානට පළාත් සභා මන්ත්‍රීවරයෙක් නෑ. ඒක තියෙන්නත් ඕනෙ. කේවළ ක්‍රමය නොවෙන්නත් ඕනෙ. සම්පූර්ණ සමානුපාතික ක්‍රමය නොවෙන්නත් ඕනෙ. මේන මේක හොයා ගන්න එක තමයි වඩා වැදගත්. මම එක කාරණයක් කියලා තමුන්නාන්සේගෙන් නවත්තන්නම්. මේ මැතිවරණ ක්‍රමය තුළ තමයි ගරු සභාපතිතුමනි ආගමට,ජාතියට, පක්ෂ හැඳුණේ. නැගෙනහිර බැලුවා ඉතාම බුද්ධිමතෙක් අස්රොෆ් මහත්තයා. මුස්ලිම් කොංග්‍රසය හැදුවා. අපි මුස්ලිම් ජනතාව වෙනුවෙන් නැගෙනහිර ආසන නවයක්,දහයක් ගන්නවා. ඊළඟට පාර්ලිමේන්තුව පාලනය කළා. දෙමළ පක්ෂ දෙමළ නමින් ගොඩ නැඟුණා. සිංහල පක්ෂත් එහෙම හැදෙන්න හැදෙන්න ආවා. ආගම් වශයෙන් පක්ෂ

හැදෙන්න ආවා. මොකද හේතුව මේ මනාප ක්‍රමය තුළ ඇති කර ගන්න පුළුවන් ජයග්‍රහනය තමාගේ කොටසින් පටු කර ගැනීමේ අවශ්‍යතාවය තමන්ගේ මන්ත්‍රීවරයා බිහි කර ගන්න පුළුවන්.

ජාතික ලැයිස්තුවට හරි යන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි ඉතාමත්ම මේ රටේ ජාතික ප්‍රශ්නය මත අවුරුදු විසි නවයක් තිහක් යුද්ධ කරපු අපි ඒ යුද්ධ කිරීමට හේතුව වූ මේ මැතිවරණ ක්‍රමයෙන්ම ඇති කරපු ප්‍රශ්න තියෙනවා. ඒ ප්‍රශ්න විසඳා ගන්නට අවශ්‍ය වන්නා වූ මැතිවරණ ක්‍රමයක් පළාත් සභාවටත් අවශ්‍යයි කියන යෝජනාව ගෙනාපු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙමින් එය එසේ කිරීමට මේ තියෙන අලුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හදන කොට යෝජනා ඉදිරිපත් කරන්නට අපි ඉදිරිපත් වෙමු. ඒවගේම මුළු සමස්ත පාර්ලිමේන්තුවේ කථානායකවරයා වෙතත් අපේ මේ යෝජනාවේ ස්ථිරත්වය යවන්න අලුත් යෝජනා ගෙනවිත් සබරගමු පළාත් සභාවෙන් ගේන මේ යෝජනාව සලිත මන්ත්‍රීතුමා සමස්ත ලංකාවේම පළාත් සභාවල මහජන නියෝජිතයින් බිහි කළ හැකි තම කොට්ඨාශයට වගකියන මහජන නියෝජිතයෙක් බිහි කළ හැකි මැතිවරණ ක්‍රමයක් සඳහා යාමට අවශ්‍ය අඩිතාලම ලංකාවේ මේ යෝජනාවෙන් ගෙන එමුයි කියමින් සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

ස්තූතියි ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය ඇමතිතුමනි. මීළගට ගරු නිහාල් ෆාරුක් මැතිතුමා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි ඉතාමත් කාලීන වැදගත් යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු සලිත කරුණාරත්න මැතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒවගේම වර්තමානයේ නව ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් කථිකාවතක් ඇති වෙලා තියෙන මොහොතක නව ව්‍යවස්ථාවක් මේ රටට අවශ්‍යයි කියලා ඒ සඳහා මහජන අදහස් විමසන මේ මොහොතේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව ස්තූතිවන් වෙනවා. ඒවගේම ඊයේ සහ අද දිනයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මේ නව ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයේ මහජනතාවගේ අදහස් ලබාගැනීමටත් අවස්ථාව උදාකරලා තියෙනවා. ඒවගේම මේ මාසයේ අවසාන වෙන කොට රත්නපුර දිස්ත්‍රික්කයේත් මහජනතාවට අවශ්‍ය කාලය ලබාදීලා තියෙනවා.

ඒ නිසා මම හිතන්නේ මොන ව්‍යවස්ථාව ගෙනාවත් මේ හැම ව්‍යවස්ථාවකින්ම හොඳ නරක දෙපැත්තම තියෙනවා. ඒක 100% සම්පූර්ණ කරන්න කාටවත් බෑ. ඒ නිසා අපි ඒ ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන ආකාරය ව්‍යවස්ථාව ඒ නීතියට යටත්ව ඒ මැතිවරණයට ඉදිරිපත් කරන අපේක්ෂකයන් ක්‍රියා කරන ආකාරය තුළින් තමයි ඒ හැම දෙයක්ම

පවතින්නේ. අපි මේ අවස්ථාවේදී කතා කළා අර පරණ කේවල ක්‍රමය ගැන කතා කළා. ඒවගේම වර්තමානයේ පවතින සමානුපාතික ක්‍රමය ගැන කතා කළා. මේ හැම දේකින්ම හොඳ නරක දෙපැත්තම තියෙනවා. විශේෂයෙන්ම අපි 70 මහ

මැතිවරණයේ ප්‍රතිඵළ ගන්න කොට එදා සමගි පෙරමුණ රජය ජයග්‍රහනය ලබා ගත්තා. එක්සත් ජාතික පක්ෂය ආසන 17 ක් ලබා ගත්තා නමුත් පක්ෂයක් හැටියට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත්තේ එක්සත් ජාතික පක්ෂය. නමුත් ජයග්‍රාහික පක්ෂයට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් එක්සත් ජාතික පක්ෂයට ලබා ගත්තත් ආසන සංඛ්‍යාව ගන්න කොට 17 යි ආසන. ඒවගේම 78 මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගත්තා. ශ්‍රීලංකා නිදහස් පක්ෂය දෙවෙනියට ඡන්ද ලබා ගත්තත් විපක්ෂනායකකමත් අහිමි වුණා මොකද ආසන අටට බැස්ස නිසා. නමුත් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණට වඩා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබාගත්තත් පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ආසනයවත් ලබාගන්න පුළුවන්කම ලැබුණේ නෑ. ඉතිං මේ හැම පැත්තෙන්ම අඩුපාඩු තිබෙනවා. මේ දෙකම මිශ්‍රණය කරපු ක්‍රමයක් තමයි අපි කවුරුත් බලාපොරොත්තු වෙන්නේ. මේ ක්‍රමය මොකක්ද කියන එක තමයි අපිට හොයා ගන්න තියෙන්නේ. ඒ නිසා මේ මැතිවරණයේදී ජාතිවාදීව කටයුතු කරන ඒවගේම ආගම්වාදීව,කුලවාදීව වශයෙන් වෙන් වෙලා තමයි මේ මැතිවරණයට ඉදිරිපත් වෙන්නේ. ඒක සත්‍ය කාරණාවක්.

ඒවගේම අපි දන්නවා මම නියෝජනය කරන රුවන්වැල්ල මැතිවරණ කෙට්ඨාශයේ මගේ පියා යූ.එල්.එෆ්.ෆාරුක් මැතිතුමා 88 මැතිවරණයට ඉදිරිපත් වෙන කොට එතුමාගේ ජාතිය ගැන බැලුවේ නෑ එදා ඡන්ද විසිතුන්දාහක් මගේ පියා ගන්න කොට ඡන්ද කොට්ඨාශ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් එහා පැත්තේ අපේ පරාක්‍රම අතාවුද මැතිතුමා හිටියා අතාවුද සෙනෙවිරත්න මැතිතුමා

ගත්තේ ඡන්ද දහදාහයි. නමුත් එතුමා ජාතිය ගැන කුලය ගැන,ආගම ගැන බැලුවේ නෑ ජනතාව ඡන්දය දුන්නේ පක්ෂයට. ඒවගේ බලංගොඩ ආසනය උදාහරණයකට ගන්න පුළුවන් බොරැල්ල ආසනය. ඒවගේ උදාහරණයකට ගන්න පුළුවන් පැරණි මැතිවරණ කොට්ඨාශ ක්‍රමය තුළිනුත්. වර්තමානයේ මේ අනුපාත ක්‍රමය තුළින් මං හිතන්නේ සුළු ජාතිකයින්ට සුළු පක්ෂ වලට යම් අසාධාරණයක් සිද්ධ වෙනවා මේ ක්‍රමය තුළ. ඒ නිසා සුළු පක්ෂවලට ජනතා විමුක්ති පෙරමුණට ඒවගේම අපේ වතුකරයේ ජනතාව නියෝජනය කරන පක්ෂ වලට මේ පක්ෂ වලට ආසනයක් නියෝජනය කිරීමේ හැකියාවක් නෑ. ඒ නිසා අද ප්‍රතිශතය අනුව සාධාරණීයකරනයක් සිදු විය යුතුයි කියලා තමයි හැම කෙනාම අදහස් ප්‍රකාශ කළේ. ඒ නිසා මේ කාටත් පිළිගන්න පුළුවන් ආකාරයට මේ රටේ අළුත් ව්‍යවස්ථාවක් අළුත් මැතිවරණ ක්‍රමයක් කවුරුත් කතා කරන මොහොතක්.

ඒ නිසා අපි විශ්වාස කරනවා දැඩි ලෙස මේ රටේ අළුත් වෙලා තියෙන මොහොතේ අළුත් පාලනයක් හයපාලනයක් ඇති වෙලා තියෙන මොහොතක විශේෂයෙන්ම ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියලා පැහැදිලි පොරොන්දුවක් වර්තමාන ජනාධිපති තුමා ලබාදීලා තියෙන මොහොතක අළුත් ව්‍යවස්ථාවක් සංශෝධනය අළුත් ව්‍යවස්ථාවක් හදනවා කියලා පොරොන්දුව දීලා තියෙන මොහොතක පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙනුත් මේ කථිකාවත මූලිකත්වය ගත් අපේ සලිත කරුණාරත්න මැතිතුමාට විශේෂයෙන්

ස්තුතිය මේ අවස්ථාවේදී අපි පුද කරමින් අවස්ථාව ලබාදුන් ගරු සභාපතිතුමාටත් මාගේ ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමනි. මීළඟට විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මමත් ස්ථිර කරමින් කතා කරනවා ඉතා වැදගත් යෝජනාවක්. මේ සම්බන්ධව කතා කරන්න ගියහම ගරු සභාපතිතුමනි පහුගිය කාලයේ හැබැයි මේ ක්‍රමය උඩ විශාල දියුණුවක් ගම්දනව්වල සිද්ධ වුණා. ඇහැලියගොඩ ඉන්න මට රක්වානේ ඡන්ද තිබුණා නම් කොලොන්නේ ඡන්ද තිබුණා නම් බලංගොඩ ඡන්ද තිබුණා නම් අපි ඒ ජනතාවගේ ඉල්ලීම් ඉටු කරනවා. මේ තුළින් මම එහෙම කරනවිට සමස්තයක් ගත්තහම ගරු සභාපතිතුමනි ප්‍රදේශයේ,ආසනයේ මුළු රටේම, දිස්ත්‍රික්ක 24 විශාල දියුණුවක් ඇති වුණා එදා. ඒක අපිට නෑ කියන්න බැහැ. ඒ දියුණුව ඇති වෙච්ච එකවරක් දෙකක් යන කොට ගරු සභාපතිතුමනි උදාහරණයක් හැටියට ගත්තොත් බස්නාහිර පළාත් සභාව. පෙරිසුට්කාරයෝ වශයෙන් ආපු අය ක්ෂණිකව ලක්ෂ ගණන් ඡන්ද ගත්තා. ඒ ඡන්ද ගත්තේ අල්ලස් වලින්. විවිධ අල්ලස්. අන්න ඒ ක්‍රමයට ගිහිල්ලා ඉවර වෙලා අර සමාජ සේවකයා හදවතින් වැඩ කරන කෙනා කැපිලා ගිහිල්ලා

අරවගේ අය ඉස්මතු වෙලා මේක විනාශ වුණා. මේ ක්‍රමය තමයි ඇත්තටම වැදගත් වෙන්නේ. මේ ක්‍රමය තුළින් ඇත්තටම ඒ ප්‍රදේශයට මන්ත්‍රීවරයෙක් ඉන්නවා. වගකියන්න කෙනෙක් ඉන්නවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ගත්තහම එතෙන්ට දාන්නේ දෙන්න නම් තුන්දෙනා නම් හතර දෙනා ඒ හතර දෙනාගෙන් පිට නෑ. ඒවගේ වියදම ගත්තහම අතිවිශාල වියදමක්. පළාත් සභා මැතිවරණයට කවුරු මොනවා කිව්වත් අඩුම ගානේ ලක්ෂ හතළිහක් තියන්න ඕනෙ. අඩුම ගානේ සාමාන්‍යයෙන් කිව්වොත්. නැත්නම් ලක්ෂ හතළිය කියන්නේ කොටි එක හමාර දෙක වියදම් කරනවා. මේ සම්පත් අපේ වියදම් කරන්නේ. ඒවගේම පෝස්ටර් ගහනවා. කටවුට් ගහනවා. බැනර් ගහනවා. ගරු සභාපතිතුමනි පිට රටට රන් පවුම් වලින් යන්නේ. විවිධ තින්ත වර්ග වලට ගෙනල්ලා. ෆෝ කලර් කියයි ඒවා මේවා ගෙනල්ලා පොජ්ස්ටර් වලට රුපියල් පහළොවයි, විස්සයි, පනහයි,සීයයි කියනවා. මේවා ඔක්කෝම විශාල නාස්තියක් වුණා. මෙන්න මේ ක්‍රමය ආවොත් අපිට විශාල දියුණුවක් ලබන්න පුළුවන්. ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කරන්නට පුළුවන් කියලා අපේ විශ්වාසය තියෙනවා. ඒක කියන්න දෙයක් නෑ. ඒ ආකාරයට තමයි වෙන්නේ. පහුගිය කාලයේ අපි කියන්නේ පළාත් සභාව ආරම්භ කරපු කාලයේ දියුණුවක් වුණේ ඒ දිස්ත්‍රික්කයේ පුරා විහිදිච්ච ඡන්දයක් දෙන කොට ඒ ප්‍රදේශ වලට වැඩ කරන කොට පක්ෂ විපක්ෂ හැම කෙනෙක්ම අරවා මේවා බලන කොට ඒවායේ දියුණුවක් වුණා.

ඒ දියුණුව අද බලන්න පුළුවන් කොට්ඨාශ ක්‍රමයට ඇවිල්ලා ඒ සඳහා වගකියන මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා

පක්ෂ විපක්ෂ කවුරු හරි මන්ත්‍රීවරයෙක් වෙනවා ඒ මන්ත්‍රීවරයාට ප්‍රතිපාදන

ලැබෙනවා ඒ තුළින් එහේ දියුණු වෙනවා. මේ තුළින් තමයි හොඳ. සලිත කරුණාරත්න මැතිතුමාට මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------

ස්තුතියි ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි. මීළඟට වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී** වරුණ ලියනගේ*
***கௌரவ உறுப்பினர் வருண லியனகே***
*Hon.Member Waruna Liyanage*
--------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරමින් මමත් කතා කරන්න කැමතියි. ගරු පළාත් සභා මන්ත්‍රීවරු හැටියට මම හිතන්නේ අපේ බලය අඩු කර ගැනීමකුත් ඒවගේම අපිම මේ සම්බන්ධයෙන් කතා කරලා යම්කිසි තීන්දු තීරණ වලට එන්න පුළුවන් වෙන කොට මටත් කතා කරන්න පුළුවන් වෙච්චි එක ගැන සංතෝස වෙනවා. මේ පළාත් සභාවේ හිටියේ නැත්නම් මේ අවස්ථාව උදා වෙන්නේ නෑ.

ඒ නිසා සියළු දෙනාම කතා කරන කොට මං හිතන්නේ මේ තත්ත්වය ඇති වෙන්න ඕනෙ කියන දහසින් තමයි කතා කළේ. ඒ නිසා අපි දන්නවා මේ

ලංකාවේම ගත්තට පස්සේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තියෙන්නේ 335 යි. නමුත් අපේ මන්ත්‍රීවරු ඉන්නවා 455 ක්. එතකොට 120 කටම මන්ත්‍රීතුමා කිව්වා වගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නියෝජනය වෙන්නේ නෑ. නමුත් අපි දකින කොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දුෂ්කරම ඒවා ගත්තට පස්සේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අතිදුෂ්කරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් අපේ දිස්ත්‍රික්කයේ. ඒවගේම ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ගත්තට පස්සේ එහෙමයි ගරු සභාපතිතුමනි. එහෙම නම් මේවේ සංවර්ධනයක් ආර්ථික වර්ධනයක් වෙන්න නම් අනිවාර්යයෙන්ම ඒ ප්‍රදේශය නියෝජනය කරමින් මන්ත්‍රීවරයෙක් තේරෙන්න ඕනෙ. එතකොට අපි දන්නවා මැතිවරණ ක්‍රමය වෙනස් වෙන කොටම අපිට සිද්ධ වෙනවා නොයෙකුත් තත්ත්වයන් වලට මුහුණ දෙන්නට. සමහරක් වෙලාවට අපිට සිද්ධ වෙයි අපේ කාල සීමාවත් අඩු කර ගන්න සිද්ධ වෙයි. ඉල්ලන අපේක්ෂකයා සමහර වෙලාවට දීර්ඝ කාලයක් ඒ ප්‍රදේශයේ අපේක්ෂකයා වෙලා පැරදිලා දෙවරක් පැරදුණොත් එහෙම ඒ කාල සීමාවේ වෙනින් කෙනෙකුට අපේක්ෂකයෙක් වෙන්න බැරි තත්ත්වයක් තමයි තියෙන්නේ.

ඒ නිසා ප්‍රාදේශීය සභාව සීමා නිර්ණයන් වලට ගෙනල්ලා කොට්ඨාශ මට්ටමට එන කාලය අපි ප්‍රාදේශීය සභාවටත් අපි යෝජනාවක් ගේන්න ඕනෙ. ඒ කොට්ඨාශයෙන් එන මන්ත්‍රීවරයා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාටත් කාල සීමාවක් දෙන්න ඕනේ තුන් සැරයක් හරි එක පාරක් හරි අවස්ථාවක්. ඊළඟට ගමේ ඉන්න

පුද්ගලයෙකුටත් හැදෙන්නවත් බැරි වෙනවා ඒ පක්ෂයේ ඉඳලා.

ඒ නිසා පළාත් සභාවටත් එනවා නම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට එනව නම් අනිවාර්යයෙන්ම අපිටත් කාල සීමාවක් දෙන්න ඕනෙ පළාත් සභාවේ මෙච්චර කාලයක් පමණයි සේවය කරන්න පුළුවන්. ඊළඟට පාර්ලිමේන්තුවට යන්න ඒ අවස්ථාව හදා ගන්න ඕනෙ. ඒවගේම අර්බුදයක් කොට්ඨාශය තුළ ගම් තුළ නිර්මාණය වෙන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ .

ඒ නිසා ගරු සභාපතිතුමනි අපි දැක්කා අපේ පක්ෂය තුළම විශාල ප්‍රශ්න රාශියක් තියෙනවා. පැල්මඩුල්ල ආසනය ගත්තොත් එහෙම මමයි අතුල ඇමතිතුමයි ඉල්ලන්නේ. දෙන්නත් එක්කම ප්‍රශ්න. හැබැයි අපි එක පක්ෂයේ ඉන්නේ. හැබැයි ඊළඟට මේ මැතිවරණ ක්‍රමය වෙනස් කළොත් එහෙම ආසන මට්ටම එනවා නම් එහෙම අපි ෆයිට් කරන්නේ අපේ පක්ෂයේ අයත් එක්ක නෙමෙයි. අනිත් පක්ෂයේ. යූ.එන්.පී.එකත් එක්ක තමයි අනිත් අතට තරහ තියෙන්නේ. ඒ නිසා කෙලින්ම බෙදීමක් ඇති වෙනවා. යූ.එන්.පී.කාරයා මූ කියලා. ශ්‍රීලංකා කාරයා මූ කියලා. ඊට පස්සේ ශ්‍රීලංකා, යූ.එන්.පී. කියලා ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා විශාල ප්‍රශ්නයක් මේකේ. මොකද අපි දෙගොල්ලෝ කතා බහකරලා අපි එකම පක්ෂයේ නම් විසඳා ගන්න පුළුවන්. ඊට පස්සේ ගම දෙකට බෙදලා ඊට පස්සේ නොයෙකුත් දේවලුත් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා අපි මේවායේ දී අපි අපේක්ෂකයෝ තේරීමේදී ඒවගේම සුදුසුකම් පරීක්ෂා කිරීමේදී සුදුසු අපේක්ෂකයෙක් ඒ වෙලාවේදී තෝරන්න වෙනවා. එහෙම නැත්නම් විශාල ගැටළුවක් වෙනවා. පහුගිය මැතිවරණය එන කොට පුද්ගලයන්ටත් බෙදිලා . දැන් දේශපාලනයේ. අරයා රනිල්ගේ. අරයා සජිත්ගේ. අරයා මහින්දගේ. අරයා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ.

ඒ නිසා මේ තත්ත්වයට ඇවිල්ලා දැන්. ඒ නිසා මේක විශාල බරපතල ප්‍රශ්නයක් වෙලා. ඒ නිසා මම කියන්නේ ඉදිරි ව්‍යවස්ථා සංශෝධනයක් එනවා නම් මේවාට කිසියම් විසඳුමක් දෙන්න පුළුවන් තත්ත්වයකට මේ රට යායුතු වෙනවා. අපි දකින්නේ තරුණ දේශපාලඥයෝ විදිහට තව අවුරුදු දහයකින් හරි මේ රට ඒ තැනට ගේන්න බැරි නම්, සංවර්ධනය වෙන්නේ නැත්නම් ජනතාවගේ ආර්ථික ශක්තිය නඟා සිටුවන්න බැරි නම් අපෙනුත් වැඩක් නෑ. ඒ නිසා මේ කෙටි කාලය තුළ මේදේට සම්බන්ධ වෙලා මේකට ශක්තියක් දෙන්න පුළුවන් වෙච්ච එකටත් සතුට එළ කරමින් මේක කොහොම හරි ක්‍රියාත්මක කරන්න ඔබතුමා ව්‍යවස්ථා සංශෝධනය කරන සාකච්ඡාවට යොමු කරන්න අපිටත් ඒ අවස්ථාවට සහභාගි වෙන්න අවස්ථාවක් උදා කර දෙන්න කියලා ඉල්ලා සිටිමින් සලිත මන්ත්‍රීතුමාටත් ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමාට. ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2015/12 දරණ යෝජනාව පිළිබඳව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු ඇමතිතුමන්ලා ගරු මන්ත්‍රීතුමන්ලා ඉතාමත් හොඳ ඉතාමත් වැදගත් යෝජනා අදහස් රාශියක් ඉදිරිපත් කළා. ඒ අනුව එතුමාගේ මේ යෝජනාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළුම යෝජනා සහ අදහස් පිළිබඳව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳව අළුතින් පිහිටුවා

තියෙන කමිටුවටත් ඒවගේම පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ

ලේකම්වරයා වෙතටත්, මේ යෝජනාව මේ ආකාරයට සභාව තුළ සාකච්ඡා කරලා ඒ කාරණයට එකඟ වූ බව දන්වා යැවීමට කටයුතු කරනවා. මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/1 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි සභාවේ සියළුම මන්ත්‍රීවරුන් කියනවා මේක ලබන පාරට දාන්න කියලා. ඒකේ විශේෂත්වයක් තියෙන්නේ ශ්‍රීලාල් වික්‍රමසිංහ ගරු ඇමතිතුමා කියනවා ලබන පාරට දැම්මොත් හොඳයි කියලා. ඒ නිසා ඊගාව පාර මුලට ගන්න කියලා ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

සිරිපාල සිරිඇල්ල මන්ත්‍රීතුමනි. දැන් තමුන්නාන්සේලා ඒවා බෙදා ගන්න පසුව. මාව අපහසුතාවයට පත් කරන්නේ නැතුව. නැත්නම් යෝජනාව දැම්මේ නැත්නම් මටත් කෑගහන්නේ.ඒක නිසා. එහෙම නම් ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි එතුමාගේ

යෝජනාව අද සාකච්ඡාවට නොගන්නා බව සභාවට දැනුම් දෙනවා.

**සභාව කල් තැබීමේ යෝජනාව :**

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2016 පෙබරවාරි මස 23 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තැබීමට යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

ස්තුතියි ගරු සභානායකතුමනි.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වෛද්‍ය පරාක්‍රම අතාවුද මැතිතුමා

***ගරු මන්ත්‍රී*** *පරාක්‍රම අතාවුද*
***கௌரவ உறுப்பினர் பராக்கரம அதாவுத***
*Hon.Member Parakrama Athawuda*
----------------------------------------

ගරු සභාපතිතුමනි ලබන සභා වාරයට කල් දමනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

එහෙම නම් එතුමාගේ යෝජනාවත් ලබන සභා වාරයට දමන නිසා ඒ අනුව අපි ඉඩකඩ ලබා දෙනවා. දැන් වේලාව පස්වරු 2.23 යි. ඒ අනුව අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. මෙම ගරු සභාව 2016 ක් වූ පෙබරවාරි මස 23 වෙනිදින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අ/කලේ:

කංචන ජයරත්න

සභාපති

සබරගමුව පළාත් සභාව.

පාලිත නානායක්කාර

සභා ලේකම්

සබරගමුව පළාත් සභාව.

2016 මැයි මස 13 වෙනි දින

සබරගමුව පළාත් සභා ලේකම් කාර්යාලයේදී ය.